## 2020/06/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/06/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.06.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාටම සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා. අපේ මන්ත්‍රීවරුන්ගේ පැමිණීම මේ වනවිට පොඩ්ඩක් අඩු වුනත් සභාවේ ගණ පූර්ණය සම්පූර්ණ වී ඇති නිසා සභාව පටන් ගන්න අවශ්‍යයි. ඒ එක්කම පළමුවෙන් කියන්න ඕන. අද දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන සභාවාරය මෙලෙස පවත්වන්නේ මම කලින් කිව්ව වගේ වර්ථමානයේ ලොව ඇතිවී ඇති මේ කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ ලෝකයම ව්‍යාකූල තත්වයට පත්වෙලා තියෙන අවස්ථාවක. අපේ මේ ශ්‍රී ලංකාවෙන් ඒ වසංගත තත්වය මේ වන විට කෙමෙන් කෙමෙන් තුරන් වී යන අවස්ථාව. නමුත් එහි භයානකකම, ව්‍යාප්තිය පිළිබඳ අපිට තවම නිශ්චිත තෝරා ගැනීමක් කර ගන්න බැරි මොහොතක, සියලුම සෞඛ්‍ය උපදේශකයන්ගේ උපදෙස් අනුව තමයි අපි සභාව මෙසේ පවත්වන්න තීරණය කළේ. මම හිතන්නෙ, මෙවැනි තත්ව එන කොට, ගරු මන්ත්‍රීවරුන්ට අපහසු තාවයට පත්වෙන්න පුලුවන්. නමුත් අපි ඒ සියලු දේ පසෙකලා තව මාසයක් දෙකක් යනකම්ම මේ ආකාරයට රැස්වීම පවත්වන්න සිදු වේවි. එහෙමනම් මම පළමුවෙන්ම උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරු අද දින සභාවට පැමිණීම පිළිබඳ ස්තූති වන්ත වෙනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2020.05.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2020.05.12 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. එක්සත් ජනතා නිදහස් පෙරමුණේ ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයෙන් ඉවත් වීම සම්බන්ධව 2020.06.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. පුහුණු පාඨමාලා සඳහා තොරතුරු ලබා ගැනීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2020.05.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. ධීවර, සත්ත්ව නිශ්පාදන හා සංවර්ධන පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද සංවර්ධන සැළැස්ම - 2020 උපමාන පාදක සංවර්ධන සැලැස්ම, ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන විෂය, වතු මාර්ග සංවර්ධනය යන මැයෙන් 2020.05.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා මේ පිළිබඳව කියා සිටියේ  මෙම යෝජනාව බල ප්‍රදේශයේ මහජන නියෝජිත මන්ත්‍රීතුමිය ගෙන් විමසූ අවස්ථාවේ එතුමියද මේ පිළිබඳව නොදන්නා නිසා සභාවේ අනුමැතිය ලබා දීමට නොහැකි බැවින් එම යෝජනාව අවශ්‍යතාවය අනුව සොයා බලා සංශෝධනය කරන ලෙසයි.

ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය මේ පිළිබඳව අදහස් දක්වමින් කියා සිටියේ ගරු සභාපතිතුමනි මමත් මෙහෙම පාරක් පිළිබඳව දන්නෙ නැහැ. 212 ඒ කැප්පිටියාගොඩ උතුර නාගොඩ වත්තෙ වතුයටිතල පහසුකම් යටතේ පාරක් නැති බව තමයි මම නම් දන්නෙ. කැප්පිටියාගොඩ දකුණ නාගොඩ වත්ත ප්‍රධාන මාර්ගය මේ දිනවල ප්‍රතිසංස්කරණය කරගෙන යනවා. ගරු සභාපතිතුමනි ඒ පිළිබඳ අවධානය යොමු කරමින් නාගොඩ වත්ත 212 බී කැප්පිටියාගොඩ දකුණ ලෙසට එය සංශෝධනය කරමින් වතුයටිතල පහසුකම් යටතේ ප්‍රධාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඒ මුදල් යොදවන්න කියලා මම ඉල්ලා සිටිනවා.

04. පී.ඩී. යුරේකා මල්කාන්ති මහත්මිය, සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් 2021 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම යන මැයෙන් යොමු කරන ලද 2020.06.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් අයාලේ යන ගවයන් සම්බන්ධව බලධාරීන් දැනුවත් කරන ලෙස ඉල්ලා යොමු කරන ලද 2020.06.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**01.** උඩුගම ඇප්තොප්වත්තේ නාගොඩ ප්‍රාදේශීය සභාව භුක්ති විඳිනු ලබන අක්කර 05 කොටස මිනින්දෝරුවකු ලවා මැණීම් කටයුතු කර මායිම් සළකුණු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**2.** වළකුඹුර, නාගොඩවත්ත හි ඉදි කිරීමට යෝජිත ආදාහනාගාරයට පිවිසෙන මාර්ගය ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව්.පතිනායක මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**3.**හදිසි සේවා අවශ්‍යතාවය මත කම්කරුවන් 03 දෙනෙකු හා විදුලි කාර්මිකයෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

මේ සභා වාරය ආරම්භ කලාට පස්සෙ මේ සභාවේ මේ වෙන කොට කම්කරුවො හතරපස් දෙනෙක්ම විශ්‍රාම ගිහිල්ලා, සියලු වැඩ කරන්න දැන් තුන්දෙනයි ඉන්නෙ. ඒ වගේම විදුලි කාර්මික මහත්මයත් විශ්‍රාම පූර්ව නිවාඩු ඉල්ලුම් කරලා තියෙනවා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**4.**සභාව සතු ඉඩම්වල මායිම් සලකුණු කිරීම සඳහා මායිම් කනු මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**5.**ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර සංනිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

6. පාදයෙන් ක්‍රියාකරන ද්විත්ව ක්‍රියාකාරී දැත් සේදීමේ උපකරණ මිළදී ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

I. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 35 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2020.06.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 මැයි මස විදුලි බිල්පත්**

2813038709 - කැකුළු පෙර පාසල - රු. 240.00
2813189405 - තල්ගස්වල පෙර පාසල - රු. 240.00
4591713210 - ප්‍රධාන කාර්යාලය - රු. 8694.50

**2020 අප්‍රේල් මස විදුලි බිල්පත්**

8619142704 - රන්කැකුළු පෙර පාසල - රු. 294.00
4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 1539.30
8617046104 - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය - රු. 459.60
4509082908 - උක්ඕවිට පෙර පාසල - රු. 258.30

**2020 මාර්තු මස විදුලි බිල්පත්**

4591713210 - ප්‍රධාන කාර්යාලය - රු. 17308.95
4509082800 - උදාර පෙර පාසල - රු. 276.60
4507357802 - සමනල පෙර පාසල - රු. 349.80

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.04.20 – 2020.05.22) -රු. 1839.96
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.04.18- 2020.05.22)-රු. 516.96

**03. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී**

**දුරකථන බිල්පත් ගෙවීම** (2020.04.01 - 2020.04.30)

i. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 2735.87
ii. 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම - රු. 3397.18

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී**

**දුරකථන බිල්පත් ගෙවීම** (2020.03.01 - 2020.03.31)

i. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 4102.59

**<u>04 .2020 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5334.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4630.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**05. 2020 මැයි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 1000.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 450.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 700.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 854.00 |

**2020 ජුනි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

මධුර ප්‍රභාත් මයා - කාර්යාල කාර්ය සහායක - රු. 350.00

**06. අතිකාල දීමනා ගෙවීම්**

**2020 මැයි මස**

එම්. ඒ වසන්ත මයා - රියදුරු - රු. 9046.40
ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා - මුරකරු - රු. 8480.00

| | | |
|---|---|---|
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.40 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.11016.00 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 8080.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| අයි.කේ.ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1030.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 8650.62 |
| එම්.එම්. මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2816.50 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කා.කා.ස. | - රු. 909.50 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | -වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2266.00 |
| ජී.එල් උපුල් ධර්මසිරි | -වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1854.00 |

**07. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. අම්පාර නගර සභාවේ ක්‍රියාත්මක වන කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අධ්‍යනය කිරීමේ අධ්‍යයන චාරිකාව සඳහා ලබා ගත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු.100000.00

ii. රාජකාරී අවශ්‍යතාවයක් වෙනුවෙන් කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1750.00

**08.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**
**<u>2020 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 39 ක් - රු. 4056.00

**09. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**<u>2020 මැයි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 563ක් | - රු. 58552.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 205 ක් | - රු. 21320.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 140 ක් | - රු. 14560.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් | - රු. 16640.00 |
| තණකොළ කපන යන්ත්‍රය චෙන්සෝව සඳහා ලීටර් 25 | - රු. 3425.00 |
| 2t Oil | - රු. 580.00 |
| **එකතුව** | **- <u>රු.120277.00</u>** |

**10. දිලිනි දිසානායක මිය, තාක්ෂණ නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**
2020.පෙබරවාරි මාසයට අදාල දින වැටුප් ලබා ගැනීම - රු. 1641.00

**11. කේ.ඒ.එදිරිසිංහ මයා, තාක්ෂණ නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**
2020.පෙබරවාරි මාසයට අදාල දින වැටුප් ලබා ගැනීම - රු. 3100.00

**12. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 19950.00
ii. LL 7366 ට්‍රක් බවුසරය සේවා කිරීමේ බිල්පත - රු. 17310.00
iii. 252-6478 ඩබල් කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 13180.00

**13. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 අප්‍රේල් - රු. 880.00

**14. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 මැයි - රු. 3590.00
2020 මාර්තු - රු. 3990.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 මැයි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00
ii. 2020 මැයි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1155.00

**16. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජුනි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**17. ටී.ජී.හාඩ්වෙයාර්, නාගොඩ**
කොරොනා වසංගත තත්වය වෙනුවෙන් දෑත් සේදීම සඳහා සින්ක් එකක් සවි කිරීමට අදාල ද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත - රු. 360.00

**18. නිව් විජය මෝටර්ස්, ගාල්ල**
252-6478 කැබ් රථයට බැටරියක් මිළදී ගැනීමේ බිල්පත - රු. 22500.00

**19. සදරු ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**
ප්‍රාදේශීය සභාවේ 2020.05.12 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4163.00

**20. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
ඌරල අරුක්ගොඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම- රු.25920.00

**21. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, තංගල්ල**

i. 2019 ඔක්තෝම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 100.00

ii. 2019 අප්‍රේල්, මැයි, ජූලි මාස සඳහා මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 500.00

**22.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

i. හිඟ එකතු කල අගය මත බදු මුදල කොටස් වශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම 2005 2006 වර්ෂ සඳහා -රු.12000.00

**23. දයානි ට්‍රේඩ සෙන්ටර්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සහ ආයුර්වේදය සඳහා පැමිණෙන ජනතාවගේ දැත් පිරිසිදු කර ගැනීම සඳහා ජල කරාමයක් සැදීමට ලබා ගත් ද්‍රව්‍ය වෙනුවෙන් බිල්පත - රු. 1217.00

**24. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 අප්‍රේල්) - රු.13000.00

**25. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 මැයි) - රු.13000.00

**26. ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් සමාගම, කිරිබත්ගොඩ**

නාගොඩ ප්‍රා දේශීය සභා නිල වෙබ් අඩවියේ 2GB Space හා Nagoda Ps Domain Renewal ගාස්තු - රු. 7000.00

**27. එච්.ඩබ්. චමින්ද මයා, මාපලගම**

පොදු ළිං ඉසීමේ සේවාව වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 3000.00

**28. එන් සෙනවිරත්න මිය, කොළඹ**

නාගොඩ ප්‍රාදේශීය සභා පුස්තකාල තුන සඳහා "දන්නවානම් හිත හැඬුව තරම්" යන කෘතිය මිළදී ගැනීමේ බිල්පත - රු. 1140.00

**29. අයි.පී.එම්. විකුම් සුරංග මයා,උඩුගම**

i. ඌරල අරුක්ගොඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම (ගල්, වැලි) - රු.26000.00

ii. නාගොඩ ප්‍රා දේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පරණ වැසිකිලිය රියදුරු කාමරයක් බවට පත් කිරීමට අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා වැලි කියුබ් ½ ක් ලබා ගැනීමේ බිල්පත- රු. 6500.00

**30. ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම**

Pay roll වැඩසටහන ක්‍රියාත්මක වන පරිගණකයේ Power supply කොටස අළුත්වැඩියා කිරීම - රු. 950.00

**31. ටී.පී.ජී. ඉනෝකා ප්‍රියදර්ශනී, ලින්දූලි ෆැෂන් හවුස්**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය සඳහා මුඛ ආවරණ
මිළදී ගැනීමේ බිල්පත - රු.12000.00

**32.දසමස් වැටුප් අත්තිකාරම්**
එම්.ඒ.වසන්ත මයා -රු.250000.00

**රජයේ ආධාර**
**<u>පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන</u>**

**33. කුරුපනාව එකමුතු වැඩිහිටි සංවිධානය**
මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ
පළමු හා අවසාන ගෙවීම -රු.187725.69

**34.වමත්සරා ලී බඩු, උඩුගම**
අතිගරු ජනාධිපතිතුමා කොතලාවල පංසලට පැමිණීම නිමිත්තෙන් ඉදිකල වැසිකිලි
පද්ධතිය සඳහා වැසිකිලි දොරක් ලබාගෙන සවි කිරීමේ බිල්පත - රු.10000.00

**35.උත්තරා හොටෙල්, උඩුගම**
කොතලාවල විහාරස්ථානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේදී කෑම සඳහා වූ බිල්පත - රු. 3445.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**අංක 01 සිට 4 දක්වා ඇති ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.**

<u>2020.06.09 දින පැවැත්වෙන මහ සභාව සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ විස්තරය</u>

**01. සභාපති , නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. සුළුඅක්මුදල් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 4446.00
ii. LL 7650 කෘ කැබ් රථය හා LL 7366 ට්‍රක් බවුසරය සඳහා ආදායම් බලපත්‍රය දුම් වාර්තා සඳහා අත්තිකාරම් ලබා ගැනීම - රු.18000.00
iii. නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ බවුසර් සඳහා රක්ෂණ වාරික ගෙවීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම - රු. 7000.00

**02. පෝස්ට් මාස්ටර් ජනරාල් ගි.අ. 013100199027346 ට බැර**

නිදහස් තැපැල් ගාස්තු ගෙවීම 2020 අප්‍රේල් මස - රු. 7000.00

**03. ශ්‍රී ලංකා ටෙලිකොම්. පී.එල්.සී**

සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත් පියවීම දු.අංක 0912231201

| | |
|---|---|
| 2020 ජනවාරි | - රු. 3632.47 |
| 2020 පෙබරවාරි | - රු. 4699.92 |
| 2020 මාර්තු | - රු. 4324.37 |
| 2020 අප්‍රේල් | - රු. 3632.98 |

**04. සී/ස ලංකාබෙල් සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත් පියවීම

| | |
|---|---|
| 2019.01.16 – 2019.02.15 | - රු. 688.51 |
| 2019.12.16 – 2020.01.15 | - රු. 613.01 |
| 2020.02.16 – 2020.03.15 | - රු. 613.01 |
| 2020.03.16 – 2020.04.15 | - රු. 641.82 |
| 2020.04.16 – 2020.05.15 | - රු. 613.01 |

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

01. <u>ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා</u>

   i. 214/A මලාමුර ආදර්ශ ගම්මානයේ දැනට අබලන් වී ඇති සභාවට අයත් පොදු නල ළිඳ සකසා දීමට යෝජනා කරමි.
   **ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතික සභා සම්මත විය.**

   ii. කැටගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් වරගහකන්ද මාර්ගය දැනට යාමට අපහසු තත්වයක ඇති බැවින් එම මාර්ගයට කොරිපස් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.
   **ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතික සභා සම්මත විය.**

<u>**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**</u>

01. නාගොඩ පිටෝවිට මුහන්දිරම් වතුරාව මාර්ගය සඳහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීම සඳහා වූ ඇස්තමේන්තුව - රු. 500000.00

**නාගොඩ පිටෝවිට මුහන්දිරම් වතුරාව මාර්ගය සඳහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

2020.03.13 දින පැවති ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරපු මිල ගණන්, සංශෝධනය කර නැවත අලුත් මිල ගණන් එවා තියෙනවා.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**ESET Internet Security එකක් ලබා ගැනීම සදහා මිල ගණන් කැඳවීම -2020**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම | ප්‍රිව්ව් කම්පියුටර් ටෙක්නොලජි, වදුරඹ | පෙන්ටෙක් ටෙක්නොලජි,උඩුගම පාර,නෙළුව,ගාල්ල. |
|---|---|---|---|
| ESET Internet Security එකක් | 3,350.00 | 3,410.00 | 3,410.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව ESET Internet Security එකක් මිළදී ගැනීම සදහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොදම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් ESET Internet Security එකක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**යූ.පී.එස් එකක් ලබා ගැනීම සදහා මිල ගණන් කැඳවීම -2020**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම | ප්‍රිව්ව් කම්පියුටර් ටෙක්නොලජි, වදුරඹ | පෙන්ටෙක් ටෙක්නොලජි,උඩු ගම පාර,නෙළුව,ගාල්ල . |
|---|---|---|---|
| යූ.පී.එස් එකක් ලබා ගැනීම | 5,850.00 | 5,950.00 | 6,250.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව යූ.පී.එස් එකක් මිළදී ගැනීම සදහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොදම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් යූ.පී.එස් එකක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**යූ.එස්.බී වයිෆයි ඇඩප්ටර් එකක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2020**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම | ප්‍රීවිව් කම්පියුටර් ටෙක්නොලජි, වදුරඹ | පෙන්ටෙක් ටෙක්නොලජි, උඩුගම පාර,නෙළුව,ග ාල්ල. |
|---|---|---|---|
| යූ.එස්.බී වයිෆයි ඇඩප්ටර් | 1,550.00 | 1,650.00 | 1,650.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව යූ.එස්.බී වයිෆයි ඇඩප්ටර් එකක් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොඳම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් යූ.එස්.බී වයිෆයි ඇඩප්ටර් එකක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**පරිගණක මොනිටර් එකක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2020**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම | ප්‍රීවිව් කම්පියුටර් ටෙක්නොලජි, වදුරඹ | පෙන්ටෙක් ටෙක්නොලජි,උඩුගම පාර,නෙළුව,ගාල්ල. |
|---|---|---|---|
| මොනිටර් එකක් ලබා ගැනීම | 15,500.00 | 15,950.00 | 16,000.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව පරිගණක මොනිටර් එකක් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොඳම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් පරිගණක මොනිටර් එකක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ 2020 අප්‍රේල් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 මැයි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 මාර්තු මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ළ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි මගේ කොට්ඨාසයට අයත් අලුත්වත්ත ප්‍රදේශයේ ස්ථාන කිහිපයක පුංචි ගැටලු කිහිපයක් තියෙනවා. ඒ පිළිබඳව සමහර කරුණුවලදි අපට මැදිහත්වීමේ ගැටලුවක් තියෙනවා. මම ඔබතුමත් එක්කත් කතා කළා. එකක් තමයි උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට පසුගිය කාලයේ පැවති රජය මගින් ලබා දීපු පාලම් ව්‍යාපෘතිය පිළිබඳව අපට පුංචි ගැටලුවක් තියෙනවා. මොකද පාලම් තුනක් ඒ ප්‍රදේශයේ ඒ ඇල හරහා ඉදිවෙනවා. අපේ සුදර්ශන මන්ත්‍රීතුමත් දන්නවා. ප්‍රශ්නය තියෙන්නෙ දැන් ඒ එක පාලමක වැඩ අවසන් කරලා දෙපැත්ත සම්පූර්ණ කිරීම තමයි කෙරෙන්නෙ. පසුගිය දිනවල අපි ඒ පැත්තෙ ගියාම මිනිස්සුන්ගෙන් පැමිණිලි ලැබුනා. පාලම දෙපැත්තෙ විශාල ප්‍රමාණයක් පස් ගොඩ කරන්න තියෙනවා. ඒ ගොඩ කිරීමෙදි නියමිත නිලධාරි මහත්මයෙක්වත්, කවුරුවත් නැතුව ඒ කොන්ත්‍රාත් එක කරන කෙනාම පමණක් ඉඳගෙන ඒ ගොඩ කිරීම කළා. සුදුසු විදිහට ඒක කෙරුනෙ නැහැ කියන පැමිණිල්ල ආපු නිසා මමත් ගියා බලන්න. එතනදි පැහැදිලිව දක්නට ලැබුනා. ඒකෙ බරපතල අඩු පාඩුවක් තියෙනවා. මඩයි, ගලුයි, කුණු රොඩුයි ඔක්කොම දාල දෙපැත්ත ගොඩ කරනවා. මම සභාපතිතුමත් එක්කත් කතා කළා. ඒ පිළිබඳව කාටද අපි දැනුම් දිය යුත්තේ කියලා දන්නෙ නැහැ. ඒ නිසා මේකෙ මුදල් ගෙවීම් කරන්නෙ කොහෙන්ද? මොකද මේක එක පාලමක් සඳහා රුපියල් ලක්ෂ 300 වැඩසටහනක්. අපේ ජනතාවගෙන්මයි මේ මුදල යන්නෙ. මේවා ණය මුදල් ඒ නිසා අපේ වගකීමක් තියෙනවා. නිවැරදිව භාවිතා වීම පිළිබඳව සොයා බැලීම. ඒ නිසා එතනදි අපිට ගැටලුවක් මතුවෙලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දන්නෙත් නැහැ. මේ පිළිබඳව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙ නිලධාරීන් දන්නෙත් නැහැ. ඒ අඩුපාඩු නිවැරදි කර ගන්න. කොහේටද පැමිණිලි කළ යුත්තේ? මේව පිළිබඳව සොයා බලන්න දැනුම් දිය යුත්තේ කොහාටද? කියන එක පිළිබඳව අපිට සොයා බලලා දැනුම් දීමක් කරන්න කියන ඉල්ලීම කරනවා. ඒකෙ තව ගැටලුවක් තියෙනවා. මම හිතන්නෙ අපේ සුදර්ශන මන්ත්‍රීතුමත් දන්නවා. ඒක පුංචි දොලක වැටෙන පාලමක් මෙච්චර විශාල මුදලක් ඒ සඳහා වැය වෙනවද කියලා, මම මුලදිත් මේ පිළිබඳව කතා කළා. එතනදි මට මතකයි. මෙතුමන්ලා සඳහන් කළා. ඒ සකස් කරල තියෙන්නෙ සම්පූර්ණයෙන්ම ඒ පාරෙ දෙපැත්තෙ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම ඇතුලුව ඒ කටයුත්තටෙයි කියලා. නමුත් එහෙම එකක් සිදුවෙන විදිහක් පෙනෙන්න නැහැ. මීටර් 10 ක් වගේ සුලු දුරක් දෙපැත්තට කොන්ක්‍රීට් කළාම ඒකෙ ගැටලුවකුත් තියෙනවා. තව බොහොම පොඩි ප්‍රමාණයක් මම හිතන්නෙ තව මීටර් 10 ක් 15 ක් වගේ ඉතුරු වෙනවා. එතකොට ඒ කොටස සම්පූර්ණයෙන්ම යන්න බැරි මට්ටමේ කොටසක් තියෙන්නෙ. ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරවලා මාර්ගය සම්පූර්ණ කර ගන්න පුලුවන්ද කියන කාරණය සොයා බලන්න අවශ්‍යතාවය තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව පොඩ්ඩක් සොයල බලල වගකිව යුතු ආයනයක් තියෙනවනම්, අනිවාර්යයෙන් තියෙන්න ඕන. අදාල ආයතනයට ඒ පිළිබඳව සොයල බලල දැනුම් දීම කරන්න කියන ඉල්ලීම කරනවා.

ඊලගට අනික් කාරණය මම මේ වෙලාවෙ පුංචි සභිපත් කිරීමක් කරන්න ඕන. විශේෂයෙන් අපි හැමදාම හැම තැනකම බොහෝ වෙලාවට යම් යම් අඩුපාඩු නිසා නිලධාරීන් විවේචනය කිරීම් කරනවා. ඒ නිසා යමක් කළහම ඒකට ප්‍රසාදය එල කිරීමත් අපේ යුතුකමක් කියලා මම විශ්වාස කරනවා. උඩුගම බංගම මාර්ගයේ පසුගිය කාලයේ උඩුගම රබර් කර්මාන්ත ශාලාව අසල බෝක්කුවක් කැඩිලා තිබිලා ඒක නිවැරදිව සකස් කළා. නමුත් ඒක නිම කිරීමෙදි බරපතල ගැටලුවක් තිබුනා. අපට වාහනයක්වත් යන්න බැරි විදිහට ඒ අවසන් කිරීම සම්පූර්ණ වෙලා තිබුනෙ නැහැ. මම පසුගිය සිකුරාදා වගේ දවසක ගිහිල්ලා ඒ අදාල නිලධාරීතුමාට, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන භාර නිලධාරිතුමාට දැනුම් දුන්නා. එතුමා ඒ පිළිබඳව ක්ෂණික අවධානය යොමු කරලා, සඳුදා වෙනකොට ඒ වැරැද්ද නිවැරදි කරලා සකස් කරලා තිබුනා. ඒ නිසා විශේෂයෙන් මම එතුමාට ප්‍රසාදය එල කරනවා. එවැනි නිලධාරීන් ඉන්නවානම් අපේ අඩුපාඩු නිවැරදි කර ගැනීමේ පහසුව තියෙනවා. ඒ එක්කම මට මතකයි මම මේ සභාවෙ මීට පෙරත්

කතා කළා. උඩුගම අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් පැනිගලයාය ප්‍රදේශයේ මාර්ගයක් තිබුනා. මොන විදිහකින්වත් අඩුම තරමේ බයිසිකලයකින්වත් යන්න බැරි මට්ටමේ ඉතාම සෝදාපාලු වෙලා ගල් මතු වෙලා යන්නම බැරි මට්ටමේ නිවෙස් කීපයක් තිබුනා. මට මතකයි අපේ හිටපු සභාපතිතුමා අජිත් එඬේර ආරච්චි මහත්මයත් මේ පිළිබඳව සභාවෙ සඳහන් කළා. මම සභාපතිතුමාගෙන් නැවත නැවතත් කරපු ඒ ඉල්ලීම තුල මම හිතන්නෙ එතුමා ඒකට මැදිහත්වෙලා විශේෂයෙන්  වටවල වතු සමාගමේ සහයෝගය ලබාගෙන යන්ත්‍රයක් යොදලා ඒ මාර්ගය පසුගිය සතියෙ සකස් කරල දුන්නා. විශේෂයෙන් මම මේ වෙලාවෙ ගරු සභාපතිතුමාට ඒ මැදිහත්වීම පිළිබඳවත්, විශේෂයෙන් ඒ සඳහා අපට සභාවෙන් මම හිතන්නෙ විශාල මුදලක් දරන්න වෙන කාර්යයක් ඒ කළේ. ඒ නිසා ඒ සහයෝගය ලබා දීම පිළිබඳව වටවල වතු සමාගමේ නාකියාදෙනිය වතුයායේ අදාල කටයුත්තට සහයෝගය දීපු නිලධාරී මහතුන්ටත් මම විශේෂයෙන් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට මේ වෙලාවෙ ප්‍රසාදය එළ කර සිටිනවා.

ඒ කාරණය සිහි කරන ගමන් මම හිතන්නෙ අපි මෙවැනි අඩුපාඩු කිව්වම සහ ඒ අදාල ආයතනය දැනුවත් කිරීම සභාවෙන් කෙරෙන්නෙ කියලා කිව්වම සභාපතිතුමා කරලා තියෙනවා. යම් යම් අවස්ථාවල එහෙම සිදු වුනත් ඒවයි අඩුපාඩු තියෙනවා. මීලඟ කාරණයත් මම හිතන්නෙ ජනතාවට ඉතා දැඩි ලෙස බලපාන කාරණයක්. උඩුගම නැගෙනහිර බංගම මාර්ගයේ ආනන්ද විජය විද්‍යාලය අසලින් මම හිතන්නෙ දැන් වසර හයකට හතකට වැඩිය කාලයකට පෙර ගල්බැඳි දොල හරහා පාලමක් ඉදි කරන්න මුල්ගල් තියලා ඒක මම හිතන්නෙ අදියරෙන් අදියර ටිකෙන් ටික වෙලා, දැන් වසර ගණනාවක් තිස්සෙ අතහැරලා දාලම තමයි තියෙන්නෙ. මේ සභාවෙමත් අවස්ථා කිහිපයකදිම මේ පිළිබඳව සාකච්ඡා වෙලා තියෙනවා. දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙ සාකච්ඡා කරලා යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. මේක ඒ ප්‍රදේශයේ ජනතාවගෙ ඉතාමත්ම දැඩි අවශ්‍යතාවයක්. අඩුම තරමින් ඒ ජනසවිය ගම්මානයේ මාර්ගයකට අපේ සංවර්ධන යෝජනා ක්‍රම යටතේ පාරක් කොන්ක්‍රීට් කරන්න ගියත් යන්න විදිහක් නැහැ. අවශ්‍ය බඩු ගෙනියන්න විදිහක් නැහැ. ඒ නිසා මේ මාර්ගය ඉතා දැඩි අවශ්‍යතාවයක් තියෙනවා. මම හිතන්නෙ ඒක මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරියට තමයි අයිති. ඒ නිසා පසුගිය කාලයේ මේ පිළිබඳව සොයල බලලා අපි කොළඹත් ගිහිල්ල ඒ අදාල නිලධාරී මහතුන් හමුවෙලා, ඒ ගැටලුව තිබුනෙ ඒ අදාල කොන්ත්‍රාත්කරුගෙ මුදල් ගෙවීම හේතුවෙන් කියල ඒ මුදල් ගෙවන්න එකඟ වෙලා එතුමා නැවත ගිහිල්ල වැඩකටයුතුත් ආරම්භ කළා. නමුත් දැන් නැවත ඒ කටයුත්ත ඇනහිටල තියෙනවා. මේ දවස්වල ඒ ප්‍රදේශවාසීන්ගෙන් දැඩි ඉල්ලීමක් තියෙනවා. මේක කොහොම හරි ඉටු කරලා දෙන්න කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නෙ අපි සභාවෙ යෝජනාවක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට මෙන්න මේ කාරණය සිහිපත් කළා කියලා. ඒ ඉල්ලීම ඒ අදාල නිලධාරින්ට මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරියට මේ පිළිබඳව දැනුම් දීලා. නැවත මේ කටයුත්ත නිම කර දීමට කටයුතු කරන්නෙයි කියන ඉල්ලීම මම විශේෂයෙන් මේ වෙලාවෙ සිහිපත් කරනවා.

ඒ වගේම මේ වෙලාවෙ මම පුංචි සිහිපත් කිරීමක් කරනවා. අපේ මන්ත්‍රීවරු ගිය සභා වාරෙත් පොඩ්ඩක් කතා කළා. පසුගිය දිනවල කවුරු කොහොම කිව්වත් අපේ ප්‍රදේශයේ මේ කොවිඩ් වසංගතය හේතුවෙන් ජනතාවට අවශ්‍ය ඒ සහන ලබා දීමේ කටයුත්තෙදි, පළාත් පාලන මන්ත්‍රීවරු හැටියට අපිට යම් වගකීමක් පැවරුනා. මම හිතන්නෙ ඒකෙදි අපේ මන්ත්‍රීවරුන්ගෙන් විවේචන තියෙනවා. මම හිතනවා මේ කටයුත්තෙදි අපේ ප්‍රාදේශීය සභාවෙ අපේ බල ප්‍රදේශවල එහෙම කරන්නට තරම් විවේචනයක් නැති මට්ටමට අපි ඒ කටයුත්තට මැදිහත් වුනා. විශේෂයෙන් අපේ අජිත් එඬේර ආරච්චි මන්ත්‍රීතුමත් මමත් මගේ කොට්ඨාසයේ කටයුතුවලට ඉතාම හොඳින් මැදිහත් වුනා. ඒ අදාල නිලධාරීන්ටත් පුංචි ප්‍රසාදය එළ කිරීමක් කරන්න වෙනවා. මම හිතන්නෙ අඩුපාඩු එහෙම නැතුව අපිට අවශ්‍ය සහයෝගය මැනවින් මගේ කොට්ඨාසයේ ලැබුනයි කියන විශ්වාසය මට තියෙනවා. මම හිතන්නෙ මගේ කොට්ඨාසයේ කිසිම පැමිණිල්ලක් නොඑන විදිහට, උඩුගම නැගෙනහිර ඒ වගේම අලුත්වත්ත, උඩුගම මධ්‍යම, උඩුගම දකුණ කියන වසම් හතරෙම ග්‍රාම නිලධාරීතුමන්ලා, තුමියන්ලා ඒ වගේම සමෘද්ධි නිලධාරී තුමන්ලා, තුමියන්ලා

ඒ වගේම කෘෂි පර්යේෂණ නිලධාරී තුමන්ලා, තුමියන්ලා ඇතුලු ඒ සියලු නිලධාරීන් අපි සමග බොහොම සුහදව කටයුතු කළා. අපි පාක්ෂිකයො හැටියට සැලකුවෙ නැහැ. එක්සත් ජාත්ක පක්ෂයෙද, වෙනත් පක්ෂයකද කියල බැලුවෙ නැහැ. සියලු දෙනාට අවශ්‍ය සහයෝගය අපි ලබා දුන්නා. විශේෂයෙන් ඒ කටයුත්තෙදි මම පුංචි සිහිපත් කිරීමක් කරන්න ඕන. මගේ කොට්ඨාසය තුල පමණක් මම හිතන්නෙ මහ විශාල මුදල් ප්‍රමාණයක් අපි මේ සඳහා රජයේ මුදල් වැය කළා. ඒකෙදි මම හිතන්නෙ නාගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වැඩිම මුදල් ප්‍රමාණය දෙන්න ඇත්තෙ මගේ කොට්ඨාසයෙයි කියලා. රුපියල් එක්කොටි එක්ලක්ෂ අනූපන්දහසක මුදලක් මගේ කොට්ඨාසයේ මේ වසම් හතරෙ විතරක් ලබා දීල තියෙනවා. මේ කටයුත්තෙදි ඒ නිලධාරීන්ගෙ සහයෝගයත් එක්ක පවුල් 2039 කට මෙච්චර විශාල මුදලක් අපි ඉතාම මැනවින් ලබා දීල තියෙනවා. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් අපට මොකුත් පැමිණිල්ලක් එහෙම ඉදිරිපත් කළේ නැහැ. මම හිතනවා අපි අතින් අඩුපාඩුවක් වෙලා තියෙනවානම් තවමත් අභියාචනා ඉදිරිපත් කරල ඒව නිවැරදි කර ගැනීමේ හැකියාව තියෙනවා. ඒ නිසා ඒ කටයුත්ත පිළිබඳව සහයෝගය දීපු ඒ සියලු නිලධාරීන්ටත්, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා තමයි මේ පිළිබඳව සොයල බලල මූලිකම තීන්දු තීරණ ගත්තෙ. එතුමාටත් විශේෂයෙන් ඒ සහන ලබා දීම පිළිබඳව ප්‍රසාධය එල කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අප තරුණ ගොවි සමාජයට සහභාගි වීම පිළිබඳව ඔබතුමාට මම ප්‍රථමයෙන්ම ස්තූතිය පුද කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, මේ අයාලේ යන ගවයන් සම්බන්ධව ඔබතුමාගෙන් මම ගිය සභාවාරෙත් ඉල්ලීමක් කළා. අපි දිගින් දිගටම මේ සම්බන්ධව පැමිණිලි කළා. ඒ වගේම සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළා. නමුත් මේ වනතුරු රාජ්‍ය නිලධාරීන් හා කිසිම කෙනෙක් දැනුවත් වෙලා නැති බව තමයි මට පෙනෙන්නෙ. ඒ කියන්නෙ ගරු සභාපතිතුමනි ඔබතුමාලගෙ සංකල්පය යටතේ සෞභාග්‍ය උදා කරන්න කියලා කියනවා. නමුත් අපි ගෙවතු වගා කරනවා. තරුණයන් ගොවිපොලට බස්සලා ගොවිතැන් කරනවා. නමුත් මේ හානිය ගැන කිසිම කෙනෙක් බලන්නෙ නැහැ. අන්න ඒ වගේ තත්වයක් උදා වෙලා තියෙන්නෙ. ගරු සභාපතිතුමනි අපි 15 වැනිදා වැපුරුවා. එදා ඉදල මේ වනතෙක් රෑ 2.00 ක 3.00 වෙනකම් නිදි වරාගෙන තමයි කාලය ගත කරන්නෙ. නමුත් ඒ සම්බන්ධව කිසිම පියවරක් අපට ගන්න බැරි ඇයි කියල මම ඔබතුමාගෙන් අහනවා. ඇත්තටම අපට අපේ ගම් වැසියන් කියන්නෙ මේ සභාව සතුව තමයි සියලු වගකීම තියෙන්නෙ කියලා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කතා කළත් කියනවා. අපි ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඇහුවම කිව්වෙත් මේ තත්වයම තමයි. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි මේකට මොකක් හරි වැඩපිළිවෙලක් යොදා ගමු. ගරු ලේකම්තුමිය හරහා, පොලීසිය හරහා ඒ වගේම තමයි අපේ ගමකට නියෝජිතයන් 05 දෙනෙක් පත්කරලා ඉන්නවා. ඒ 05 දෙනා හරහා අපි මේ කටයුත්තට සම්බන්ධ කර ගමු.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලගෙ සංකල්පය දැන් ඇත්තටම මට කියන්න ඕන. මේ මොහොතේ ඔය කොවිඩ් නයින්ටීන් වසංගතය පිළිබඳව පළමු කාන්තාව හමුවෙන්නේ දෙසැම්බර් 27 චීන කාන්තාවක්. ඊට පස්සෙ තව මාස තුනකින් පස්සෙ තමයි මේ රට වහල දාල මේ අගාදයට වැටුනෙ. ගරු සභාපතිතුමනි,මම අහන්න කැමතියි. අපි මේ කමිටු හැදුවා. මේ කමිටු හදලා එක කමිටුවකටවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයෙක් සම්බන්ධ කළාද? ඇත්තටම අන්න ඒක ගැන අපිට කණගාටුයි. ඒ කියන්නෙ ගමක් දැනුවත් කළාද? අපේ වගකීම ඒක. අපට උපතේ සිට මරණය දක්වා වගකීමක් තියෙනවා. නමුත් මෙතෙක් කල් එහෙම කිසිදු වගකීමක් කළේ නැහැ. දැන් වුනත් අපිට මේ මයික් එක මෙහෙම අල්ලන්න පුලුවන්ද? මේ මුඛ ආවරණය විතරක් දාගත්තට ඇත්තටම මේකෙ සෞඛ්‍ය තත්වයක් තිබේද? මම අහන්නෙ අන්න ඒ ටික තමයි.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ මේ වනිගරත්න මන්ත්‍රීතුමා නිලධාරීන්ට ස්තුති කළා. ඒ කමිටු සම්බන්ධව මමත් ස්තුති කරනවා. නමුත් මට තියෙන ගැටලුව තමයි 215 බී අලුත් පහල බටහිර දයාවතී ගුරුගේ කියල මහත්මියක් මෙන්න මේ වගේ අභියාචනාවක් දීල තියෙනවා. අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා ඇති. ගරු සභාපතිතුමනි අවසර දෙනවනම් මම මේක කියවන්නම්. **සහනාධාර මුදල් ලබා ගැනීම සම්බන්ධවයි. 215 බී අලුත් පහල බටහිර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි දයාවතී ගුරුගේ වන මා හට ඇදිරි නීති තත්වය හේතුවෙන් අපහසු තත්වයට පත්වී ජනතාවට ලබා දෙන රජය මගින් ලබා දෙනු ලැබූ රුපියල් 5000 ක දීමනාව තවමත් ලැබී නැත. මා දීර්ඝ කාලීනව දියවැඩියාව, අධික රුධිර පීඩනය ආදී රෝග ගණනාවකට බෙහෙත් බොන රෝගියෙක්ද වෙමි. මාගේ ස්වාමි පුරුෂයාද මිය ගොස් ඇති අතර මා ඉතා අපහසු තත්වයෙන් ජීවත් වෙමි. එබැවින් මා හට රජයෙන් ලබා දෙන සහනාධාර මුදල ලබා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.** මේ සමඟ නිර්දේශ කරපු බෙහෙත් තුන්ඩුවත් තියෙනවා. ගරු සභාපතිතුමනි, මම මේක ඉදිරිපත් කරන්නෙත් නැහැ මේ වෙලාවෙ. නමුත් මම මේක ඉදිරිපත් කරන්නෙ අපේ වසමේ රාජ්‍ය නිලධාරීන් වැඩ කරන පවුල් හතකට දීල තියෙනවා. එහෙම දෙන්න පුලුවන් මොන නිර්නායකයන් යටතේද? පළමුවෙන්ම ගත්තොත් සමෘද්ධි නියාමක තුමියක් ඉන්න ගෙදරකට දීලා තියෙනවා. හමුදාවෙ පුතාල 05 දෙනෙක් ඉන්න ගෙදරකට දීල තියෙනවා. මේ අසරණ අම්මට දුන්නෙ නැත්තෙ ඇයි? කමිටුවෙන් කොහොමද නිර්දේශ කළේ? ඒක ඔබතුමාට මම වගකීමෙන් කියනවා. ඒ නිසා මම මේ මොහොතෙ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නෙ ඔබ සියලු දෙනාම මේ කමිටුවල ඉන්න අති. නමුත් මෙන්න මේ වගේ අසරණ පවුල්වලට පිහිට වෙන්න කියලා මේ මොහොතෙදි ඉල්ලා සිටිමින් මෙම වසංගත රෝගය අපේ රටින් දුරුවේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම යෝජනා කීපයක් ඉදිරිපත් කරන්න කැමතියි. කුරුපනාව තේ කම්හල පාරෙ කුරුපනාව සමගි පෙරපාසල අසල තියෙන පොදු නාන ලිඳ සුද්ද පවිත්‍ර කරලා, නැවත ජනතාවට ජලය පාවිච්චි කරන්න හැකි විදිහට සකස් කරලා දෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් ඒක කැඩිලා බිදිලා සියලුම දේවල් වැටිලා තියෙන්නෙ. ඒ ප්‍රදේශයේ ගොඩක් මිනිස්සුන්ට වර්ෂා දිනයන් වුනත් ඔවුන්ට ජලය නැති තත්වයක් උදා වෙලා තියෙන්නෙ. එම නිසා ඒ ලිඳ සුද්ද පවිත්‍ර කරලා ජනතාවට වතුර ගන්න සලස්වා දෙන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, වීථි පහන් සම්බන්ධව තවත් යෝජනාවක් කරනවා. කුරුපනාව ෆැක්ටරිය පාරෙ අපේ ගනේවත්ත මහතාගේ නිවස ලග සිට ෆැක්ටරිය දෙසට සියලුම බල්බ් පිච්චිලා. ඒ නිසා ඒ බල්බ් ටික දාලා දෙන්න කියලත් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි වංගුවෙ කඩේ අසල ගල් දාලා තියෙනවා. එතන ලයිට් කනුවට ලයිට් එකක් දාල දෙන්න කියලා මම සභාපතිතුමාගෙන් කිහිප වතාවක්ම ඉල්ලා සිටියා. ඉතිං ඒ ලයිට් එකත් දාල දෙන්න කියලා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි අපි තව යෝජනාවක් කළා. මම හිතන්නෙ උප සභාපතිතුමත් පසුගිය දිනවල මේ යෝජනාව කළා. පාරවල් ගැසට් කරන්න කියලා අපි යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. එහිදි මම අපේ විෂය භාර නිලධාරීතුමිය හමුවෙන්න ආවා. මේවා දැන් අදාල විෂයෙන් අදාල ස්ථානවලට දැනුවත් කරල තියෙනවද දැනුවත් කරල තිබුනොත් අපට ඉදිරියෙදි හරි ඉක්මන් වෙන්න පුලුවන්. ඊට පස්සෙ බලන කොට ඒ විෂය ගැන කිසිම තොරතුරක් මේ වෙනකොට වෙලා නැහැ. සභාවෙ කතා කරපු දේවල් විතරක් බවට පත්වෙලා තියෙනවා. ඉතිං මම ඒ නිලධාරීතුමියලටත්, ගරු සභාපතිතුමාටත් කියනවා. ගරු ලේකම්තුමියගෙනුත් ඉල්ලනවා. දැන්ම ඉදන්ම ඒ නිලධාරීන් ලවා ඒ ගැසට් කරනදේ ඉක්මන් කළොත් අපිට ඉස්සරහට අපේ පාරවල් ගැසට් කරන ඒවා ඉක්මන් කර ගන්න පුලුවන් වේවි. ඒක නිසා ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අද මම හිතන්නෙ මේ අවස්ථාව මට විශේෂ අවස්ථාවක් වෙනවා. 2018 පෙබරවාරි මාසෙ පැවති පළාත් පාලන මැතිවරණයෙදි එක්සත් ජාතික නිදහස් පෙරමුණ පක්ෂය විසින් පත්කළ සභිකවරියක් වශයෙන් මමත් නාගොඩ ප්‍රාදේශීය සභාවට සභිකවරියක් ලෙස පත්වී ආවා. එදා සිට අද දක්වා මා සභික ධූරයේ මට පුලුවන් ශක්ති ප්‍රමාණයෙන්, ඒ වගේම සියලුම බල ප්‍රදේශවල මට මාගේ පක්ෂයේ මතය, ඒ වගේම සාධාරණව සියලුම වැඩකටයුතු මට පුලුවන් ශක්ති ප්‍රමාණයෙන් මම ඉෂ්ඨ කළා. ඒ වගේම බිරිදක් මවක් වශයෙන් මගේ යුතුකම් ඉටු කරන ගමන් මේ ලැබුන ජනතා නියෝජිත ධූරයෙන් විශාල කාන්තා ගැටලු රාශියක් විසඳන්න, ඔවුන්ට සහය වෙන්න මට පුලුවන් වුනා. ඒ වගේම ගොවි තරග, කාන්තා සමිති වගේම විශාල වැඩකොටසක් කරන්න ශක්තිය ධෛර්යය මේ මන්ත්‍රී ධූරය හරහා මට ලැබුනා. ඉදිරියෙදිත් මම මේ මන්ත්‍රී ධූරයෙන් අයින් වුනත්, සියලු දෙනා සමග මට පුලුවන් මගේ ශක්ති ප්‍රමාණයෙන් වැඩ කිරීමට බැඳී ඉන්නවා. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නෙ, මම පෙර කළ යෝජනා නැවත සොයා බලලා ඒවා සුදුසුයි නම් ඒ යෝජනා බල ගන්වන ලෙස මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.මම හිතන්නෙ මම අපේ බල ප්‍රදේශයට සුදුසු යෝජනා තමයි ඉදිරිපත් කරල තියෙන්නෙ.

ඒ වගේම මට මේ සභික ධූරය ලබා දීමේදී මගේ නායක උපාලි අමරසිරි මැතිඳුන් ඉමහත් කැප කිරීමක් කළා. එතුමා ඇත්ත වශයෙන්ම කියනවනම් අපේ පක්ෂයේ වගේම අපේ නායකයන්ගෙ අපේ දේශපාලඥයින්ගෙ සුවිශේෂී වූ නායකයෙක්. අවංක, ඒවගේම බුද්ධිමත් උගත් හොඳ නායකයෙක්. ඉතිං අපිටත් දුකයි. එතුමා දේශපාලනයෙන් ටිකක් දුර ඈතක ඉන්නෙ. එතුමා ගැන මම විශේෂයෙන් සිහිපත් කරනවා. මම මේ දේශපාලන ගමන, මගේ ජීවිතේ මම මේ පැත්ත නොසිතපු පැත්තක්. ජීවිතේ උඩුයටිකුරු කරමින් මම මේ පැත්තට ගෙනාවෙ එතුමා. ඉතිං මම එතුමාටත් මේ අවස්ථාවෙ මගේ අවංක ආදර ස්තූතිය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම මගේ පක්ෂයේ ලේකම්තුමා මෛත්‍රී ගුණරත්න මැතිතුමා එතුමටත් මගේ අවංක ආදර ස්තූතිය පුදකරනවා. මම අද මෙතනට මේ වගේ පැමිණිය නිසා තමයි ඔබලා හඳුනා ගැනීමට හැකියාව ලැබුනෙ. ඒ වගේම මම හිතුවෙ නැහැ. මට මේ වගේ දේශපාලන ගමනක් මේ වගේ පැත්තක් මම ජීවිතේ හිතුවෙ නැති කෙනෙක්. මම මගේ දරුවන් සමග ගෙදරට වී ඉන්න සිතූ කෙනෙක්. මේ නොසිතූ විදිහට මම මේ පැත්තට යොමු කරලා. මාව මේ ගමන ගෙනාවෙ මගේ මහත්තයා කිංස්ලි ජාගොඩ. මම එතුමාට මගේ හද පිරි ස්තූතිය මේ අවස්ථාවෙ පුද කරනවා. එතුමා මගේ පිටිපස්සෙන් ශක්තියක් වෙමින් මගේ දියුනුව ඉස්සරහට පොඩ්ඩක් හෝ තිබුනනම් ඒ එතුමා නිසා. එතුමා මගේ පස්සෙන් ඉඳගෙන මේ දේවල්වලට උදවු කළ නිසා මම එතුමාටත් මේ වෙලාවෙ ස්තූති වන්ත වෙන්න අවස්ථාවක් කර ගන්නවා. මම මේ අවස්ථාවෙ වැඩි වශයෙන් කතා කරන්නෙ නැහැ. කියන්න තියෙන්නෙ බලය කියන්නෙ තාවකාලිකයි. අපි නිතරම අත හැරිය යුතු දෙයක් ඒ නිසා මම තීරණය කළා. මේ බලය තාවකාලික නිවහනක් බලය තුල සදාකල් රැඳී සිටීම සුදුසු නැහැ කියලා. මගේ සිය කැමැත්තෙන් මගේ පෞද්ගලික කටයුතු සඳහා මම ධූරයෙන් අයින් වෙන්න තීරණය කළා. මම ඉතාමත් සතුටින් මම ආ මේ ගමන ගැන ඉතා සතුටු වෙමින් මම අයින් වෙනවා. අපි යම් යම් මත දැරුවත් ඒ මත දරාගෙන ඔබලා සියලු දෙනා එක්ක සමගියෙන් කටයුතු කිරීම පිළිබඳව ගොඩක්ම සතුටු වෙනවා. ඒ වාගෙම මම දේශපාලන ගමනින් අයින් වුනත් ඕනෑම අවස්ථාවක ඔබලාට මගෙන් උදවුවක් අවශ්‍යතාවයක් සපුරාදීමට මම ඕන අවස්ථාවක සූදානමින් ඉන්නවා. ඒ ටික තමයි මට මේ වෙලාවෙ කියන්න තියෙන්නෙ. තවද පක්ෂ විපක්ෂ බේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරුන්ට සියලුම මන්ත්‍රීවරියන්ට මගේ අවංක ආදර ස්තූතිය මේ වෙලාවෙ පුද කරනවා. ඔවුන්ගේ දේශපාලන ගමන ඉතා ශක්තිමත්ව ලස්සනට ගෙනියන්න හැකියාව ලැබේවා කියා පතනවා. ගරු සභාපතිතුමාටත් මේ සභාවේ මීට වඩා දිදුලන ක්‍රමවත් වැඩපිළිවෙලක් ගෙනැල්ලා හොඳම සභාව කර ගැනීමට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ලේකම්තුමිය ඇතුලු සියලුම නිලධාරී තුමන්ලට නිලධාරී තුමියන්ලට සේවක සේවිකාවන්ට මාහට විශාල වශයෙන් සහයෝගය දැක්වූ සියලුම දෙනාට මේ අවස්ථාවෙ මගේ අවංක ආදර ස්තූතිය පුද කර සිටිනවා. සියලුම දෙනාට සුභ අනාගතයක් වේවා කියා ස්තූති කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. අපේ ගරු මන්ත්‍රීතුමිය සභාවෙන් නික්මයාම පිළිබඳ අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ වගේම හොඳ සමුදීමක් අපි එතුමියට කරනවා. මොකද යමක් සභාවට ඉදිරිපත් කළ මන්ත්‍රීතුමියක් හැටියට මම දකිනවා. මොකද ඒ ඉදිරිපත් කිරීම් පිළිබඳව ඇතැම්විට එතුමිය ගැන අපෙත් යම් විවේචනයක් තිබුනා. නමුත් සභාවෙන් වියයුතු දේ පිළිබඳව එතුමියගේ විවේචනයන් තිබුනා. ඒ පිළිබඳ අපි අගය කරමින් ගරු කරමින්, ඔබ තාවකාලිකව සමුදෙනවයි කියල කිව්වෙ. එහෙමනම් නැවත වාරයක් මම හිතන්නෙ මැතිවරණයෙන් ඔබතුමිය ආපසු ඒවි. එහෙම එන්න කියලා අපි සුභ පතනවා.

ගරු සභාපතිතුමනි අපේ තියෙන ප්‍රධාන ආදායම තමයි තල්ගස්වල සති පොල. මම හිතන්නෙ අපේ සභාවට වැඩියෙන්ම ආදායම ගේන මේ සති පොල මේ වෙනකොට ආදායම නැති තත්වෙට පත්වෙමින් හෙමින් හෙමින් යනවා. මේක පියල් මන්ත්‍රීතුමා කතා කරන්න ඕන. මේ පිළිබඳව සභාවෙ සියලු මන්ත්‍රීවරු ඒක උඩුගමද නාගොඩද යටලමත්තෙද කියන එක නෙවෙයි. සභාවෙ වියදම් කරන සල්ලි අපට වැඩපුර හම්බ වෙන්නෙ, ලොකු මුදලක් එකපාරට ලැබෙන්නෙ මේ සති පොලෙන්. මේ සති පොලේ අපේ තියෙන තත්වෙ එච්චර හොඳ නැහැ. ඒ හින්ද මේ පිළිබඳ ලොකු අවදානයක් යොමු කරලා. මම හිතන්නෙ අද දවසේ කොහොම හරි මේ පිළිබඳව කතා කරලා. ඉස්සරහට කරන්න ඕන මොකක්ද? නැත්නම් මේ සති පොලේ තියෙන ආදායම නැති වුනොත් අපට ලොකු පාඩුවක් වෙනවා. ඒ වගේම අපේ මාපලගම තිබුන බැංකු දෙක තුනම අපෙන් තල්ගස්වලට ගිහිල්ලා තල්ගස්වලිනුත් එහා පැත්තට ගිහිල්ලා දැන් නියාගම ප්‍රාදේශීය සභාව යටතෙ තියෙන්නෙ. නාගොඩ ප්‍රාදේශීය සභාව යටතෙ RDA ඔෆිස් එක තියෙනවා. ඒකට මිනිස්සු සම්බන්ධ වෙන්නෙ නැහැ. අපිට ඒ වගේ ඒව නෙවෙයි ආදායමක් උපයන්න පුලුවන් ජනතාවත් එක්ක ගැටෙන ආයතන පුලුවන් තරම් අපි අපේ සභාව තුල රැකගන්න වැඩපිළිවෙලක් අපි හදාගන්න ඕන. ඒ හින්ද මම හිතනවා මේ තල්ගස්වල සතිපොල පිළිබඳව අවදානය යොමු කරල, මම උප සභාපතිතුමාගෙනුත් ඉල්ලනවා. බන්දුල මන්ත්‍රීතුමා අපේ පියල් මන්ත්‍රීතුමා වසන්ත මන්ත්‍රීතුමා මේ පිළිබඳව අදහස් දක්වල මොකක්ද කරන්න ඕන කියලා මේක පිළිබඳව ලොකු ගැටලුවක් තියෙනවා. ගරු සභාපතිතුමනි, මේ පොලෙන් එන මුදල අපට ලබා ගන්න වෙන උපක්‍රමයක් මොකක්වත් නැහැ. ගැටලුව තමයි අපේ විපක්ෂ නායකතුමා පහුගිය කාලයේ ඉදල අපේ පොල හදන්න ඕන කියලා පාරෙ පොල දාන්නෙ නැතුව පොලේ ඉන්න වෙලෙන්දො ඇතුලට දැම්මා. ඒක එකක් එතකොට අර පාරෙ යන අය, වැඩට යන අය නිකන් යන ගමන් බඩුවක් ගන්න තියෙන තත්වෙ නැති වුනා. පොලට ඇතින් බයිසිකලේ නවත්වලා රුපියලක දෙකක ලාබෙට පොල ඇතුලට යන එක එහෙම අපේ මිනිස්සු කැමති නැහැ. වැඩට යන මනුස්සය නියාගම පැත්තට යන කොට එතනින් එහෙම නැත්නම් නියාගම, පිටිගල පැත්තෙ ඉදලා නාගොඩ පැත්තට එන මිනිස්සු පාරෙ නවත්වල එළවලු ටික මාලු ටික අරගෙන යන ක්‍රමයක් අපි දැක්ක ඉතිහාසෙ ඉදලා. නමුත් අපි පොල හදන්න ඕන කියලා ඒකට නීති දාල පොලේ ඉන්න වෙලෙන්දො පොල ඇතුලට ගාල් කළා. එතකොට අර පාර දෙපැත්තෙ පොල නැති නිසා සෙනග නවතින්නෙ නැහැ. එක කාරණයක් ඒක.

ඊලගට ඇතැම් වෙලාවට මුදලාලිලත් කිහිප දෙනෙක් අපෙන් අඩු වුනා. මොකද එලවලු මුදලාලිල දෙන්නෙක් වගේ තමයි දැනට ඉන්නෙ. එයාගෙන් තමයි ඔක්කොම බඩු අරගෙන දාන්නෙ. කරවල මුදලාලිලා එක්කෙනයි ඉන්නෙ. එයාගෙන් බඩු අරගෙන තමයි අනිත් කට්ටිය දාන්නෙ. එහෙමනම් කොහොම හරි අපි නැවතත් මේ කට්ටියට කතා කරලා, තරගකාරී වෙළඳ පොලක් ඇති කර ගන්න ඕන. ඊලග එක තමයි මේ වෙන කොට පොළ බැංකු දෙක ගාවට ගිහිල්ලා. නියාගමට ගිහිල්ලා. එතන දැන් දිගටම හැමදාම දවස් හතේම පොල දාල තියෙන්නෙ. ඉතිං මේකෙදි ආපහු තල්ගස්වල පොලක් දැම්මට ඒකට සෙනග එන්නෙ නැති තරමට පත් වෙලා තියෙන්නෙ. අපට නියාගම ප්‍රාදේශීය සභාවට අභියෝගයක් කරන්න බැහැ. මොකද අපේ භූමිය නෙවෙයි. ඒක නිසා මේක සුහදව කතා බහ කරල, අපේ

නියාගම ප්‍රාදේශීය සභාවෙ සභාපතිතුමත් එක්කත් කතා කරල ඒක තාවකාලිකව මොනවහරි කරල,අපේ තියෙන දේ රැකගන්න ඕන. එයාලට පොලවල් තියෙනවා ආදායම් තියෙනවා. නමුත් අපට තියෙන ආදායමත් එක්ක අපි මේ පොල ප්‍රධාන දෙයක් හැටියට සලකල මේ පිළිබඳ අවදානය යොමු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා, තමුන්නාන්සෙ පාරවල්වල ඩයලොග් කොම්පැනියෙ කනු ඉන්දන්න අවසර දුන්නා. මේ වෙනකොට එයාල බලෙන් සින්නක්කර ඉඩම්වල කනු ඉන්දගෙන යනවා. මෙකට අහන්න කෙනෙක් නැහැ. RDA 5000 ගෙවුවනම් ඇයි අපේ ඉඩම්වලට ගෙවන්න බැරි. ඒ හින්ද මේ ඉන්න සියලු දෙනාට මම කියන්නෙ තමුන්ගෙ කොහේ හරි කනුවක් ඉන්දනවනම් ඉන්දන්න දෙන්න එපා. මාර්ග රක්ෂිතයේ ඉන්දුවට ඒකට අපට මොකුත් කියන්න බැහැ. නමුත් කොහෙවත් යන කොම්පැනියකින් සින්නක්කර ඉඩමකට ඇතුලු වෙලා එයාල සල්ලි හම්බ කර ගන්නවා. එතකොට ඒ කනුව කැඩුනම අපි ගෙවන්න ඕන. අපට වෙන හානිය එතන තියෙන ගහ කපනවා. අපි එදත් මේකට අවසර දෙන කොට ඔය කතාව මම කිව්වා. හැබැයි එයාල මේක කොහොමද ඉන්දන්නෙ, ඩැමේජ් වුනාම කොහොමද අයකර ගන්නෙ කියලා අපට මොනවත් දුන්නද නැහැනෙ. දැන් ඒ කනුව අපේ අතින් කැඩෙනවා. එතකොට කොහොමද ගෙවන්නෙ. මොකුත් නැහැ නිකන් අවසර දෙනවා. RDA එකත් වැරදියි. රාජ්‍ය ආයතන සියලුම දෙනා වැරදියි. අපේ ඉඩමෙ කනුවක් ඉන්දලා අපි ගහක් කපන කොට ඒ කනුව කැඩුනම අපි ගෙවන්න ඕන. මාර වැඩක් මේක. ඒ කනුව අපිට අයින් කරගන්න සල්ලි ගෙවන්න ඕන. අලුතෙන් ගෙයක් හදල ඒ කනුව නිසා පාර අවහිර වෙලා අපේ ගෙදරට ගොඩ වෙන්න විදිහක් නෑ කියමු. එතකොට ඒ කනුව මාරු කරන්න අපි ගෙවන්න ඕන. මේක මාර නීතියක්. මේවට නිර්නායකයක් දුන්නෙ කොහොමද කියලා මොකක්වත් නැහැ. සභාවෙ සභාපතිතුමත් සල්ලි ටික අරගෙන අවසර දුන්නා. කනුවක් අපේ ගේ ගාව ඉන්දනවා. අපේ අතින් කනුව කැඩෙනවා. එතකොට කනුවට ගෙවන්න ඕන කොහොමද ඒ මොකක්වත් ඇත්තෙ නැහැ. ගෙවන්න ඕන නැහැ කියල පොරොන්දුවක් දීල තියෙනවද? එයාල පොලීසියෙ පැමිණිල්ලක් දැම්මොත් මොකද කරන්නෙ. ඒකට මැදිහත් වෙන්න අපට තියෙන ඇක්ට් එක මොකක්ද? අපි ඉල්ල ගන්න ඕන මොනව හරි දෙයක් නීත්‍යානුකූලව මේකට මෙහෙම වුනාය කියලා. ඒක මම වෙනම කතා කරන්නම්. එහෙමනම් අද මේ අවදානය යොමු කරන්න කියල ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, තල්ගස්වල සතිපොල පිළිබඳව මීට වැඩිය අවදානය යොමු කරල ආරක්‍ෂා කර ගන්න වැඩපිළිවෙලක් හදන්න. නැත්නම් අපිට ලොකු මුදලක් අහිමි වෙන්නෙ

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. මේ පිළිබඳව මුලින්ම අපි දැනුවත් වුනාම සභාපතිතුමාට කිව්වා. එතකොට සභාපතිතුමා කිව්වෙ සෞඛ්‍ය උපදෙස් මත හා පොලීසියේ උපදෙස් මත පොලට ඇතුල් වීම තහනම්. ඊට පස්සෙ මම මේ සම්බන්ධව උප සභාපතිතුමා දෙපාරක් දැනුවත් කළා. ඊට පස්සෙ මම කවුද කියල නොකියා එහා පැත්තට ගිහිල්ලා වෙලෙන්දොත් එක්ක කතා කළා. මම කතා කරනකොට කිව්වා. අපිට එහෙම මොකුත් අවහිරයක් නැතෙයි කිව්වා. කවුරුවත් එපාය කියල නැතෙයි කිව්වා. කොරෝනා සිද්ධියත් එක්ක පාර දිගේ හැමදාම එලවළු දානවා. සතියෙ සදුදා,අගහරුවාදා බදාදා දිනවල එලවළු දානවා. එයාල මෙහාට ගෙන්නනන්නත් බැහැ. ඔයා කවුද ඇහුවා අපිට එහා පැත්තට එන්න කියන්න. පස්සෙ ඉතිං මෙතන වෙන ප්‍රශ්නෙකටනෙ මැදි වෙන්නෙ. ඊට පස්සෙ මම ආපහු සභාපතිතුමාට කිව්වා. පොලට ඇතුල් වෙන්න බැරි නිසා මේක මහා විනාශයක් වෙනවා. ඊට පස්සෙ අපේ පොල ගත්ත ධනපාල මහත්තයට කිව්වා. අපි මාපලගමට පොල ගේමු කියලා. ඒ වුනාට වෙලෙන්දො එන්නෙ නැහැ. ඒක අපට ගේන්න ක්‍රමයක් හදන්න බැහැ. අර මිනිස්සු මෙහාට එන්නෙ නැහැ කිව්වට. හොඳම වැඩේ තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දැනුම් දුන්නනම් හරි එයාලගෙනෙ බැංකුව ඉස්සරහ ටික එක තහනම් කලාපයක් කරන්න කියලා. අපි කිව්වට එන්නෙ නැහැ. නැත්නම් ආණ්ඩුකාරතුමා එක්ක කතා කරල පාරෙ පොල දාන්න එපා කියල අන්න එහෙමවත් ක්‍රමයක් හදන්න වෙන්නෙ.

## ගරු සභාපතිතුමා පොළ පිළිබඳව පැහැදිලි කිරීම

ගරු මන්ත්‍රීවරුනි පොලේ ප්‍රශ්නය වර්තමානයේ ඇති වෙච්ච තත්වය පිළිබඳ මම කියන්නම්. මේ කොවිඩ් වසංගතය නිසා පොලීසියට බලය පවරලා තියෙනවා. ජනතාව රැස්වන ස්ථානවන, රැස්වීම්, පොලවල් නවත්වන්න කියලා තහනම් කරන්න කියලා. ඒ අනුව තමයි පොල නවත්වල තියෙන්නෙ. නමුත් සෞඛ්‍ය බලධාරීනුත්, ප්‍රාදේශීය සභාවත් මේ පිළිබඳව දැනුවත් වුනේ පසුව. ජනතාව ඒක රාශී වෙන සියලුම කටයුතු නතර කරන්න කියලා. ඒ අනුව තමයි අපේ පොලවල් තුන නතර වුනේ. ඊට පස්සෙ පොල එලියෙ දාන්න ඇහුවා. නීත්‍යානුකූලව අපට ඒකට අවසර දෙන්න බැහැ. මොකද පොල එලියෙ දැම්මත්, ඇතුලෙ දැම්මත් ජනතාව එකතු වීම සිදු වන නිසා අපට ඒක කරන්න බැහැ. ඒ නිසා තමයි පොලවල්වල ආදායම නැති වුනත්, පොල නතර කළේ. අද වෙනකනුත් තවමත් පොලවල් පවත්වන්න බැහැ. ඊලගට අලුත් වෙලෙන්දො බිහි වුනා. එයාල පොලවල් අසලයි, වෙන තැන් තැන්වලයි හැම තැනම එලවළු ව්‍යාපාර කරන්න ගියා. ඒ පාර පිරිසක් ඒක කරන්න ඉඩ දෙන්න කියල කියනවා. තව පිරිසක් එපා කියල කියනවා. මට මේ අපේ මන්ත්‍රීවරුන්ගෙන්ම ඉල්ලීම් ආවා. මන්ත්‍රීවරු කොටසක් කියනවා අඩුවට විකුනන්නෙ අනේ මේ මිනිස්සුන්ට කරන්න දෙන්න කියලා. තවත් මන්ත්‍රීවරු පිරිසක් කියනවා මේ අල්ලපු කඩේ සභාවට බදු ගෙවනවා. ඒ නිසා ඒ කඩේ ලග කරන්න දෙන්න එපා කියනවා. ඉතිං මම ඔය දෙකෙන් මොකක්ද ගන්න තීරණය. ඒ අනුව තමයි යම් යම් ස්ථානවල දාන්න එපා කියල තීරණය කළේ. නැතුව සභාපති හැටියට මට ඕන විදිහට වැඩ කළේ නැහැ. තව එකක් මන්ත්‍රීවරුනි, කවුරුවත් වරදවා හිතන්න එපා. අපි මේ සභාව සතු සම්පත් පිටට යන්න දෙන්නෙ නැහැ. මට අපේ මන්ත්‍රීවරුත්, පිට අයත් කිව්වා. තල්ගස්වල පොල නියාගමට යනවයි කියලා නියාගම සභාවේ යෝජනාත් කළයි කියලා. මම කිව්වා කවදාවත් ඒක වෙන්නෙ නැහැ. හැබැයි ගල්ලිදේ පොලක් දැම්මට අපිට නතර කරන්නත් බැහැ. හිටපු මන්ත්‍රී කෙනෙක් කිව්වා ගිය සැරේ දාන්න හැදුවම තර්ජනය කරලයි නැවැත්තුවෙ කියලා. මම කිව්වා ඒකනම් මට කරන්න බැහැ. අපට අයිතියක් නැහැ. එහෙම කොහොමද අපි අනුන්ගෙ දේවල් නතර කරන්නෙ එහෙම බැහැ. අපි සුහදව කතා කරන්න ඕන. ඊට පස්සෙ මම අදාල සභාවෙ සභාපතිතුමත් එක්ක කතා කළා. යම් යම් යෝජනා සභාවට ඉදිරිපත් වුණා. නමුත් මගේ එහෙම අදහසක් නැත කිව්වා. මම කිව්වා අපේ ප්‍රධාන ආදායම් මාර්ගය මේක. ඔයාලට යුතුකමක් වගකීමක් තියෙවා ඒ ගැනත් හිතන්න කියලා. අනේ එහෙම අපි කරන්නෙ නැහැ කියලා කිව්වා. නමුත් වර්තමානෙ මේ වසංගතයත් එක්ක හැම තැනම එලවළු දාගෙන එහෙම ව්‍යාපාර කරනවා. ඊට පස්සෙ මම පොලීසියත් දැනුවත් කරලා, සෞඛ්‍ය බලධාරීන්ගෙ නිර්නායකත් එක්ක පොල පැවැත්වීමට කටයුතු කළා. මොකද තවමත් අද වෙනකනුත් පොලවල් පවත්වන්න අවසර දීලා නැහැ. පොල අපට ඕන ඕන තැනට ගෙනියන්න බැහැ. පොල එලියෙ තියනවයි, මාලු විකුනන අය එලියෙ ඉන්නවයි, පරිසරය අපිරිසිදු වෙනවයි ඇතුලට ගෙනියන්න කියලා කොරෝනා එන්න කලින් පොලීසියෙන් ඉල්ලීම් ආවා. ඒ අනුව එළියේ සිටි මාළු මුදලාලිලා ඇතුලට දාන්න හදන්න කොට ඒවාටත් විරෝධතා ආවා. නමුත් නන්දන මන්ත්‍රීතුමා, පොල මුදලාලිලා එදා ඉදලම පැවතිච්ච ක්‍රමවේදය. මුදලාලිල දෙන්නයි තුන්දෙනයි ඔය ලොකු මුදලාලිලා. එයාලගෙන් තමයි බඩු අරගෙන ව්‍යාපාර කරන්නෙ. මේ අද ඊයෙ වෙච්ච එකක් නෙවෙයි ඒක. මේ අපි ආවට පස්සෙ වෙන එකක් නෙවෙයි. එදා ඉදලම සිදුවෙන සිදුවීම් මාලාව. ඒක ලොකු එලවළු මුදලාලිල දෙන්නයි. කරවල මුදලාලිල එක්කෙනයි දෙන්නයි. ඔය කට්ටියගෙන් තමයි අවශේෂ මුදලාලිලා අරගෙන ව්‍යාපාර කරන්නෙ. ඇත්තටම තල්ගස්වල පොලේ ප්‍රශ්න වුනේ ඒ පොල නිර්මානය කරපු හැටියට. පරණ පොළ ඉවත් කොට අලුතින් ඩ පේලී ඉදිකිරීම තුල වෙළෙන්දන්ට තමන් සිටි ස්ථාන නොලැබී ගියා. ඒ අනුව වෙළෙන්දන් පැමිණීම අඩු වුණා.ඒ අවධියේ වෙළදාම් කල වෙළඳ මහත්වරුන්ගෙන් අදහස් අරගෙන පොළ ඉදිකරානම්. මේ අක්‍රමවත් ඉදිකිරීම නවතාගන්න තිබුණා. නමුත් දැන් සියල්ල සිදු වී හමාරයි. ඔය කටයුතු නිසා තමයි පොලේ යම් යම් ප්‍රශ්න ඇති වුනේ. පහුගිය දවස්වල පොල මේ තත්වයට පත් වුනේ මේ වසංගත රෝග තත්වය නිසා. නමුත් අපි පොල වැහෙන්නවත් නැති වෙන්නවත් ඉඩ දෙන්නෙ නැහැ. නමුත් පොළ අපේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වුනාට පොලේ මුදලාලිල ආවෙ නැතුවට අපට කරන්න දෙයක් නැහැ. නමුත් අපි උත්සාහ ගන්නෙ පොල

තව දියුනු කර ගෙන පොල ආරක්ෂා කර ගන්න. අපේ ප්‍රධාන ආදායම් මාර්ගයක් පොළ. ඒක අපි කවුරුත් දන්නවා. ඒ නිසා පොල එහා පැත්තට යාම වලක්වා ගන්න අපි උත්සාහ ගන්නවා. නමුත් අපට ඔයාල පොල දාන්න එපා කියල බලහත්කාරයෙන් කියන්න බැහැ. නමුත් සුහදත්වය උඩ අපි ඒ කටයුත්ත කරනවා. උඩුගම පොලේ සිදුවීමත් මේ වගේ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුනි මේ වෙලාවෙ ඇත්තටම ගරු සභාපතිතුමනි මේ පොල කියන්නෙ ඉතිහාස ගත පොලක්. මම ඒ පිළිබඳ කතා කරන්න ආවෙ නැහැ. නමුත් මේක තමයි අපේ තියෙන හදවත එහෙම කිව්වොත් හරි මම හිතන්නෙ. ඒක නිසා අපි බොහොම කල්පනාකාරී විය යුතුයි. මොකද ලක්ෂ විසි ගණනකට වගේ මම හිතන්නෙ ඕක දැන් දීර්ඝ කාලෙක ඉදල බදු දීල තියෙන්නෙ. ඒක නිසා රැකවරණය දෙන්න. ඒකට එහෙම නැත්නම් ඔබතුමාලගෙ මට්ටමෙන් මෙහෙම දෙයක් කරන්න පුලුවන්. නියාගම සභාවත් එක්ක කතා කරල කියන්න. ඔයාල මේ කටයුත්ත කිරීම තුල අපට ලොකු හානියක් වෙනවා. මොකද එකම දේශපාලන පක්ෂයක සභපතිවරු දෙපොලක් ඉන්නෙ. ඒක නිසා ඕක සුහදත්වයෙන් විසඳ ගන්න. ඊලගට ඔය දැන් ස්ටෑන්ඩ් එකේනේද? වෙලදාම් කරනවයි කියන්නෙ. දැනට ඒක අයිති මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියටද? එහෙමනම් මේ තුල අපට හානියක් වෙනවා. මේ බස් නැවතුම් පොලේ මේක කරන්න දෙන්න එපා කියලා. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට දැනුම් දෙන්න. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියටයි RDA එකටයි ලියුමක් දාන්න. සභාපතිවරය හැටියට ඔබතුමාට ඒකට අයිතිය තියෙනවා. අපගේ පොල මෙන්න මෙතන තියෙනවා. ඊට මීටර් දහයක් දොලහක් ඇතින් මෙන්න මේ වගේ ව්‍යාපාරයක් කරනවා. පොලේ ව්‍යාපාරික ප්‍රජාවට මේකෙන් බලපෑමක් ඇති වෙනවා. ප්‍රධාන වශයෙන් සභාවට ලොකු හානියක් වෙනවා කියලා. ඔබතුමා ඉල්ලීම කරන්න. නියාගම සභාවට එහෙම එකපාරට ඇවිල්ල මෙතන පොලක් අස්සෙ පොලක් දාන්න බැහැ. ඒ නිසා ඒව කතා කර ගන්න. නැත්නම් මෙතන අපේ මත ගැටුමක් ඇති කරන්න හදන්නෙ. අපි හිතමු දැන් වදුරඹ පොල තිනෙවා. මෙතන සභාව දෙකට කැඩිච්ච එකේ ප්‍රශ්නෙ තියෙන්නෙ. නැත්නම් කටඹුරාවෙ පොලක් දාන්න කාටවත් බැහැ. අන්න ඒක නිසා ඒ උදවියත් එක්ක කතා කරන්න. ඊට පස්සෙ දැනුම් දීම කරන්න. නැත්නම් තල්ගස්වල පොල වැරදිලාවත් වැහුනොත් ඔබතුමා ඒකත් එක්ක ඉතිහාසෙට එකතු වෙනවා. ඊලග ටෙන්ඩර් කිරීමෙදි ඕක ඔය මුදලට දෙන්න බැරි වෙනවා. ඒක නිසා විශේෂයෙන්ම අපේ අවදානය යොමු කරන්න වෙනවා.

ඊලගට මම යෝජනාවක් කරනවා. ගරු සභාපතිතුමනි අපේ කොම්පෝස් තියෙනවා. කරුණාකරල ලබන සභාවට මෙම කොම්පෝස් පොහොර ආයතනයේ නිෂ්පාදනය මාසිකව මෙන්න මෙච්චර ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. මෙච්චර ප්‍රමාණයක් අපි අලෙවි කරල තියෙනවා. ඊට පස්සෙ මෙන්න මෙච්චර ශ්‍රමය ගිහිල්ල තියෙනවා. මෙන්න මෙතනයි තියෙන්නෙ කියලා. අපට සභාවට ඉදිරිපත් කරන්න. මම හිතන්නෙ කවදාවත් එවැනි වාර්තාවක් සභාවට ඇවිල්ල නැහැ. ඒ නිසා ඒ නිෂ්පාදනය පිළිබඳව ඒක කොතනද තියෙන්නෙ කියන එක පිළිබඳව මේ සියලුම මන්ත්‍රීවරු දැන ගන්නවයි කියන්නෙ. සියලුම දෙනා දැන ගන්නවයි කියන එක. ඒක නිසා අපට දැන ගැනීමේ අවශ්‍යතාවයක් තියෙනවා.

ඊලගට මට තව ගැටලුවක් තියෙනවා. ඒක ඔබතුමාට කොතනක හෝ වැරදීමක් වෙලා තියෙනවා. මාර්ගයේ සවි කරන්න වීදි ලාම්පු සභාවට ගෙනැල්ල තියෙනවා. මෙම වීදි ලාම්පුව මෙන්න රුපියල් 7000 කට ගෙනැල්ල තියෙනවා. අංග සම්පූර්ණ වීදි ලාම්පුවෙ මිල රුපියල් 8000 යි. පෙට්ටිය දැන් අන්න කාර් එකේ තියෙනවා. බැලුවා සභාවට ගෙනාපු එකම තමයි. වොට් ගණනත් 150 යි. එතකොට මම ගණන් හදල බැලුවම දෙලක්ෂ 25000 ක් අපේ සභාවට පාඩු වෙලා තියෙනවා. 12500 ට සභාවට ගෙනැත් තියෙන්නෙ. එහෙමනම් මේ සැපයුම් කරුගෙන් මේක ගන්න ඉස්සර වෙලා කොතනක හෝ මෙතන මොකක් හරි දූෂණයක් වෙලා තියෙනවා. ඒ කියන්නෙ මේක ගාල්ලෙන් ගිහිල්ල ඇහුවම කියනවා. මම කතා කළා. ඔච්චර ගණනක් ගන්නවනම් තවත් අඩුකරල දෙන්නම් මහත්තයො කියලා. අපි ගේන්නෙත් චීනෙන් මේකම තමයි වෙනසක් නැහැ. එතකොට අපෙන් කිට්ටුව පහත හින්ද වෙන්න ඇති ගන්න නැතුව ඇත්තෙ. මම කිව්වා මෙන්න මෙහෙම ගණනක් වෙලා තියෙනවා. මේ විදිහට වෙලා තියෙනවා කියලා. 7000 සෙ එක ලක්ෂ ගණනක බඩු ගන්නවනම් තවත් අඩු කරල දෙන්නම් කිව්වා. ඒක නිසා බලන්න මේවා නොසොයා නොබලා මේවා කිරීම එක්කො ඔබතුමාගෙ දූර්වල කමක්. ගාලු නගර සභාවෙ මේ ඕඩරය අල්ල දෙනවට, මට කියන්න බැහැ. මම චෝදනාවක් හදන්නෙ නැහැ. සමහර විට වෙනත් සභාවක, නියාගමට දෙනවට එයා දුරකතනෙන් කතා කරල කියන්න පුලුවන් ඔන්න මම තව එකක් එවනව කියලා. අද රටේ කොමිස් ගහන එක සාමාන්‍ය දෙයක් වෙලා තියෙන්නෙ. එතකොට මේ ඩීල් එකේ කවුරු හරි එක්කෙනෙක් ඉන්නවා. මේ සභාව පාඩු අරගෙන තියෙනවා. මේ ගණනෙ හැටියට 225000 ක්. අන්න මගේ කාර් එකේ පෙට්ටිය තියෙනවා. මම දැන් එලියට ගිහිල්ල එන ගමන් පරණ පෙට්ටියකුත් බැලුවා. මම හිතුවා මට වැරදිලාද වර්ගය වැරදිලාද එලිය වැරදිලාද කියන එක. ඒ නිසා 225000 ක් කියන්නෙ අපේ ගම්වල මම හිතන්නෙ වීදි ලාම්පු මේ ගානට ගත්තනම් තව 50 ක් විතර සවි කරන්න තිබුනා. ඒක නිසා මම හිතනවා මේ මිලදී ගැනීමේදි කෝටේශන් ඉදිරිපත් කළා. මම කියනවා එහෙමනම් මේ තුල විශ්වාසයක් තියා ගැනීමේ හැකියාවක් නැහැ. මෙතන මේක සාමාන්‍ය දූෂණ ක්‍රියාවක් නෙවෙයි වෙලා තියෙන්නෙ. අන්න ඒක නිසා අපි සියලු දෙනාම සැලකිලිමත් වෙන්න ඕන. සැලකිලිමත් විය යුතුම කරුණක් වෙනවා. අපට වීදි ලාම්පුවක් දාගන්න ඉල්ලුවොත් තමුන්නාන්සෙ සාමාන්‍යයන් මටනම් ඉල්ලුවොත් දෙනවා. ඒකත් කියන්න ඕන. නමුත් අපි මන්ත්‍රීවරු කීසැරයක් කතා කරන්න ඕනද වීදි ලාම්පුවක් දාගන්න. තව ලාම්පු කීයක් දාන්න තිබුනද? ඒක නිසා මේ සැපයුම් අංශයෙන්, මේ ලයිට් එකෙන් බලන්න එපා. මේ ගන්න හැම සැපයුමක් තුලම රුපියලක හරි කොමිස් එකක් ගහනවයි කියන එක මම මෙතන බිය සැක නැතුව කියනවා. කවුද කියන එක මම දන්නෙ නැහැ. මේක දැන් ක්‍රියාවෙන් ඔප්පු කරල ඉවරයි. ඔබෙයි කිව්වෙ නැහැ. ඔබගේ නිහඩතාවය හෝ ඔබගේ නොසොයා නොබැලීම හෝ එහෙම නැත්නම් නොසැලකිල්ල ආයතන ප්‍රධානිය හැටියට එහෙමනම් සිද්ද වෙනවා. ඒ දෙකෙන් එකක් මොනව හරි සිද්ද වෙනවා. ඒකත් එතකොට ඔබතුමාට එනවා. ඒක නිසා මේක රුපියල් දහපාලොස් දාහක් ගැහුවනම් මම කතා කරන්නෙත් නැහැ. අනේ කමක් නැහැ කළුතර ගිහිල්ල එන්න වියදම් යනවනේද කියලා. අපි ඒක නිසා මේ පිළිබඳව සියලුම ගරු මන්ත්‍රීතුමන්ල මේක පාට පක්ෂ දේශපාලනයක් නෙවෙයි කතා කරන්නෙ. ඒ නිසා සැලකිලිමත් විය යුතුයි. මීට පස්සෙ මිලදී ගැනීම් ගන්නවනම් දැනුවත් කරන්න. අපිත් ගිහිල්ල වටපිටාව හොයනවා. දැන් ඔය කොම්පියුටර් මොනවද කැලි වගයක් කිව්වා. ඔබතුමා කියන ආයතනවලට ඔබතුමා වගේම මමත් කතා කළා. මහත්තයො මම තමයි සේරම කෝටේශන් ටික දුන්නෙ කිව්වා. මේ ඇත්ත කතාව. අපේ නෙලී මන්ත්‍රීතුමිය දන්නවා මම සමූපකාරෙ කරන කාලෙ කොමිස් ගහන කොට ඇල්ලුවෙ කොහොමද කියලා. නෙලී මන්ත්‍රීතුමියත් අපිත් එක්ක එතන සභාවෙ හිටියා. මම ඒක විග්‍රහ කරන්න යන්නෙ නැහැ. මහන්සියට කොමිස් එකක් ගත්තට කමක් නැහැ. මම ඒ දවස්වල කියන්නෙ මහනසියට කීයක් හරි ගන්න. තේ වතුරවලට වියදම යනවා. ඒක නිසා කීයක් හරි සද්ද නැතුව ගන්න. එපාම කියලම නැහැ. නමුත් ලක්ෂ ගණන් ගහන්න දෙන්නෙ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි මේ පිළිබඳව විශේෂ අවදානය යොමු කරන්න එච්චරයි. ඊලගට ඕකෙම තව වැරැද්දක් තියෙනවා. ලේකම් තුමියගෙන් මම ඇහුවා කෝටේශන් එකකට බිල ගෙව්වෙ ඇයි කියලා. ආයතනයක් බිල දෙන්නෙ නැහැ.

ඔච්චර වෙනසක් තියෙනවනම් බිලක් කඩන්නෙ නැහැ. මොකද එයා ටැක්ස් එකට වග කියන්න ඕන. ඔය බිල් පෙන්නන්න ඕන. එයාල ටැක්ස් ගෙවනවා. කෝවේශන් එකට බිල ගෙවන්න පුලුවන්ද කියලා මම දන්නෙ නැහැ. ඔඩිට් එකෙන් ආපු දාට බලා ගන්න පුලුවන්. මම ඇහුව ඔඩිට් එකෙන් බැහැ කිව්වා. මමත් මේකෙ ඉඳල ගිය නිසා තමයි කියන්නෙ. මිල ගණන් කැඳවනවයි කියන්නෙ වෙනම දෙයක් මිල ගණන් ඉවරයි අහෝසියි බිල ගෙවපු ගමන් බිලක් කඩන්න ඕන. මේ මොහොත වෙනතුරුත් බිලක් නැහැ. ගිය සභාව වෙනකම් නැහැ දැන් තියෙනවද? නැහැ ඒකයි තියෙන තත්වය. ඒක නිසා ඒ ගැන මම තවත් විග්‍රහ කරන්න යන්නෙ නැහැ. ඔය සියලු දෙනා දැනුවත් වෙන්න විතරයි මම කතා කරන්නෙ. මේ වැරැද්ද තව තවත් ගියත් මට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ සභාවෙ ඉන්න නිසා අපි මේව දැනුවත් වෙලා. මේව කතා කළ යුතු වෙනවා. එහෙමනම් ඒ පිළිබඳවත් සැලකිල්ලට ලක් කරන්න කියලා. ඒ වගේම ඉදිරියෙදි වැඩ කිරීමෙදි මීට වැඩිය ගරු සභාපතිතුමත් ලේකම් තුමියත් නිලධාරිවරුත් සැලකිලිමත් වෙන්න කියන එක මේ ගරු සභාවෙ මම කියනවා.

අද දවසෙ මම මීට වැඩිය කතා කරන්නෙ නැහැ. මම කොරෝනා ගැන කතා කරන්නෙ නැහැ. කොරෝනා සමයේ රුපියල් 5000 ලබා දීම කාට දුන්නත් සුදුසු හෝ නොසුදුසු වේවා ව්‍යසනයට පත් වෙච්ච වෙලාවක රාජ්‍ය සේවකයද එහෙම නැත්නම් ගොවියෙක්ද කියන එක මම නම් බලන්නෙ නැහැ. මම බැලුවෙ දීල තියෙනවනම් ප්‍රශ්නයක් නැහැ. මම පාට බැලුවෙ නැහැ. එතන වැරැද්ද කළේ දේශපාලන අධිකාරියේ එක්තරා පක්ෂයකින් විතරක් සම්බන්ධ වෙච්ච එක. නැත්නම් ඉතාම පිරිසිදු වෙනවා. මහජන නියෝජිතයො හැටියට අපට තියෙන වරප්‍රසාදෙ පාට පක්ෂ බලන්නෙ නැතුව කවුරුත් එතන හිටියනම් විනිවිද භාවයෙන් යුතුව ඒ කටයුත්ත කළා නම් මේ චෝදනාවත් එන්නෙ නැහැ. අද පුවත් පත් දිහා බලන කොට අද රූපවාහිනී යන්ත්‍රය දිහා බලන කොට ඇනගන්නවා. කොටා ගන්නවා. රංඩු වෙනවා. දකින්න ඇති මේ සියලු දෙනාම. අද එහෙමනම් නාගොඩ ප්‍රදේශයේ වෙච්ච සිද්දියත් එක්ක දේශපාලන හස්තය තනිකරම ක්‍රියාත්මක නොකර සියලුම පාට පක්ෂ නොබල ඒක ඒ කමිටුව ඒ විදිහට ක්‍රියාත්මක වුනානම් මම හිතනවා මීටත් වඩා ආදර්ශමත් වෙනවයි කියලා. ඒ පිළිබඳවත් මතක් කරමින් අපි හිතනවා කොරෝනා වසංගතය මේ මොහොත වෙන කොට දුරුවෙමින් තියෙනවා. ඊලගට ඒක දුරුවීම අපි ප්‍රාර්ථනා කරනවා. මම හිතන්නෙ තව මාසයක් දෙකක් යන කොට සදහටම දුරුවෙන්න කියලා. එහෙමනම් මේ මොහොත වෙනකොට සියලු දෙනාටම ජීවත්වීමේ අමාරුවක් තියෙනවා. ඊයෙ සැමන් ඉවරයි 65 හේ පරිප්පු ඉවරයි සියලුම කුළු බඩු වර්ග අධික මිල ගණනන්වලට ගිහිල්ල තියෙනවා. මේවා මිල යන කොට ඒක ඒ බර කාටද? බැරිබර කරේ තියන් අපට තමයි මේක අදින්න වෙන්නෙ. වෙන රටවල්වල බලන කොට හොඳෙයි නරකෙයි කියන්නෙ නැහැ. මේකෙ ලිමිට් එකක් ඇතුව පාලනය වුනා. මීට එහා ගියානම් අද මේ මොහොත වෙනකොට කොරෝනා ගේන්වනවනෙ. දැන් විදේශ රටවල්වල තියෙන සියලු කොරෝනා මෙහේ එනවා. ඒක නිසා හෙට දවස ගැන මට කතා කරන්න බැහැ. වැඩපිළිවෙලක් හොඳට කළානම් අපි හොඳෙයි කියන්න පැකිලෙන්නෙ නැහැ. තමුන්නාන්සෙලගෙ ජනාධිපති වරයා හොඳ තීන්දුවක් අරගෙන තියෙනවා. අපි නිර්භයව කතා කරනවා මොකක්ද? අපි ඕව මීට කලින් කතා කළා. හිරගෙදරවල්වල ඉඳගෙන අර වැරදි කාරයො ඇතුලෙ ඉඳගෙන කරපු අන්න ඒව මර්ධනය කරනව නම් ඒක ඇත්තටම අපි අගය කරනවා. අපි ඒකට කතා කරන්න පැකිලෙන්නෙ නැහැ. ඒක වැදගත් දෙයක් මේ රටේ සියලු දෙනාම බලාපොරොත්තු වුනා. පාතාලය ඉවර විය යුතුයි. ඒවට අපි අපේ පූර්ණ සහයෝගය දෙනවා. එහෙමනම් ඉදිරියෙදි අනිත් වැඩවලට සහය ගන්නත් දේශපාලන වශයෙන් හෙට අනිද්දා මම හිතන්නෙ මැතිවරණයකට මුහුණ දෙන්න සිද්ද වේවි. එතනදි ඒ පිළිබඳව ජනතාව උත්තර දේවි. ඒක නිසා මීට වැඩිය මම කාලය ගන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම විශේෂයෙන්ම යොමු කෙරුවා. සභාවේ මොනවා හෝ යම් කොතනක හෝ දුර්වල තැනක් තියෙනවා. කොතනක හෝ දූෂිත ක්‍රියාවක් සිද්ද වෙනවා. සභාපතිවරයාගේ සහ විශේෂයෙන් ලේකම් තුමියගේ අවධානය මීට වැඩිය යොමු කළ යුතුමයි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. තමුන්නාන්සෙල සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම**

අපේ සහබන්දු මන්ත්‍රීතුමාගෙ ප්‍රකාශයට මම උත්තර දෙන්න ඕන. වීථි පහන් ගෙන ඒමේදී ,ඒ කටයුතු සිද්ද වුනේ. ජනාධිපතිතුමා උඩුගමට එන කාලවකවානුව තුල මේ විදුලි ලාම්පු ගන්න ඕන කියලා අපේ යෝජනාවකුත් තිබුනා. අපට ක්ෂණිකව ගන්න ඕන නිසා. මම ගාල්ලෙදි මේ විදුලි ලාම්පු දැකපු නිසා. නගරධිපතිතුමාට කතා කළා. නගරාධිපතිතුමා තමයි කිව්වෙ. අපි ගන්නෙ මෙන්න මේ ස්ථානයෙන් කියලා. ඒ විශ්වාසය තුල එම ස්ථානයට කතා කරලා අපි ලාම්පු 50 ක් ගත්තෙ. මට පසුව ඔබතුමා කියපු ඔය ස්ථානයේ ලයිට් එක සවි කරද්දි, එයාල අපෙන් දාල ඉල්ලුවා. මම කිව්වා අපිට බඩු නැත කියලා. එයාලා ගෙනත් තියෙනවා කිව්වා. මම විස්තර ඇහුවම ඔය ගණන කිව්වා. මට ඇත්තටම අවංකවම හීන් දාඩිය දැම්මා. මට හිතුනා අපරාද නේද කියලා. එතකොට අපි කරල ඉවරයි. මෙතන කිසිම වංචාවක් අපෙන් සිදු වුනේ නැහැ. ඒ විදිහට තමයි ඕඩර් කරල අපි විදුලි ලාම්පු ගත්තෙ. අපි දැන් කොළඹ ගියාම බිස්නස් කාරයො එක එක තැන්වල එක එක ගණන් කියනවා. ගරු මන්ත්‍රීතුමනි, මම දැන් ලේකම්තුමියගෙන් ඇහුවා මුදල් ගෙවීම සම්බන්ධව මුදල් ගෙවීම නීත්‍යානුකූලයි කියනවා. ඔබතුමා කියන නීති විරෝධීභාවය මම දන්නෙ නැහැ. නමුත් හරි ක්‍රමවේදෙට තමයි අපි ගිහිල්ල තියෙන්නෙ. ඇත්ත කතාව මම දෙයක් ගන්න ගියාම හැමතැනින්ම සොයල අඩුම තැනින් තමයි බලන්නෙ. ඊලගට ඒ ගන්න කොටත් මේවටත් TO වාර්තා ඉංජිනේරු වාර්තා ගන්න ඕන. මොකද මේවයි තාක්ෂණය, වගකීම් කාලය, ලූමන් ගණන වගේ දෙවල් තියෙනවා. ඒ ආකාරයෙන් තමයි ප්‍රසම්පාදන කමිටු වගේ ඒ කටයුතු සිදු කළේ. නමුත් ඇත්තටම මට පසුව හිතට කණගාටුවක් ආවා. මෙච්චර තියෙද්දි ඇයි අපට මෙහෙන් හොයා ගන්න බැරි වුනේ කියලා. එතකොට අපේ වැඩ ටික ගිහිල්ල ඉවරයි. මේ කියන ආකාරයට මෙතන 4750 ක වෙනසක් විශාල පාඩුවක් සභාවට වෙනවා. නමුත් අපි වංචා කරල නෙවෙයි.

පසුගිය දවස්වල ප්‍රාදේශීය සභා මාර්ගවල ඩයලොග් ආයතනයෙන් කණු වගයක් සවි කළා කොන්ත්‍රාත්කරු මට කිව්වෙ එක කණුවකට රු. 2500.00 බැගින් සභාවට මුදල් ගෙවනවා කියලා. නමුත් මට ආරංචි වුණා. රු. 5000.00 ක් වැනි මුදලක් එම ආයතනයෙන් ගෙවනවා කියලා. රු. 2500.00 ක් සභාවට ගෙවලා, රු. 2500.00 ක් සාක්කුවෙ දමාගන්න මට හැකියාව තිබුනා. කණු 161 ක් වෙනුවෙන් මුදල එකතු කරලා බලන්න. රු. 402500.00 ක් වෙනවා. මම මේ සඳහා අවසර දුන්නෙ සභාවෙ අනුමැතිය අරගෙන. ඒ මුදල්වලින් තමයි ආදාහනාගාරයට යන පාර කපන්න යන්නෙ. ඒ වගේම මට ලැබෙන දීමනාවත් නොගත්ත මම එය පසුගිය සභාවලදී ඒ සියළු දීමනා පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව සඳහා යෙදෙව්වා. අද මම ඒ ගැන සතුටු වෙනවා. නමුත් දැන් නම් ඒ කර්තව්‍ය කිරීමට අපහසුයි. වියදම අධිකයි. ඒ වුනාට මම අනිසි මුදල් රැස් කිරීම් නොකරමි. සභාපති හැටියට මට වගකීමක් තියෙනවා ඒකයි මම උත්තර දෙන්නෙ. මමත් 2002 ඉදල මේ සභාවෙ ඉන්නවා. අපිත් වුන දේවල් සහ වෙන දේවල් හැමදේම දන්නවා. ඒක නිසා මේ කටයුතුවලදි මම හරි ප්‍රවේසමෙන් ඉන්නෙ. මොකද මම කැමති නැහැ ඒවට. ඒකයි මම මේ ප්‍රසිද්දියෙ කතා කරන්නෙ. නැත්නම් මටත් ඕනම දෙයක් කරන්න පුලුවන්. නමුත් අපි ඒවට යොමු වෙන්නෙ නැහැ. මොකද හේතුව මම 2002 මේ සභාවට එනකොට යම් දෙයක් හිතාගෙන ආවෙ. ඒක නිසා යම් වැරදි වැටහීමක් තියෙනවනම් ඒක කරුණා කරල අස්කර ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම නන්දන මන්ත්‍රීතුමා, ඩයලොග් කනු පිළිබඳව ගිවිසුම් පත්‍රය තියෙනවා. එහි කොන්දේසි තියෙන්නෙ දුරකථන කනු සවිකිරීම මගින් මාර්ගයන්ට සිදුවෙන අලාභහානි නැවත යථා තත්වයට පත් කිරීම සිදු කළ යුතුය. දුරකතන කනු සවිකිරීම සිදුකළ යුත්තේ මාර්ගයේ වාහනවලට හා මගීන්ගේ ගමනාගමනයට බාධා සහ වෙනත් මහජන පීඩා නොවන ලෙසය. ඉදිරි අනාගතයේදී මාර්ගයක් පුළුල් කරන අවස්ථාවකදී සවිකරන ලද කනු කොන්දේසි විරහිතව ගලවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. හදිසි තත්වයකදී කනු හා වයර් කඩා වැටීම් හැකි ඉක්මනින් ඉවත්කොට ගමනාගමනයට ඇතිවන බාධා ඉවත් කළ යුතුය. එසේම එවැනි තත්වවලදී සිදුවන අලාභහානිවලට වග වීමට බැඳී සිටිය යුතුය. අන්න ඒ ටික තමයි අපේ කොන්දේසි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පළමුවෙන්ම මම අපේ කොට්ඨාසය නියෝජනය කළ මන්ත්‍රීවරියක් හැටියට අරුණ ශාන්ති බෝදරගම මහත්මිය සභාවෙ මන්ත්‍රී ධූරයෙන් සමුගන්නවයි කියලා දැනගන්න ලැබුනා. ඒ වගේම මට පොඩ්ඩක් එන්න පරක්කු වුනා.ඒ වෙනුවෙන් මම සමාව භජනය කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ නිසා සභාපතිතුමා සහ සහෝදර මන්ත්‍රීමණ්ඩලය අපහසුතාවයට පත්වුනානම් සමාව ඉල්ලා සිටිමින්, මගේ කොට්ඨාසයේ මාත් සමග එක්සත් ජාතික පෙරමුණෙන් තරග වැදිලා එතුමිය මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන්ම තෝරාපත්කරගෙන අපේ සභාවට යොමු කළා. ඇත්තටම අපි එකමුතුව වැඩකටයුතු කරගෙන යද්දි එතුමිය මට ලොකු හයියක් වුනා. පහුගිය දවස්වල රු. 5000 දීමනාවටත් මම එතුමියට ආරාධනා කළා. එතුමියත් එන්න පුලුවන් වෙලාවට ඇවිල්ල අඩුපාඩු තියෙන තැන් හොයලා බලල මටත් දුරකතනෙන් කතා කරල කිව්වාම ඒක නිවැරදි කරන්න මම කටයුතු කළා. ඒ වගේම අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්ව වගේම පසුගිය කාලයේ එතුමිය ඉදිරිපත් කරපු යෝජනා ඉතාමත්ම ඕනෑකමින් තමන්ගෙ හදවතින්ම කරපු යෝජනා හැටියට මම දකිනවා. ඒ වගේම අපි යම් දෙයක් කළාම, මම වැඩක් කළාම එතුමිය සහ එතුමියගෙ මහත්මය ඒක පැසසුමට ලක් කරල කතා කරපු තැන් බොහොමයි. ඉතිං මම සභාවෙ මන්ත්‍රීවරයෙක් හැටියට මුල සිටම අප සමග වැඩ කරලා ඔබ කරපු සේවාව මම ඉතාමත්ම අගය කොට සලකමින් ඔබගේ තීරණය ඔබ සතුයි. ඔබගේ නිහතමානීකමට මම ඉතාම ගරු කරනවා. එහෙමනම් ඔබට නැවතත් අප සමග යම් දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් ප්‍රදේශයට සේවය කරන්න ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා කියල මම ප්‍රාර්ථනා කරනවා. ඔබට මම කරපු සේවයට ස්තූතිවන්ත වෙනවා.

ඒ වගේම පොල පිළිබඳව කතා වුනා. ගරු සභාපතිතුමනි, මම පොලේ කාලයක් ව්‍යාපාර කටයුතු කළා. ඉතිං ඒක නිසා මම දකින්නෙ ඕක ගැටලුවක් වෙන්නෙ. දැන් මේ අපේ පොල වැහිච්ච නිසා. මොකද වෙනදටත් ගල්ලිද හංදියට වෙනකම් පොල කාසි එකතු කරනවා. උදේ පාන්දර කෙසෙල් කැන්ටික අරන් යන අය ඒව විකුනන්නෙ ගලලිද හංදියෙ. පොලකාසි එකතු කරන්න ගැටලුවක් වුනේ නැහැ හැබැයි දැන් මේකෙ අවදානමක් තියෙනවා. නැත්තෙ නැහැ. මොකද ඉස්සර කාලෙ සභාවෙ ගොඩනැගිලි කීපයක් අරගෙන තියෙනවා. ඔබතුමාගෙ කාලෙ නෙවෙයි. මේ සභාවෙ කතා කරන ඒවා ඔබතුමාට කරන චෝදනා නෙවෙයි. ඒක මේ කාලීනව ආපු දේවල් අපි විසඳ ගන්න ඕන. අද දවසෙ කතාවලට විතරයි. ඔබතුමා නායක වෙලා ඉන්නෙ. ඒක නිසා ඔබතුමාට කියන ඒව නෙවෙයි. ඒ බැංකු දෙක එම ස්ථානයට ගෙනියපු එක අපට ඉතාම අවාසනාවන්ත සිද්දියක්. ඒ කාලෙ හිටපු පාලන අධිකාරිය විසින් ඒක අපේ ප්‍රදේශයේම තියාගන්න උනන්දු වුනානම් හොදයි, මොකද තල්ගස්වල වත්ත තිබුනා. ඒ කාලෙ වත්ත පවරගෙන දුන්න නම් අපට තල්ගස්වල වත්තෙ බැංකු ගොඩනැගිල්ල හොදට සකස් කරගන්න තිබුනා. මොකද ඒ වගේ ඕන තරම් මේ තල්ගස්වල වත්තෙ ඉඩම් පවර ගන්නවා. ඒ වගේ කැප කිරීමක් කළානම් අපට මේ බැංකු ගොඩනැගිලි දෙකත් ලබා ගන්න තිබුනා. මේ පොල කාසි එකතු කරන පුද්ගලයා තල්ගස්වල මෙහා පැත්තෙ පොල තිබුනට ඔය ඇලෙන් එගොඩට ගිහිල්ලා ඕනතරම් පොල කාසි එකතු කරගෙන ආවා. සභාවේ අවසරයක් ඇතුව නෙවෙයි ඒක කළේ. ඒක නිසා ඉදිරියෙදිත් අපට ඒ වැඩකටයුතු බාධාවකින් තොරව කරගෙන යන්න ඒ සභාපතිතුමන් එක්ක කතා කරෝ අපේ පොල ඉක්මනට විවෘත්ත කරන්න කටයුතු කරන්න. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්ව වගේ මම වුනත් කැමති නැහැ රුපියලේ දෙකේ වාසියට පාරෙන් ඇතුලට යන්න. අපි පහුගිය කාලෙ පොල ඇතුලට තල්ලු කරන්න උත්සාහ ගත්තා. ඒක තුලත් ලොකු හානියක් වුනයි කියන එක අපි දන්නවා. පොල දවසට විතරක් පොඩ්ඩක් මාර්ගය අවහිර වෙනවා. අපට ඕනනම් පුලුවන් විකල්ප මාර්ගයක් තියෙනවා ඔතනින් යන්න. ඒක පොඩ්ඩක් හදල හොදට අලුත් වැඩියා කරල දුන්න නම්, පොල මගහැරල යන්න ඕන කෙනෙකුට යන්න පුලුවන්. ඒ පිළිදබව අවදානය යොමු කරල පොල ශක්තිමත් කර ගන්න. මොකද වැඩිම ආදායමක් ආපු තැන හැටියට තමයි අපි තල්ගස්වල පොල දකින්නෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි පහුගිය කාලෙ කුඹුරු අස්වැද්දීම පිළිබඳව සිහිපත් කරන්න ඕන. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනක් කළා. එතුමන් මැදිහත්වෙලා නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා දීපු කෘෂි කර්ම දෙපාර්තමේන්තුව සමබන්ධ වෙච්ච බිත්තර වී ටික අරගෙන අවශ්‍ය කරන පොහොර ටික ලබා දී ාල වප් මගුල් උත්සවයක් පැවැත්වූවා. අපි ඒ සම්බන්ධව එතුමාට ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මම එතුමාගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න ඕන. එතුමා ඊට සතියකට පස්සෙ මාධ්‍ය වැඩසටහනක් තියල මොකක්ද කිව්වෙ? එතුමා ඒ වැඩසටහනේදි කියනවා. කුඹුරු වගා කරල බලාගෙන ඉන්නවා පොහොර නැහැ කියලා. ඒ වෙනකොට ඔබගේ කොට්ඨාසයේ කුඹුරු ගොවිතැනට පොහොර ලැබිල තිබුනද? නැද්ද? නැතිවෙන්න බැහැ. ඔබට බිත්තර වී සහ පොහොර නිකුත් කරපු කාල වකවානු එක්ක ඉදිරිපත් කරන්න මට පුලුවන්. නමුත් මන්ත්‍රීතුමනි, ඔබතුමා ගිහිල්ලා ඒ වැඩසටහන තියන කොට ඩීඕ මිස් ඉන්නවා මම සාක්ෂි දරනවා ඔබතුමාගෙ උත්සවයෙදි ඔබතුමාට පොහොර අපි ලබා දීලා තිබුනා. එහෙම තියෙද්දි ඔබතුමා කියනවා ඔබතුමා කතා කළ නිසයි පොහොර ටික ගත්තෙ කියලා. එදා වෙන කොට මම රමේෂ් පතිරණ අමාත්‍යතුමාට දුරකතනෙන් කතා කරල මේ ප්‍රදේශයේ තියෙන ගැටලු ටික කිව්වා. ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මේ ප්‍රදේශයට අපි පොහොර ඉල්ලුම් කළේ අක්කර 200 කට. අක්කර 200 කට පොහොර ඉල්ලන්න හේතුව අක්කර 400 යි මහ කන්නයේ වගා කරල තිබුනෙ. යල සහ මහ කියල කන්න දෙකක් තියෙනවා. ඉතාහාසෙ ඉදලම මහ කන්නය වගා කළත් යල කන්නය වගා කරන්නෙ නැහැ පුරන් වෙනවා. මහ කන්නය අක්කර 400 ක් වගා කළත් යල කන්නය ගොඩක් දුරට පුරන් වෙන නිසා අපි යල කන්නය සදහා පොහොර ගෙන්වන්නෙ සහ අවශ්‍ය ප්‍රතිපාදන සකසා ගන්නෙ අක්කර 200 කටයි. ඒ වගේම අපේ ගොවිජන මධ්‍යස්ථායේ පොහොර ගබඩාවක් ලොකුවට නැහැ. සුලුතර පොහොර ගබඩාවක් අපට තියෙන්නෙ. ඒකෙ අක්කර 400 කට අවශ්‍ය පොහොර ගබඩා කර ගැනීමේ හැකියාවකුත් නැහැ. අපි ඉල්ලුම් කරන්නෙත් නැහැ. ඉල්ලුම් නොකරන හේතුව අක්කර 200 කට වැඩි පොහොර ගෙනැල්ල තියා ගැනීමේ හැකියාවක් නැහැ පොහොර දිය වෙලා යනවා. ඒක නිසා අපි අක්කර 200 කට පොහොර ඉල්ලුවෙ අක්කර 200 යයි යල කන්නෙ වෙනද වගා වෙන්නෙ. මේ කොරෝනා වෛරසය ඇවිල්ල මේ රටේ යම්කිසි පෙරලිකාර ගමනකට ගොවි ජනතාව පෙළඹිල මගේ ගොවිජන සේවා බල ප්‍රදේශයේ අකර 875 ක් වගා කරල තියෙනවා. එතකොට ඊට පෙර කන්නයේ වගා කරල තිබුනෙ අක්කර 400 යි නම් තව අක්කර 475 ක්ම පුරන් කුඹුරු අස්වද්දල තියෙනවා.ඒ පුරන් කුඹුරු අස්වද්දද්දි පොඩි ගැටලුවක් ආවා. ඒ වෙද්දි ඔබතුමත් අරගත්ත, බිත්තර වී ආවෙ කොහොමද කියලා ඔබතුමත් දන්නෙ නැතුව ඇති. ඔබතුමන්ලගෙ උත්සවේදි ඒක සඳහන් කළේ නැති වුනාට ඒක ඒ ආයතනයෙන් ඔබතුමන්ලම ගෙනාපු විදිහට කත කළාට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කරපු කැප කිරීමට මම සතුටු වෙනවා. මොකද තව මන්ත්‍රීවරු හිටිද්දි හරි ඔබතුමා එහෙම දෙයක් කරන්න ධෛර්යය ගත්ත එකට කරපු කැප කිරීමට මම සතුටු වෙනවා. හැබැයි මනත්‍රීතුමනි, බිත්තර වී අපට ලැබෙන්නෙ දකුණු පළාත් කෘෂි කර්ම අමාත්‍යාංශයෙන්. අපි පුරන් කුඹුරු අක්කර 100 කට බිත්තර වී ඉල්ලුම් කරලා තිබුනා. නමුත් ගරු සභාපතිතුමනි, අක්කර 100 දෙන්න අපට කෙනෙක් හිටියෙ නැහැ. දෙන්න කෙනෙක් නැතුව මම අක්කර 20 කට ගත්තා. මොකද අපි ඉල්ලපු එකක් ආවම කරන්න දෙයක් නැති කමට මම මගේ කොට්ඨාසෙ පුසසැල්ලකාර ගමේ කුඹුරක් වගා කරන්න හිතාගෙන අක්කර 20 කට විතරයි මම ඉල්ලල තිබුනෙ. ඊට පස්සෙ මලාමුර ප්‍රදේශයේ යම් ගැටලුවක් ආවා. ඒ සම්බන්දව ධනපාල මහත්මා මැදිහත් වෙලා අක්කර 30 කට වගේ බිත්තර වී ඉල්ලල තිබුනා. ඒ ඇර අනිත් ටික කවුරුවත් ඉල්ලල තිබුනෙ නැහැ. හැබැයි පස්සෙ මේ කොරෝනා වසංගතයත් එක්ක කෘෂි කර්ම පෙරලියත් එක්ක මිනිස්සු වගා කිරීමට පෙළඹීමත් එක්ක අක්කර 190 කට අපි බිත්තර වී ලබා දීලා තියෙනවා. පුරන් කුඹුරු අස්වැද්දීම සදහා ඒ අතරෙ ගැටලු ආවා අපහසුතාවයන්ට පත් වුනා. නමුත් අපි බලාපොරොත්තු නොවුන විදිහට නැවත නැවත ඉල්ලුම් කරලා අක්කර 190 කට ගන්න පුලුවන් වුනා. ඒ අතරෙ අපට දෙන්න බැරි වුන පුරන් කුඹුරු අක්කර 50 ක් තියෙනවා. දෙන්නම් කියලා පසුව පොරොන්දු වෙලා නමුත් දෙන්න බැරි වුනා. ඉතිං අපි සතුටු වෙනවා. අක්කර 875 කට පොහොර ලබා දීමේ හැකියාව ලැබුනේ, ගරු මන්ත්‍රීතුමනි

ඔබතුමත් සතුටු වෙන්න ඔබතුමත් කතා කළානම්. කොහොම හරි දෙන්නම කතා කරල හරි අපි මේ ප්‍රදේශයට පොහොර අඩුවෙන් දුන්නෙ නැහැ. අපට ලබාදීල තියෙන නිර්නායකටයන් තුල දෙන්න පුලුවන් සියලුම පොහොර අපි නාගොඩ ගොවිජන බල ප්‍රදේශයේ, ඌරල ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ ප්‍රදේශයේ නැති වුනාට අනිත් ප්‍රදේශවලට පොහොර ලබා දුන්නා. අක්කරයකට ඉස්සර යූරියා කිලෝ 40 ක් දුන්නා. මේ පාර පොඩ්ඩක් අඩු කරලා ඒ වෙනුවට දියර පොහොරක් අපි ලබා දීල තියෙනවා. මේ පාර අක්කරයකට යූරියා කිලෝ 38 යි දීල තියෙන්නෙ. ටී එස් පී එක10 යි. එම් ඕ පී 14 යි ගිය පාර දුන්නෙ ටී එස් පී එක 26 යි එම් ඕ පී 38 යි යූරියා 40 යි. මේ මිශ්‍රය මේ පාර අඩු කරලා ඒ වෙනුවට දියර පොහොර එකක් දීල තියෙනවා. දියර පොහොර එක පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශය දනුවත් වෙලත් නැහැ. කොහෙන් ආවද කියලා දන්නෙත් නැහැ. ඒක පිළිබඳව පොඩි ගැටලුවක් අපට තියෙනවා. මොකද ගොවි මහත්වරු නැවත ඒ දියර පොහොර එක ගහන්න කොච්චර වියදම් කරන්න ඕනද? හැමෝටම ටැංකියක් නැහැ. එතකොට අපි ටැංකියක් ගෙන්න ගන්න ඕන. වෙලේ හැම තැනම බැහැල ඇවිදින්න බැහැ. පවර් මැෂින් එකකින් ගහන්න ඕන. ඒ පිළිබඳව පොඩි ගැටලුවක් ඇවිල්ලා තියෙනවා. නමුත් රමේෂ් පතිරණ ඇමතිතුමාගේ මැදිහත් වීම තුල නිර්දේශ කරන ලද දිය යුතු ප්‍රමාණය අවශ්‍යතාවය අනුව නාගොඩ ගොවි ජන බල ප්‍රදේශයේ ලබා දීමට මට හැකියාව ලැබුනා. ඔබතුමත් කතා කරන්න ඇති ඒ ගැන මම සතුටට පත් වෙනවා. ඒක අපි දකිනවානෙ මෙහෙම පොලීසියෙ ලොකු මහත්තයට කතා කරල විසඳගන්න පුලුවන් ප්‍රශ්නෙ සමහර විට පීසී කෙනෙකුටත් පුලුවන්. ඔබතුමා පීසීට කතා කරනවා. මම ලොකු මහත්තයට කතා කරනවා. කොහොම හරි ප්‍රශ්නෙ විසඳිලා තියෙනවා. ඒක නිසා පොහොර ටික අපේ ප්‍රදේශයට ආවා. ඒ ආවෙනම් මම දන්නෙ මම ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාට කතා කරපු නිසා. මම සතුටට පත්වෙනවා. කොහොම වුනත් කමක් නැහැ. මේ ප්‍රදේශයේ වගා කටයුතු කිරීමෙදි දක්වපු සහයෝගයට ඔබතුමාට මම ස්තුති වන්ත වෙනවා. නමුත් අර වගේ ප්‍රකාශ කරද්දි පොඩ්ඩක් හිතල බලන්න. මමත් එතනට ගිහින් හිටියා. මටත් ඒ උත්සවයට ආරාධනා ලැබුනා. ඔබතුමා මෙතනදි ප්‍රසිද්ධියෙ ආරාධනා කළා. සභාපතිතුමා නැවතත් මට ආරාධනා කළා. මන්ත්‍රීවරයෙක් හැටියට නෙවෙයි ගොවිජන සේවා එකේ සභාපතිවරයා හැටියට සහභාගි වුනේ. ඔබතුමාට යම් ගැටලුවක් වුනානම් අමනාප තියා ගන්න එපා. හැබැයි ඔබතුමන්ලා මාධ්‍ය තුලට හිගිල්ලා අර වගේ ප්‍රකාශ කරද්දි මේ ප්‍රදේශයටම පොහොර නැති වගේ තමයි කතා කළේ. නමුත් ගොවිජන සේවා එකේ මේ ප්‍රදේශයේ වගකිව යුත්තා හැටියට මම ආඩම්බරයෙන් කියන්නෙ. අපි පොහොර ටික ලබා දුන්නා කියන එක ඔබ හිතේ තබා ගන්න.

ඊලගට රුපියල් 5000 ලබා දීම පිළිබඳව කතිකා වුනා. අපේ ගරු වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමත් ඉන්නවා. මම හිතන්නෙ අපේ ප්‍රදේශයේ ගැටලුවක් තිබුනනම් මට එතුමත් කතා කරල අහපු කීපයක් තිබුනා. ඒව ඒ වෙනකොට ලබා දීල තිබුනා. එතුමත් ඇහුවා මන්ත්‍රීතුමා මේක ලැබුනද කියලා. ඒ පිළිබඳ අපේ ප්‍රදේශයේ ගැටලුවක් නැහැ. මන්ත්‍රීතුමියත් සාකච්ඡා කළා. මට මතකයි අපේ විපක්ෂ නායක සහබන්දු මන්ත්‍රීතුමා ඔබතුමාලගෙ ආණ්ඩු කාලේ සමෘද්ධිය ලබා දීමෙදි ඔබතුමා කිව්වා. කොහෙද? කෙහෙවත් සමෘද්ධිය ලැබිල නැති තැනක් තියෙනව නම් කියන්න. මම හෙටම ඒක විසඳනවා කියල ඔබතුමා මෙතනදි ප්‍රකාශ කළා. එතකොට අපට උත්තර දෙන්න කාලයක් ආවෙ නැහැ. ඔබතුමාලගෙ ආණ්ඩව නැති වුනා. දැන් ඉතිං කරන්න දෙයක් නැහැ. හැබැයි අපි තවම බලයේ ඉන්නවා. ඒ නිසා අපේ ප්‍රදේශයේ අපේ කොට්ඨාසෙ රුපියල් 5000 ලබා දීමෙදි කොහේ හරි අක්‍රමිකතාවක් වෙලා තියෙනවනම් මම ඒ රුපියල් 5000 අතින් හරි දෙනවා. හැබැයි අපට එවපු නිර්නායක තියෙනවා. ඒතුල අපි කිසිම ගැටලුවක් ඇති කර ගත්තෙ නැහැ. මගේ කොට්ඨාසෙ මන්ත්‍රීවරු ටික මගේ කොට්ඨාසෙ ඉන්න නිලධාරී හතර දෙනා කැපවීමෙන් ඒක බෙදන්න ඕන විදිහට මාත් සමග එකතු වෙලා ඒ සියල්ලම කරල තියෙනවා. ඒ නිසා මගේ කොට්ඨාසෙ ගැටලුවක් ආවොත් ඒ රුපියල් 5000 හ රජයෙන් දෙන්න බැරි වුනොත් අතින් හරි දෙනවා. හැබැයි ඔබතුමන්ලගෙ සමෘද්ධිය ලබා දීමෙදිනම් ලොකු අක්‍රමිකතා සිදුවුනා. ඔබතුමන්ලගෙ පාලන කාලය අවසන් වුන නිසා අපට ඒව විසඳ ගන්න බැරි වුනා. සහබන්දු මන්ත්‍රීතුමා ගැන මම සතුටු වෙනවා අපේ ජනාධිපතිතුමා ගැන සිහිපත් කරලා හොඳ දේ අගයට ලක් කළා. ඒ ගැන අපි සතුටට පත් වෙනවා. ඉතිං

අපි හොද දෙයක් කරන්නෙ. ඔබතුමන්ලත් එන්න ඕව දමල ගහල දෙකට කැඩිල තියෙන්නෙ. අපිත් එක්ක හොද ගමනක් යමු කියල ඉල්ලීමක් කරමින් සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන්ම අවසරයි. අපිත් එක්කම අපේ වසමෙම පදිංචි අරුණ ශාන්ති බෝදරගමගේ මන්ත්‍රීතුමිය අද දින සභාවෙන් ඉවත් වෙන බව දැනුම් දුන්නා. ඉතිං ඇත්තටම එතුමිය ගැන අපේ නන්දන මන්ත්‍රීතුමා අනිත් මන්ත්‍රීවරු ප්‍රකාශ කළා වගේ යමක් ප්‍රකාශ කරන්න ඕන. එතුමිය ඉතාමත් අවංකවම මේ ජනතා සේවයට කැපවෙලා තමන්ගේ කාල සීමාව තුල අවුරුදු දෙකකට වැඩි කාලයක් ඉතාමත් අවංකව තමන්ගෙ කටයුත්ත සභාව වෙනුවෙන් සහ ඒ ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් ඉටු කළා කියන එක මම ඉතාම සතුටින් කියනවා. වෙනත් පක්ෂයක වුනත් අපි ඉතාම සතුටින් කියනවා. මොකද එතුමියගෙ පක්ෂයේ නියෝජ්‍ය ලේකම්තුමා මගේ බොහොම හිතවත් මහත්මයෙක්. එතුමා මට පුද්ගලිකව කිව්වා. එතුමන්ගෙ පක්ෂයේ ලංකාවෙ ඉන්න ක්‍රියාකාරීම මන්ත්‍රීවරිය කියලා. ඇත්තටම එතුමිය අපේ සභාවට පත් කරල එවීම ගැන සතුටට පත්වෙනවා. එතුමියගේ සේවයත් අගය කරනවා. එතුමිය ඉදිරියේදී යම් තීරණයක් ගනීවි. එතුමිය එතුමියගෙ නායකයන් දෙපොල ගැනත් කතා කළා. ඉදිරියේදී එතුමියගෙ සහයෝගය මේ ප්‍රාදේශීය සභාවෙ මහජනතාව වෙනුවෙන් එතුමියට හැකි ආකාරයෙන් කරන්න කැපවෙන බව එතුමිය ප්‍රකාශ කළා. මේ වෙලාවෙ එතුමියට අපගේ සුභ පැතුම් එකතු කරනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීතුමනි, අපේ විලේගේ මන්ත්‍රීතුමත් වචනයක් කතා කළා. මම දෙපැත්තක නෙවෙයි. මම ඉන්නෙ එක පැත්තෙ. ඒක කවුරුත් දන්නවා. මම 2011 මහජන ඡන්දයෙන් ප්‍රාදේශීය සභාවට පත්වෙච්ච මන්ත්‍රීවරයෙක් විදිහට සහ එක්සත් ජාතික පක්ෂෙන් පත්කරපු මන්ත්‍රීවරයෙක් විදිහට මම අද වෙනකම් පක්ෂය නියෝජනය කරමින් කටයුතු කරනවා. ඒක මේ විපක්ෂ නායකතුමා ඇතුලු සියලුම දෙනා දන්නවා. ප්‍රසිද්ධියෙ ඒ බව මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා.

ඒ වගේම පහුගිය කොරෝනා වසංගත සමයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා රුපියල් 5000 දීමනාව දීමෙදි තමන් දක්වපු දායකත්වය සහ මෙච්චර ගණනක් දුන්නා. තමන් සහ මේ රජයේ කටයුත්ත සහ ඒක සමෘද්ධියත් එක්ක සංසංදනය කරල තවත් කතා කළා. විශේෂයෙන්ම කියන්න ඕන. අපි ආණ්ඩුවක් නැතුව මේ වෙලාවෙ පහු ගිය මාස දෙක තුන ඇතුලත අපට පුලුවන් ආකාරයෙන් පුද්ගලිකව ඒ වගේම අපේ පුද්ගලික සමිති සමාගම් හරහා බල ප්‍රදේශයේ යම් යම් පොදු කටයුතු, පුද්ගලික කටයුතු වගේම ඒ ආධාර බෙදා දීමේ කටයුතුවලට සම්බන්ධ වෙන්න හැකියාව ලැබුනා. ඒක සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ අපට පහර ගැසීමකුත් කරල තිබුනා. මම ඒ ගැන කණගාටු වෙන්නෙ නැහැ. ඒක ඉතිං අපි මොනවා හරි කරපු හින්ද තමයි එහෙම වුනේ. අපට පුලුවන් ආකාරයෙන් රජයක් නැතුවත් ප්‍රාදේශීය සභාවෙන් හරි කිසිම තැනකින් ශක්තියක් නොගෙන අපේ පුද්ගලික මට්ටමෙන් එවැනි දෙයක් කරලා එවැනි කතා අහන්න ලැබීම අපට සතුටක්. මොකද නැත්නම් ඒක කවුරුවත් දන්නෙ නැහැනෙ. මොකද මම කියන්න ගියෙත් නැහැ. මම පොටෝ ගහපුව තියෙනවා. මම කළාය කියලා ෆේස් බුක් එකටවත් දැම්මෙ නැහැ. ඉතිං එහෙම හරි කරන එක ගැන එක පැත්තකින් සතුටු වෙනවා. ඉතිං ඒ ගැනත් සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, මම පහුගිය සභාවටත් ආපු නැති නිසා මේ අවස්ථාවෙ ඉතාමත් කෙටියෙන් මේ කොරෝනා වසංගතයත් එක්ක දැන් මේ අපේ සභාවෙත් කතා වුනා සින්ක් මිලදී ගැනීමක් කරන්න ඕන කියලා. යම් යම් දේවල් ඒ ගැන කතා වුනා. ඇත්තටම සභාව විදියට අපි ඒක කරනවා. දැන් ඉදිරියෙදි පාසල් පටන් ගන්න කොට යම් කටයුත්තක් සිදු කරනවා. දැන් බැලුවම රජයේ ආයතනයකට ගියොත් ඒ ආයතනයට යන කොට සමහර විට උන බලනවා. ඒ යන කොට දොස්තර කෙනෙක් ඇතුලු වුනත් එතන ඉන්න ආරක්ෂක නිලධාරියා තමයි උන බලල කියන්නෙ. ඒ වගේ අපේ ආයතනවලට ප්‍රධාන බැංකුවලට

සහ මේ රජයේ ආයතනවලට විතරක් නෙවෙයි. අපේ සභාව ඇතුලත පුද්ගලික වෙළඳ ව්‍යාපාර විශාල වශයෙන් තියෙනවා. අපි ගාල්ල නගරයේ රෙදි කඩයකට ගියොත් මේ කඩේට ගොඩ වෙලා එහා කඩයට ගියොත් ආපහු අත සෝදන්න ඕන. ආපහු උන බලනවා. මේ එක පේලියට තියෙන කඩවල එහෙම නැත්නම් ඒ කඩයට ඇතුල් වෙන්න දෙන්නෙ නැහැ. එවැනි තත්වයක් තියෙන්නෙ. නමුත් අපේ බල ප්‍රදේශයේ එවැනි තත්වයක් කිසිම කඩේක අපි දකින්නෙ නැහැ. ගරු සභාපතිතුමනි සෞඛ්‍ය පිළිබඳ අපට තියෙන මේ වගකීම ඒ එම් ඕ එච් මහත්වරු සහ පී එච් අයි මහත්වරු සමග කතා කරලා අඩුම තරමෙන් නිරන්තරයෙන් විශාල ප්‍රමාණයක් ගැවසෙන ඒ අපේ බල ප්‍රදේශයේ තියෙන විශාල කඩවලට අඩුම තරමින් සින්ක් එකක්වත් සවි කරල නැහැ. මම කියන්නෙ ඒක කළා හරි නොකළා හරි ඒකට ඒ අය උනන්දුවක්වත් වෙලා නැහැ. රජයේ ආයතනවලට විතරක් නෙවෙයි කොරෝනා හැදෙනවනම් හැදෙන්නෙ. මිනිස්සු යන්නෙ ඒවට විතරක් නෙවෙයි. නමුත් ඊටත් වඩා ජනගහනය නිරන්තරයෙන් ගැවසෙන ස්ථානවල එහෙම කරල නැහැ. ඒ නිසා යම් වැඩපිළිවෙලක් අපි කරන්න ඕන. ඉදිරියෙදි පොලවල් අපි ආරම්භ කරනවා නම් ඒ ස්ථානවලටත් මොනවා හරි යම් සෞඛ්‍ය වැඩපිළිවෙලක් සභාව මැදිහත් වෙලා කරන්න ඕන. විශේෂයෙන්ම අපේ ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් ප්‍රධාන වෙළඳ ව්‍යාපාරවලට නිරන්තරයෙන් සෙනග ගැවසෙන ස්ථානවලට එවැනි කටයුත්තක් කරන්න උපදෙස් දෙන්න කියලා මේ සභාව හරහා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද අපි අනිත් රටේ ලෝකෙ තියෙන ඒව කතා කරනවට වඩා අපිට කරන්න පුලුවන් දේ බොහොම තියෙනවා. නමුත් ඒ ගැන අපි කොතනකවත් කතා වෙලාවත් උනන්දු වෙලාවත් නැහැ. ඔබතුමා සභාපතිවරයා හැටියට ඒ රැස්වීම්වලට සහභාගිවෙන අවස්ථාවලදි ඒ ගැන විමසන්න ඒ ගැන ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පහුගිය අපේ රජයෙන් ආරම්භ කළ ඒ මාර්ග ව්‍යාපෘතිය අපේ ප්‍රදේශයේ අපේ ගම හරහා ක්‍රියාත්මක වෙනවා. ඒ මාර්ග ව්‍යාපෘතියට විශාල මුදලක් වැය කරලා අමතර සුබසාධන සහ පිරිසිදුකම ගැන ඒ අය ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. නමුත් දැන් සමහර ස්ථානවල ගල් සහ පස් ඒ අය ගොඩ ගහලා තොග වශයෙන් එකතු කරන ස්ථානවල වැහි කාලෙත් එක්ක මාර්ගය ඉතාමත්ම අපවිත්‍ර තත්වයට පත්වෙනවා. පාරෙ වාහනයක් යන්න බැහැ. පහුගිය දවස්වල මේ සභාවෙ වාහනේ එන්නෙත් කාබිල් වත්ත පාරෙ. නැත්නම් වෙනත් පාරක. මේ ප්‍රධාන කුරුපනාව පාර උඩලමත්ත පාර වගේ පාරවල්වල සමහර ස්ථානවල ඒ අයට ඊට වඩා පිරිසිදුව තියාගන්න පුලුවන් ස්ථාන ගැන දැන් දැන් අවදානය යොමු නොකර පාරවල මඩ සහ ලිස්සන සුලු තත්වෙට පත්වෙලා තියෙනවා. ඒ නිසා ඒ ගැනත් ඔය සාකච්ඡාවලදි හරි ඒ අය ගෙන්වල දැනුවත් කරලා ඒ අය කරන විශාල වියදම කරන අතරෙ ඒව නිවැරදි කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටින්න කියලා මේ සභාවෙ සභාපතිවරයා හැටියට මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි කවුරුත් කතා කළා වගේ, අපේ පහුගිය රජය කාලෙ විශාල වශයෙන් පළාත් පාලන අමාත්‍යාංශය හරහා මේ ප්‍රාදේශීය සභාවටත් මුදල් ආවා. විපක්ෂ නායකතුමනි ගෝනදෙණිය ප්‍රදේශයට අපි ව්‍යාපෘති පහක් සඳහා මුදල් ගෙනාවට එක ව්‍යාපෘතියයි කරන්න පුලුවන් වුනේ. ඒ දවස්වල ඡන්දෙකාලෙ නිසා ඒක කරන්න එපා. ඒ මුදල සභාවට ඇවිල්ලා සමිති, සමාගම් ගෙනැල්ලා ඇග්‍රිමන්ට් අත්සන් කළත් යම් යම් හේතු නිසා එතනින් එහාට ඒ කටයුත්ත කරන්න හම්බ වුනේ නැහැ. නමුත් සමහර අය වැඩ ඉවර කළා ඒ අයට මුදල් ගෙව්වා. නමුත් අපි පළාත් පාලන අමාත්‍යාංශය හරහා ගෙනාපු මුදල් මේ සභාවට ආපු මුදල් ඒ යෝජනා අනුමත වෙච්ච මේක මොන ආණ්ඩුවෙන් කළත් අපේ ගම් ප්‍රදේශ දියුනු කරන්න වෙන්කර ගත්ත මුදල් දැන් ඔබතුමාලගෙ රජයක් තියෙනවා. ඔබතුමාලගෙ අමාත්‍යවරයෙක් ඉන්නවා. කරුණාකරලා ඒ මුදල් ඒ ගම් ප්‍රදේශයේ ඒ යෝජනා සඳහා ක්‍රියාත්මක කරලා. ඔබතුමාලගෙ බෝඩ් එකක් ගහනවනම් ඒ බෝඩ් එක ගහගත්තට කමක් නැහැ. ඒ මුදල් මේ සභාවෙන් අහක යන්න දෙන්න එපා කියලා. වගකීමක් ඇතුව කටයුතු කරලා ඒ ගැන සොයලා බලලා ඒ මුදල් නැවත ගෙන්න ගෙන හරි තියෙනවනම්, ඒවා ක්‍රියාත්මක කරන්න හරි කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. සමහර කොන්ත්‍රාත්

කරුවන් එපා කියද්දිත් වැඩ කළා. ඒ අය මුදල් ගත්තා ගැටලුවක් වුනේ නැහැ. නීත්‍යානුකූලව තමයි හැම දෙයක්ම කරල තිබුනෙ. නමුත් අර ගමට ආපු මුදල් නැවතත් යන්න දෙන්න එපා කියල මම ඉල්ලා සිටිනවා. ඒක ඔබතුමන්ලා කරන දෙයක් හැටියට හරි ඒ කටයුත්ත ඒ යෝජනාව ඒ මුදලින් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අවසාන වශයෙන් අපේ චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමා මගේ නමත් සඳහන් කරලා යම් ප්‍රකාශයක් කළා. අපි ඒක දන්නවා ඇති කියලා උඩුගම එතුමාගෙ කොට්ඨාසෙ පාලම් ව්‍යාපෘති තුනක් ගැන එතුමා සඳහන් කළා. එතුමාගේ කොට්ඨාසෙත් නෙවෙයි මම හිතන්නෙ ඒ ආසන්න මායිමේ ඉදලා. ලක්ෂ 300 ක් වගේ ගණනක් දීල කරන ඒ කටයුත්තෙ යම් අසාධාරණයක් පහුගිය කාලෙ නම් සිදු වුනේ නැහැ. ඒක නියමාකාරයෙන් ක්‍රමානුකූලව පහුගිය කාලෙ වජිර ඇමතිතුමා අමාත්‍යවරය විදිහට ගමට ලබා දුන්න මුදල් ඉතාමත් සාර්ථකව ඒ කටයුතු සිදු කළා. දැන් අද වෙනකොටනම් ඒව කියන්න කෙනෙක් නැහැ කියන එක නම් ප්‍රශ්නයක්. මොකද රජයේ ව්‍යාපෘතියක් කරද්දි දන්නෙ නැහැ කියන එක ගැටලුවක්. අපේ සභාපතිතුමත් ඒ උත්සව අවස්ථාවන්වලට සහභාගි වුනා. වර්ථමානයේ ඉන්න පළාත් පාලන අමාත්‍යවරයා හෝ එහෙම නැත්නම් මම දැන් නන්දන මන්ත්‍රීතුමාගෙන් අහල දැන ගත්තෙ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හයවෙනි තට්ටුවෙ තියෙන වාරිමාර්ග ඉංජිනේරු කීර්ති කියන මහත්මය තමයි ඒකෙ ප්‍රධානියා විදිහට කටයුතු කරන්නෙ. අන්න එතුමා තමයි දැනට වාරිමාර්ග අංශය හරහා අධීක්ෂණය කරන්නෙ. යම් හෝ ගැටලුවක් වර්ථමානෙ මම දන්නෙ නැහැ කරගෙන ආපු ක්‍රමේ, ඒවා වෙනස් වෙලාද කියලා. මොනව හෝ ගැටලුවක් තියෙනවනම් ඒව සිදු වෙන්න දෙන්න එපා. විශාල මුදලක් ඒවට වෙන් කරල තියෙන්නෙ අවශ්‍ය ආකාරයට. ඒක හරියට කෙරෙන්නෙ නැත්නම් ඔබතුමාලා මීටත් වඩා සොයා බලන්න. අපි ආරම්භ කරපු ව්‍යාපෘති නිසා ඔබටත් දෙන්න පුලුවන් සහයෝගය දීලා ඒ ආකාරයෙන් ඒව කරන්න. අපි මැදිහත්වන බවත් ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මේ කොරෝනා වසංගතයත් එක්ක කවුරු කවුරුත් කතා කරපු විදිහට දැන් ගම් ප්‍රදේශවල දුගී දුප්පත් අහිංසක ජනතාව බොහොම අමාරුවෙන් ඔලුව උස්සල තමන්ගෙ රැකියාව යන්තම් කරගෙන ඉන්න කාලෙ. මම මේ කියන්න හදන දේ අද ඊයෙ වෙච්ච දෙයක් නෙවෙයි. අපේ බල ප්‍රදේශයට අයිති වයින් ස්ටෝර්ස් විදිහට ක්‍රියාත්මක වන, උඩුගම නගරයේ මත්පැන් හල් දෙකක් තියෙනවා. ඒ ස්ථානවල අද ඊයෙ නෙවෙයි එදා ඉදලම මම දැකල තියෙනවා. වයින් ස්ටෝර්ස් එකේ අරින්නෙ ඒකෙන් කොටසයි. දොරවල් දෙකක් තියනවනම්, එක පලුවක් පමණක් ඇරලා කටයුතු කරනවා. වයින් ස්ටෝර්ස්වල සීල් අරක්කු විතරයි විකුනන්න පුලුවන් කඩලා දෙන්න බැහැ කියලා නීතියක් තියෙනවා. නමුත් ඒ ස්ථානවල අපේ ප්‍රදේශයේ විතරක් නෙවෙයි කොහෙත් කරනවා මම හිතන්නෙ. නමුත් අර අහිංසක මිනිස්සු හොයාගෙන එන රුපියල් 500 ය 1000 හ සමහර වෙලාවට අපි දැකල තියෙනවා වාහනේ යන රියදුරු මහත්වරු වාහනේ හෑන්ඩ් බ්‍රේක් ඇදල ගිහිල්ල ශොට් එකක් දාගෙන එනවා. ඒ කියන්නෙ කඩල දෙන හින්දා අරක්කු කාලත් නෙවෙයි මම හිතන්නෙ රුපියල් 50 ට 100 යට උනත් ඒ අය වක්කරල දෙනවා. ඇත්තටම පහුගිය කාලයේ පවුල් ජීවිත අහිමි වුනා. ජීවිත අහිමි වුනා. මත්පැන් නැතුව එල්ලිල මැරිච්ච මිනිස්සුත් ඉන්නවා. ඒ වගේ ජීවිත හානි කරගත්තා. දැන් වර්තමානෙ වෙන කොට ඒ වගේ අවස්ථා මගහරවන්න ඒ සඳහා නීතිය අපේ බල ප්‍රදේශයේවත් ක්‍රියාත්මක කරන්න යම් කටයුත්තක් කරනවනම් හොඳයි. ඒ සඳහා අපේ ප්‍රදේශයෙන්වත් ආරම්භයක් විදිහට එවැනි ආකාරයට මත්පැන් කඩල දෙන එක නවත්වලා. ඒ මත්පැන් හල්වලින් සීල් අරක්කු විතරක් විකුණන ආකාරයට අපි මැදිහත්වෙලා ඒ කටයුත්ත කරමු. ඒවට වෙනම ස්ථාන බාර් තියෙනවා. මේවා නීත්‍යානුකූල නොවන ස්ථාන. මේවා බාර් නෙවෙයි වයින් ස්ටෝර්ස් ඒ තැන්වල අධික ලෙස විශාල ලාභයක් ගන්නවා. කවලම් කරලත් දෙනවා ඇති. ඒ කොහොම වුනත් ඒ නියමා කාරයට නෙවෙයි. අපේ උඩුගම ප්‍රදේශයේත් සිදු වෙනවා. ඒ ගැන ඔබතුමා අවදානය යොමු කරලා අදාල අංශ දැනුවත් කරලා මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ අදාල ඒව ගැන සොයන්න ඉන්න ආයතන ප්‍රධානියෙක්ට සහ සොයන

කණ්ඩායමට යම් යම් ප්‍රතිලාභ ඒ බාර්වලින් හම්බ වෙනවා. ඒකයි එහෙම කරන්න ඉඩ දෙන්නෙ. ඒක නිසා වර්ථමනෙවත් අපේ මනත්‍රීතුමාල කතා කරපු වගේ වර්ථමානෙ ජනාධිපතිතුමාගෙ තියෙන සංකල්පෙකට හරි එකතු කරලා. ඒ කටයුතු සඳහා යම් දායකත්වයක් මේ සභාවෙන් ආරම්භ කරන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සභාවේ ලේකම් තුමිය ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. මම ගොඩක් වෙලා කතා කරන්නෙ නැහැ. අත්‍යවශ්‍යමයි මට හැගුනා මොකද අද සභාවේ අපිත් එක්ක දීර්ඝ කාලයක් සභාවේ මන්ත්‍රීවරියක් හැටියට ඒ වගේම ධර්මසිරි මන්ත්‍රීතුමත් කිව්වා වගේ අපේ කොට්ඨාසයේ ඉපදිච්ච කෙනෙක් අරුණ ශාන්ති බෝදරගම මන්ත්‍රීතුමිය. එතුමියගේ පෞද්ගලික කටයුත්තක් සඳහා සභාවේ සභික ධූරයෙන් ඉවත් වෙන්න ඉල්ලුම් කරල තියෙනවා. ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔබතුමිය මෙතෙක් කළ සේවය අපි අගය කොට සලකනවා. පරණතානායම්ගොඩ කොට්ඨාසෙ පහුගිය කාලෙ අපි කරපු සංවර්ධන වැඩවලට දැවැන්ත ශක්තියක් වුනා. ඒ තියෙන අඩුපාඩු පෙන්වා දෙමින්, අපිත් එක්ක අපේ ප්‍රදේශයේ ජනතාවට යම් මෙහෙවරක් කරන්න ඇයට හැකියාව ලැබුනා. මම මේ වෙලාවෙ අපේ ගෞරවය ඔබතුමියට පුද කරනවා. අපි ඉල්ලීමක් කරනවා නැවත වාරයක් එන්න කියලා මේ සභාවෙ කටයුතු කරන්න.

මේ වෙලාවෙ තල්ගස්වල පොල ගැන එක වචනයක් කතා කරනවා. ගරු සභාපතිතුමනි, පියල් මන්ත්‍රීතුමත් කිව්වා වගේ අපි මාසෙකට වෙලෙන්දන්ගෙන් මුදල් අය නොකර පොල ඉදිරියට වැඩි දියුනු කරගන්න යම් පියවරක් ගන්නවා වගේම මට මතකයි සහබන්දු අපේ හිටපු සභාපතිතුමන්ගෙ කාලෙ, පොල වැඩිදියුනු කරන්න පොලේ යම් ප්ලෑන් එකක් ගැහුවා. මම ඒක පහුගිය සභා වාරෙකත් කතා කළා. පොලට ඇතුල් වෙන පාර මාර්ග සංවර්ධන අධිකාරිය පැත්තෙන් දාලා අනිත් පැත්තෙන් පිට වෙන්න පොල සකස් කරනවනම් ඔයිට වැඩිය ඔය පොල දැවැන්ත වෙනසක් කරන්න පුලුවන්. මම හිතන්නෙ ඒක ඔබතුමන්ලගෙ බලය තියෙන කාලෙ එහෙම පොල වෙනස් කරලා පොල දියුනු කරන්න. ඒ වගේම පොලේ ඇතුලෙ දැන් තියන ගොඩනැගිලි දිරාපත් වෙලා. ටොයිලට් පද්ධතිය එහෙම විනාශ වෙලා තියෙනවා. මේ සඳහා යම් මුදලක් වැය කරලා ප්‍රතිසංස්කරණය කරන්න. ඒ අඩුපාඩු නිසා තමයි වැඩි හරියක් මේ පොලෙන් වෙලෙන්දො ඈත් වෙමින් යන්නෙ. ඒක නිසා ඒ කටයුත්ත ඉටු කරන්න ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

අද දවසේ ලෝකය පුරා ඩැහැගෙන ඉන්න කොරෝනා වසංගතය දැන් ලෝකයට ලොකු විනාශයක් කළා. ලංකාවටත් විනාශයක් කරන්න ඇතුලු වී ඉන්නවා. නමුත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සෞඛ්‍ය අංශ, රජයත් එක්ක කළ දැඩි කැප කිරීම තුල එය යම් මට්ටමකට පාලනය කරලා තියෙනවා. හැබැයි මම හිතනවා මේක ලෝකයෙනුත් ලංකාවෙනුත් තවම තුරන් වෙලා නැහැ. අපි මේ පිළිබඳ දැඩි අවධානයෙන් සිටිය යුතුයි. ඉතිං මම හිතනවා මේ මන්ත්‍රීවරු කිව්වා වගේ අපි ඉදිරියෙදි පොලවල් පවත්වනවා නම්, අනිකුත් අපේ ජනතාව වැඩිපුර ගැවසෙන තැන් තියෙනව නම්, ඒවට යම් ආරක්ෂිත වැඩපිළිවෙලක් සකස් විය යුතුමයි. මොකද මේකට තවම එන්නතක් හොයා ගෙන නැහැ. සුව කරන්න ක්‍රමවේදයක් සොයා ගෙන නැහැ. සුව වෙන අය රෝහල්වලින් පිටවී ගියත් නැවත රෝගය වැලදෙන තත්වයක් තියෙනවා. මේ වගේ තත්වයක් තුල මේ සම්බන්ධව අපි අවදානෙන් සිටිය යුතුයි කියලා සිහිපත් කරමින්, මේ වෙලාවෙ විශේෂයෙන් මතක් කරන්න ඕන. අපේ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වගේ මේ සියලු දෙනා එකතුවෙල තමයි වැඩ පිළිවෙලවල් යෙදුවෙ. මේ සහසම්බන්ධ තාවය තුලින් ලංකාවේ කොවිඩ් රෝගය තුරන් කිරීමේ වැඩසටහනට පක්ෂ බේදයකින් තොරව සියලු දෙනාගේ කැප කිරීම සිදු වුනා. ඒ හින්දා තමයි මම හිතනවා අද මේ තරමටවත් රෝගය පාලනය කරන්න ලංකාව

තුල හැකි වෙලා තියෙන්නෙ.මේ වෙලාවෙ නැවත වාරයක් බෝදරගම මන්ත්‍රීතුමියට අපේ ගෞරවය පුද කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි,සියලුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මේ අවස්ථාවෙ මමත් නැගී සිටියේ අපේ පක්ෂයේ කෙනෙක් අද දින අපේ සභාවෙන් ඉල්ලා අස්වීම පිළිබඳ අපේ පක්ෂය කියල කිව්වෙ කාන්තා පක්ෂය. කාන්තා පක්ෂයේ හත්දෙනාගෙන් එක්කෙනෙක් අද තමන්ගේ ඉල්ලා අස්වීම පිළිබඳව මගේ මේ අවස්ථාවෙ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ වුනත් එතුමියගේ ඉදිරි අනාගතය සාර්ථක වේවා කියල ඉත සිතින් ප්‍රාර්ථනා කරනවා.

අනික් කරුණ අපේ පුලුවන් ශක්තියෙන් අපි පාරවල් හැදුවා. ඒ වගේම තමයි මේ කාලයෙත් අපේ ගමේ පාරවල් ඒ විදිහටම සංවර්ධනය වෙනවා. අද උදෙත් එක පුද්ගලයෙක් අපේ ගෙදරට ඇවිල්ලා කිව්වා. අක්කෙ අද අපේ පාර හදනවා. පාර කොන්ක්‍රීට් කරනවා කියලා. ඇත්තටම අපි ඒ ගැනත් සතුටු වෙනවා. ලක්රුවන් මන්ත්‍රීවරයයි කිව්වා ඒ පිළිබව මූලිකත්වය අරගෙන කටයුතු කරන්නෙ කියලත් එතුමා කිව්වා.

අනික් කරුණ තමයි. අපේ සහබන්දු මන්ත්‍රීතුමා චෝදනාවක් කළා ඩබල් ගේම් කියලා. කාට කිව්වද කියල නම් අපි දන්නෙ නැහැ. අපේ නායකතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි. අපි වගේ කාන්තාවන්ට මේ වගේ ස්ථානයකට එන්න අවස්ථාව හදල දුන්නෙ එතුමා. ඒ පිළිබදව මම එතුමාට ගෞරව කරනවා. ඒ වගේම තමයි අපේ හිනිදුම ආසනයේ එක්සත් ජාතික පක්ෂ නායක සුනිල් සේනානායක මැතිතුමා එතුමාත් එම තීරණයේ හිටපු නිසා තමයි අද අපි මේ ස්ථානයට ඇවිල්ල ඉන්නෙ. ඒ වගේම අපේ දිස්ත්‍රික් නායක වජිර අබේවර්ධන මැතිතුමන්දගේත් සහයෝගය නිසා තමයි අපි මේ වගේ මෙහෙම ඉන්නෙ. ඒක නිසා මගේ පක්ෂය එක්සත් ජාතික පක්ෂය. ඒක නිසා අපි සියලු දෙනා එක්කම එකතු වෙලා. අපි ඒ ගැන කටයුතු කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලගෙන් මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. විශේෂයෙන්ම මේ අවස්ථාවෙ නැගී සිටියේ අපත් එක්ක සිටිය මන්ත්‍රීවරියක් වන අරුණ ශාන්ති බෝදරගම අපේ මන්ත්‍රීතුමිය සභාකටයුතුවලින් සමු ගැනීම සිදු කරන මොහොතේදී එතුමියත් එක්ක බොහෝ කාලයක් කටයුතු කරමින් මේ සභාවට ඉතා අගනා වටිනා සේවයක් කරපු මන්ත්‍රීවරියක් හැටියට අපෙන් සමු ගැනීම ගැන අපි බොහොමත්ම කණගාටු වෙනවා. ඒ වුනත් එතුමියගේ ඉදිරි අනාගත අභිවෘද්දිය ඉතාම සාර්ථක වේවා කියලා අපි සුභ පතනවා.

විශේෂයෙන්ම පහුගිය කාලය තුලදී රුපියල් 5000 දීමනාව ලබා දීමෙදි අපේ කොට්ඨාසෙ ඉතාම හොඳින් ඒ වැඩකටයුතු ටික සිදු වුනාය කියන වග මේ වෙලාවෙ සඳහන් කරනවා. ඒ සඳහා සහයෝගය ලබාදුන්න සියලුම නිලධාරීන්ට, සමෘද්ධි සංවර්ධන නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී ඇතුලු සියලුම නිලධාරීන්ට අපේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. කිසිම ප්‍රශ්නයකින් තොරව ඒ කටයුතු සියල්ලක්ම සාර්ථකව අපි ඉෂ්ඨ සිද්ද කළා. ඒ ගැන අපි හදවතින්ම සතුටු වෙනවා. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමිය කිව්ව වගේ මේ දිනවල සංවර්ධන කටයුතු රැසක් සිදුවෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. පසුගිය කාලයේ සංවර්ධනය නොවූ කටයුතු පිළිබදව ඒ කටයුතු පිළිබදව අවදානය යොමු කරමින් වර්ථමාන රජය විසින් මේ කරන ලද කටයුතු පිළිබද විශේෂයෙන්ම අගය කරමින් ඒ පිළිබදව ස්තූති වන්ත වෙමින් නැවත වතාවක් අපේ මන්ත්‍රීතුමියට සුභ පතනවා. විශේෂයෙන්ම නැවත වතාවක් අපිත් එක්ක මේ වගේ ගමනකට එතුමියට අපි ගෞරවණීය ආරාධනයක් කරනවා. එසේ සුබ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මේ අවස්ථාවෙ මතක් කරන්න ඕන. අපේ අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය නාගොඩ ප්‍රාදේශීය සභාවට 2018 අපිත් එක්කම නවක මන්ත්‍රීවරියක් විදිහට පත්වෙලා, කොට්ඨාසයේ ජනතාව, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කළා. විශේෂයෙන් අපේ සභාවෙ අපි කාටත් ආදර්ශයක් සපයමින් තනතුරුවල එල්ලිලා ඉන්නෙ නැතුව හැමෝටම අවස්ථාව දීල එතුමිය මේ ආකාරයෙන් බොහොම මහත්මා දේශපාලන ගති පෙන්වමින් ඒ කටයුතු කළ එතුමියට අපේ ගෞරවය, ප්‍රණාමය මේ අවස්ථාවෙදි පුදකරනවා. එතුමිය මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නෙ. එක්සත් ජනතා නිදහස් පෙරමුණ නියෝජනය කරමින්. පහුගිය මැතිවරණයෙදි ස්වාධීන කණ්ඩායමක් විදිහට ඉදිරිපත් වුනේ. එතුමියගේ මහත්මා ජාගොඩ මහත්මා මේ අවස්ථාවෙදි මතක් කරන්න ඕන. විශේෂයෙන්ම හරිතැන්වල සිට ගනිමින් අවශ්‍ය තැන්වලදි අපටත් සහයෝගය ලබාදෙමින් එතුමිය සහ එතුමා කටයුතු කිරීම පිළිබඳව ඒ දෙපොලටම දේශපාලන නියෝජිතයෙක් වශයෙන් ජනතාව වෙන්වෙන් මාගේ හෘදයාංගම ස්තූතිය හා ප්‍රණාමය පුදකරන්න කැමතියි.

ඊලග කරුණ විදිහට මම කතා කරන්න ඕන. කටුපොල් පිළිබඳ ප්‍රශ්නය. මම එදා පැහැදිලිව කිව්වා. මට එදා දෝශාරෝපනයකුත් ආවා ජනාධිපතිවරයා විවේචනය කිරීමක් සම්බන්ධව. ජනාධිපතිවරයා විවේචනය කිරීමක් නෙවෙයි මම සිදු කළේ. නමුත් එදා මම කියපු දේ ප්‍රතිඵල අද ඒ ආකාරයෙන්ම පෙනෙමින් තියෙනවා. ජනාධිපතිවරයා කටුපොල් සම්බන්ධව කරපු ප්‍රකාශය කිසිම තැනක නීතිගත වෙලා නැහැ. ගැසට් එකකින් එලියට ඇවිල්ලා නැහැ. එතකොට මේ කටුපොල් ඉන්දුවොත් මොකක්ද දෙන දඬුවම. මොකක්ද ඊලග පියවර කියලා කිසිම තැනක සඳහන් වෙලා නැහැ. එතකොට මේක ප්‍රයෝජනයට ගනිමින් වතු සමාගම් ඉතාමත්ම කපටි ලෙස මේ කටුපොල් සිටුවීම කරනවා. අපට යම්කිසි බලපෑමක් කරන්න පුලුවන් මම දැනගත්තොත් ඒ ස්ථානයට වහාම මම යනවා. මොකද මම පහුගිය දවස්වල තල්ගස්වල වත්තෙ කටුපොල් සිටුවීමක් සමබන්ධව අපේ පියල් මන්ත්‍රීතුමා දැනුවත් කළා. අපි දෙන්නම එතනට ගියා. අවශ්‍ය නිලධාරීන් සියලු දෙනා දැනුවත් කළා. ඒ අවස්ථාවෙ පොලීසිය ක්‍රියාත්මක වුනා. හැකි ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට. ඒ අවස්ථාවෙ වහාම මැදිහත් වුනා. නැවත තල්ගස්වල වත්තෙ කටුපොල් සිටවන්නෙ නැහැ කියන පනිවිඩය තල්ගස්වල වත්තෙ වතු අධිකාරීවරු අපට ලිඛිතව ලබා දුන්නා. මේ වෙන කොට ඒ ලිපිය මට ඊමේල් එකක් මගින් ඇවිල්ලා තියෙනවා. එතකොට මේ විදිහට කොහේහරි ඉන්දනවනම් කොට්ඨාසෙ මන්ත්‍රීවරයට පුලුවන් ඒ සම්බන්ධව කටයුතු කරන්න. අපි මැදිහත් වෙන්න අවශ්‍යතාවයක් නැහැ. ඕනම ජනතා නියෝජිතයෙකුට රුපියල් 5000 දෙන්න මැදිහත් වීම ගැන කියනව වගේම, මේ කටුපොල් සම්බන්ධවත් ඒ අයට මැදිහත් වෙන්න පුලුවන්. ඒ සමබන්ධව මැදිහත්වෙලා නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුලුවන්. නීතිය පැත්තෙන් බලපෑම් එල්ල කරන්න පුලුවන්. චෝදනා කර කර ඉන්නවට වඩා මම ඉල්ලා සිටිනවා. ඒ සියලු දෙනාම මැදිහත්වෙලා මේ සිටුවීම නතර කරගමු. ඒක තමයි විය යුත්තෙ.

ඊලගට මම ඉදිරිපත් කරන්න කැමතියි. මම නම් කැමතියි මගේ කොට්ඨාසයේ අර 5000 දෙන එකට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සම්බන්ධ නොවීම ගැන. මොකද අපි කමිටුවක් රැස් කළා සභාවෙ ආධාර දෙනවා කියලා. ඉතාම නිර්ලජ්ජිතයි අපි පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙ නම් ලිස්ට් එක අරගෙන යද්දි එක්සත් ජාතික පක්ෂ යේ මම කෙලින්ම කියනවා මගේ නියෝජිතයා අරගෙන ආවෙ තනිකර එක්සත් ජාතික පක්ෂ යේ ලිස්ට් එකක් විතරයි. මම මේක බොහොම පැහැදිලිව කියනවා. බය නැතුව කියනවා. මම විතරක් නෙවෙයි සාක්ෂි දරණවා එදා එතන හිටපු ස්වේච්ඡා සංවිධානවල ගමේ මිනිස්සු එතනට ආවා ඒ සියලු දෙනා දැඩි විරෝධය ප්‍රකාශ කළා. රාජ්‍ය නිලධාරි දැඩි විරෝධය ප්‍රකාශ කළා. එතන හිටපු සමෘද්ධි නිලධාරී සහ ආර්ථික සංවර්ධන නිලධාරී එතුම ඉදිරිපත් කරපු නමකට දැඩි විරෝධය ප්‍රකාශ කළා. මෙතනට දෙන්න අවශ්‍යතාවයක් නැහැ කියලා. එතන අඩු ආදායම් ලාභී නෙවෙයි කියන එක හැබැයි එතුමා ඉතාමත්ම දැඩිව තර්ක කළා. එතනට ලබා දෙන්න. ඉතිං මම ඒ විදිහට වුනානම් අර එදා යූඑන්පී

ආණ්ඩුව සමෘද්ධිය බෙදුව වගේ, ගංවතුර ආධාර බෙදුව වගේ, මේක සම්බන්ධ වුනා නම්, ඉතා දැඩි ලෙස අපිත් දෝශාරෝපනයට ලක්වෙනවා. ගරු සභාපතිතුමනි, ඒක මගේ කොට්ඨාසෙ සිදු නොවීම පිළිබඳව මගේ තියෙන්නෙ විශාල සතුටක්. ඒ වගේම එතුමා කිව්වා බඩු බෙදීමක් සම්බන්ධව. ඒ ගැන කියන්න ලැජ්ජ සහගතයි. ගමේ දුප්පත් අහිංසක මිනිස්සු අනන්තයි අප්‍රමාණයි. ගරු සභාපතිතුමනි, හැබැයි තරංග මන්ත්‍රීතුමා ඔය කියන විදිහට කරපු බඩු බෙදුවෙ රට රට මල්ල මල්ල අරගෙන යනවා. එතුමගෙ හිතවත් එතුමත් එක්ක දේශපාලනය කරන ගෙවල්වලට. අපි බොහොම බය නැතුව කියනවා. අපි රුපියල් 5000 දුන්නා යූඑන්පී ශ්‍රී ලංකා වැඩිය නෙවෙයි. මම ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කරල එතුමට දෙන්න පුලුවන්ද කියලත් බැලුවා. නමුත් සභාවෙ දීමනාවක් දෙන නිසා දෙන්න බැහැ කිව්වා. ඒ විතරක් නෙවෙයි එතුමත් එක්ක ලිස්ට් එකෙන් ඉල්ලපු ගෝනදෙණියෙ අනිත් අපේක්‍ෂකයට මම ඒක ලබා දුන්නා. සියලුම දෙනාට රජයේ සේවකයො හැර රුපියල් 5000 දීමනාව ලබා දුන්නා. මම මේක කතා කරන්න නෙවෙයි හිටියෙ. නමුත් එතුමාම කතා කරපු නිසා මම මේ සම්බන්ධව උත්තර දෙන්නෙ. එතකොට හාල් ටික රට රට ගිහින් දුන්නෙ. හාල් ටික ගිහින් දුන්නෙ එතුමගෙ පක්‍ෂ යේ එතුමත් එක්ක කැන්වසින් යන ඒ පිරිසට විතරයි. හැබැයි ගමේ අහිංසක දුප්පත් මිනිස්සු අනන්තයි අප්‍රමාණයි. එතකොට මේ විදිහට නිර්ලජ්ජිත විදිහට එක්සත් ජාතික පක්‍ෂ ආධාර බෙදීම, අර සම්ප්‍රධායික දේශපාලනය කරයි කියන එක දැන් මේ වෙන කොට ගමම පිළි අරගෙන තියෙනවා. ගමේ සියලුම දෙනා ඒ ගැන කතා කරනවා. මෙතන එතුමාගෙම කොටසක් ඉන්නවා. එතුමාගෙම කොටසකට මේක දීල තියෙන්නෙ එතුමාත් එක්ක ලගම ඉන්න කොටසට විතරයි. හැබැයි එක්සත් ජාතික පක්‍ෂයේ තව කොටසක් ඉන්නවා. කියන්න සතුටුයි විපක්‍ෂ නායකතුමනි, එතුමාත් එක්ක ඉන්න එක්සත් ජාතික පක්‍ෂ යේ අනිත් කොටස මගෙත් එක්ක එකතු වෙමින් සිටිනවා. එතකොට මේක සීමිත ප්‍රමාණයයි එතුමට හම්බවුනේ වජිර ඇමතිතුමා ගෙනැල්ල වාහනේ නවත්වලා හාල්ටික බෑවෙ. එතකොට මේ හාල්ටික පොටෝ තියෙනව මම ගාව මෙතුම හාල් බෙදන එකෙත් පොටෝ මම ගාව තියෙනවා. එතකොට මේ හිරිකිත විදිහට නිර්ලජ්ජිත විදිහට කරන ගමන් මෙතන සුදනන් වීම ඇත්තටම කණගාටුවට කරුණක්.

ඒ වගේම තමයි මෙතුමා කතා කළා අර ව්‍යාපෘති ගැන. ව්‍යාපෘවල සල්ලි ගිහිල්ල සල්ලි එන්න ඕන කියලා. ගරු සභාපතිතුමනි ඡන්දෙ ආවෙ නොවැම්බර් මාසෙ පහුගිය වසර පුරාම යෝජනා වෙච්ච ව්‍යාපෘති තමයි ඒ තිබුනෙ. ඒ ව්‍යාපෘවල සල්ලි යන්න හේතුව කොන්ත්‍රාත් කරුවන් ගිවිසුම් අත්සන් කරල නැහැ ඒව. මේ මැතිවරණයට කලින් මේ අයට මේව ඉවර කරන්න තිබුනා. මේ කොන්ත්‍රාත් ටික අන්තිම මොහොතෙ කරන්න ගිහිල්ලා කල් ඉකුත් වෙලා අන්තිමට කර ගන්න බැරුව සල්ලි ටික නැවත ගියාට පස්සෙ නැවත අපට චෝදනා කරනවා මේ ඡන්දෙ නිසා මේක කරන්න වුනේ නැහැ. මේක හතර බීරි කතාවක් ගරු සභාපතිතුමනි, අන්තිම මොහොතෙ මමත් උත්සාහ කළා. බොරු කියන්න ඕන නැහැ. අනතිම මොහොතෙ මේක කරන්න මමත් උත්සාහ කළා. දවස් 30 යි තිබුනෙ. අන්තිම මොහොතෙ කොන්ත්‍රාත්කරුවෙක් සොයාගෙන නමුත් කරන්න බැහැ ඇයි පාර හදලා කැට ටික දාලා දවස් 21 ක් තියෙන්න ඕන. එතකොට බඩු ටික ගෙනැල්ල බාලා දෙසැම්බර් 31න් ඉස්සර වෙලා වැඩ ටික ඉවර කරන්න ඕන. ඒ දේ කරන්න බැහැ අවුරුද්දක් තිස්සෙ කරන්න තිබුන වැඩ මේවා. කරන එක පමා කරල පමා කරලා දැන් බොරුවට චෝදනා කරනවා.මේ සල්ලි ගිහිල්ල සල්ලිවලින් ප්‍රයෝජනයක් ගන්න කියලා. ඒ වගේ හතර බීරි කතා හැමදාම මම කියන්න කැමතියි ඉදිරියෙදිත් ඔබ තමුන්නාන්සෙලට සිද්ද වෙන්නෙ තව අවුරුදු 10 ට ඔය කරපු එකවැඩක් දෙකක් ගැන පම්පෝරියක් ගහගෙන එහෙම නැත්නම් මේක කරන්න අරක කරන්න කියල චෝදනා කරමින් ඉන්න විතරයි. අපි දැක්ක මැතිවරණය පවත්වනවට බොහොම අකමැත්තෙන් බයෙන් ඉන්නවා. එක්සත් ජාතික පක්‍ෂ යයි ඒ වගේම මම දන්නෙ නැහැ දූරකතනයයි මොකක්ද එකක් තියෙනවා තව පක්‍ෂයක් සමගි බලවේගයද මොකක්ද ඒක මම දන්නෙ නැහැ දැන් තියෙන එකත් දෙකට කඩා ගත්තට පස්සෙ අපි දකිනවා. අපි වෙනදා රූපවාහිනිය දැම්මම ප්‍රවෘත්තිවල අපි දකින්නෙ පක්‍ෂ විපක්‍ෂ ගහගන්න ඒවා. දැන් අපි වැඩිහරියක් හරි ආසාවෙන් බලන්නෙ පක්ෂෙ පක්ෂෙ ගහගන්න ඒවා. අපි හරි ආස්වාදයකින් බලනවා. තුනෙන් දෙක නෙවෙයි මට හිතෙන්නෙ ඊලග ඡන්දෙදි අපිට පහෙන් තුන ගන්න

පුලුවන් වෙන සයිස් එකක් තියෙන්නෙ. ඒ පිළිබඳ සතුට ප්‍රකාශ කරමින් පහෙන් හතරක් අපි ගන්නවා. හයෙන් පහක බලයක් ගන්නවා අපි සමාවෙන්න මම ඒක ඉල්ලා අස්කර ගන්නවා. හයෙන් පහක බලයක් ගන්නවා. හයෙන් පහක බලයක් ගන්න ඒක ලොකු අමාරු කාර්යයක් නෙවෙයි. මට සමාවෙන්න මම ඒක හයෙන් පහක බලයක් කියල සංශෝධනය කරනවා. හයෙන් පහක බලයක් ගන්න කටයුතු කරනවා.

ඒ වගේම මම කියන්න කැමතියි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙදිත් කතා කළා. ගොම ඇදීම සම්බන්ධව අද වෙනකම් ගොම ඇදීම නතර වෙලා නැහැ. සභාවෙ ආපු දවසෙ ඉදල කතා කළා. ගොම ඇදීම නතර වෙලා නැහැ. අපේ ආණ්ඩුව ඇවිත් තවම බොහොම ටික කාලයයි. අවුරුදු පහක් ඔබතුමන්ලගෙ ආණ්ඩුවෙන් නොකරපු එක දැන් ඔබතුමන්ලට අයිතියක් නැහැ ඔබතුමන්ලා හවුලෙනෙ ආණ්ඩුව කළේ. ඒ නිසා ඔබතුමන්ලා දෙපොලටම අයිතියක් නැහැ. ඉතිං ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ ප්‍රාදේශීය සභාවෙ විශාල පාරිසරික ගැටලුවක් ඒ වගේම මේ ගව ප්‍රශ්නය මම දන්නෙ නැහැ මට ජේනතෙක් මානයක විසඳුමක් නැහැ. එක පැත්තකින් කිරි ගොවියා ආරක්ෂා කර ගන්න ඕන. තව පැත්තකින් අපේ කෘෂි කර්මය ආරක්ෂා කර ගන්න ඕන. අපේ වගාවන් ටික ආරක්ෂා කර ගන්න ඕන. මේ සම්බන්ඳව මොකක්ද කරන්නෙ කියල ඉහලට කතා කරලා, ඉහලත් සමග සම්බන්ධ වෙලා, මේ සම්බන්ධව ඉතාම සංකීර්ණ වැඩපිළිවෙලකට අපට යන්න වෙන්නෙ. මේ සම්බන්ධව කටයුතු කරන්න මොකද ඇත්තටම මේ ගව ප්‍රශ්නයට ගෝනදෙනියෙ මගේ කොට්ඨාසෙ විතරක් නෙවෙයි නාගොඩ ප්‍රාදේශීය සභාවෙ සියලුම ප්‍රදේශවලින් මේ ප්‍රශ්නය කතා කරන්න කියල අපි දැනුවත් කරනවා. ඒ සම්බන්ධව අපිට ඉස්සරහට වැඩපිළිවෙලකට යන්න වේවි. මම නැවතත් ඉල්ලා සිටිනවා මේ වීථි ලාම්පු නඩත්තුව හා මාර්ග නඩත්තුව ඇත්තටම අපේ කම්කරුවන් නොමැති වීම සහ පහසුකම් සහ සම්පත් නොමැති වීම පිළිබඳව කණගාටු වෙනවා. ඒව සම්පාදනය කරගෙන ඉදිරියට අපේ ආණ්ඩුව යටතේ ඒ කටයුතු සාර්ථකව කරන්න කියල ඉල්ලීමක් කරන ගමන් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන් මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගියවර සභාවෙදි මම ඉදිරි ගෙවීම්වල රුපියල් හත්දහසක වැරදි ගණදෙනුවක් පෙන්වා දුන්නා. ඒක අද දීපු ඉදිරි ගෙවීම්වල නිවැරදි කරල තියෙනවා. ඒක නිසා මම ඒක නිවැරදි කර ගත්තා.

ඒ වගේම මගී ආවරණ ඉදිකිරීම පිළිබද සභාපතිතුමාගෙ යෝජනාවක් ආවා. ඒක අපි ස්ථිර කරලා දුන්නා. ඒකට යටලමත්තෙ හන්දියෙත් මගී ආවරණයක් හදන්න යෝජනා කරල තිබුනා. පහුගිය සති දෙකකට උඩදි මගී ආවරණ නැතිකම නිසා පොඩි දරුවෙක් සුමනසේකර මහත්තයගෙ කඩේ වීදුරුවට හේත්තුවෙල ඉද්දි ඒ දරුවට නින්ද ගිහිල්ලද දන්නෙ නැහැ. වීදුරුව කඩා වැටිල ඒ දරුවට තුවාල වුනා. එවලෙ තමයි මට හිතුනෙ මගී ආවරණයක් තිබුනනම්, මේ දරුවට අනතුරක් වෙන්නෙ නැහැ නේද කියලා. ඒක නිසා හැකි ඉක්මනින් මගී ආවරණයක් සකසා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. කලින් හංසගිරි එක ඉස්සරහ අපි ඉස්කෝලෙ යන කාලෙ ඉදලා මගී ආවරණයක් තිබුනා. මම කියන්නෙ කනු දෙකක් ගහලා වහලක් ගහලා දෙන්න. මිනිස්සුන්ට ඉන්න තැනක් නැහැ.

ඒ වගේම කනත්තගොඩ පාලම දැන් වැඩ නතර වෙලා තියෙන්නෙ. එකෙ බීම් ටික දාන්න විතරයි මම හිතන්නෙ තියෙන්නෙ. ඔබතුමා ඒ ගැන සොයල බලල ඒකත් හැකි ඉක්මණින් කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම යටලමත්ත ග්‍රාම සේවා වසම් තුනේම ආපදා සදහා කොරෝනා සම්බන්ධයෙන් අගහිගකම් පිරිමහ ගන්න රුපියල් 5000 දීමනාව දුන්නා. මමත් ගත්තා අපි ගත්ත හේතුව කියන්නම්. අපි ඉල්ලුවෙත් නැහැ. අපි ගියෙත් නැහැ. නමුත් එතනදි දීමනාවක් දෙන අයට දෙන්න කිව්වා. අපි රජයේ සේවයක් නෙවෙයි කරන්නෙ දීමනාවක් ගන්නෙ. ඒක නීත්‍යානුකූලයි කියල කිව්වා. ඒ වගේම යටලමත්ත වසම් තුනේම ගැටලුවක් වුනේ නැහැ. ගැටලුවක් වුනේ නැත්තෙ අපි මුලින්ම පන්සලේ රැස්වීම තියපු වෙලාවෙ. නන්දන මන්ත්‍රීතුමත් මමත් විජිත් මන්ත්‍රීතුමත් සහභාගි වුනා. පස්සෙ මමත් නන්දන මන්ත්‍රීතුමත්

සහභාගි වුනේ නැහැ. කිව්වොත් හැමදේටම යනවා. කිව්වෙ නැති නිසා ගියේ නැහැ. නමුත් හිටිය නිලධාරි අපිත් එක්ක සහයෝගෙන් වැඩ කරන නිලධාරි හිටියා. අපට අඩුපාඩුවක් තියෙනවනම් මොකක්ද කෙරෙන්න ඕන. අඩුපාඩු තියෙනවද කියල ඇහුවම අපි එහෙම කතා කරලා කිසිම කෙනෙකුට අසාධාරණයක් සිදු නොවෙන්න ඒ වසම් තුනේම වැඩකටයුතු කළයි කියලා අපි සතුටු වෙනවා. මම හිතන්නෙ කිසිම ආරවුලක් නැතුව යටලමත්තෙ ඒ රුපියල් 5000 දීමනාව නිසියාකාරව බෙදුවයි කියල කියන්න පුලුවන්. අන්තිම 5000 දෙන දවසෙත් අභියාචනා අටක් ලැබුනා. ඒකත් අපේ ආර්ථික සංවර්ධන නිලධාරි එවලෙම නාගොඩට ගෙනාවා. එතනදි අපේ ග්‍රාම නිලධාරීතුමන්ලා ඒ දීමනාවෙන් අයින් වුනා. ඊට පස්සෙ කටයුතු කළේ කෘෂි පර්යේශන නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී ඒ අය සහභාගි වුනේ. එ අයට ස්තූති වන්ත වෙන්න ඕන. ඇත්තටම යටලමත්ත නැගෙනහිර සේවය කරන අපේ සමෘද්ධි සංවර්ධන නිලධාරි හරිම උනන්දුවෙන් වැඩ කරන මහත්මයෙක්. ඔක්කොටම ඉස්සරවෙලා යටලමත්තට තමයි සල්ලි ගෙනැල්ලා බෙදුවෙ. ඒ නිසා නැවත වාරයක් ස්තූති කරනවා.

ඒ වගේම ගොවිතැන් පොහොර ගැන කතා කළා. ගොවිතැන් පොහොර යටලමත්ත ඌරල ගොවිජන සේවා එකේ ඒ පොහොර ටික කලට කොහොම හරි ගොවිතැන් කරන අයට ලැබුනා. ඒ අඩුවෙන් පොහොර ලැබුන අයට ඊලගට දියර පොහොර එක දුන්නා. දැන් මේ වෙන කොට දියර පොහොර එක දීල ඉවරයි. අපේ කෘෂි පර්යේශන නිලධාරීන් ඒ ගොවිතැන් කරන අයගෙ නාම ලේඛනයට නිවාඩු දවස් දෙකේදි ගෙදර ගෙනැල්ල තමයි බෙදුවෙ. ඇත්තටම යටලමත්තෙ ඒ නිලධාරීන් හොයල බලල වැඩ කරන නිසා අපට කිසි ගැටලුවක් නැහැ.

ඒ වගේම කියන්න ඕන. මාත් එක්ක මගේ ලගින් හිටපු අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය අද වෙන කොට අස්වෙනවයි කියලා තියෙනවා. ඒ අස්වෙනවයි කිව්වට මම හිතන්නෙ කවදාවත් අස්වෙන්න හම්බවෙන්නෙ නැහැ. මොකද ඒ නීති රීති අනුව කටයුතු සිදුවෙන කොට මේ අවුරුදු දෙක යන කොට ඕක සිදු වෙන්නෙ නැහැ. අපි කාන්තාවන් හතක් ඉන්නවා හයක් කර ගන්න. මම කැමති නැහැ. මොකද ආවොත් එන්නෙ පිරිමි පාර්ශවයෙන් එන්න ඉන්නෙ. ඒක නිසා අපි හත්දෙනාගෙන් එක්කෙනෙක් අඩුවුනාම අපි හයක් වෙනවා. කාන්තා නියෝජනය අඩුකර ගන්න අපි කැමති නැහැ.වැඩිකර ගන්න තමයි කැමති වෙන්න ඕන. ඒක නිසා එතුමිය ඒ මහත්මයත් එක්ක සාකච්ඡා කරල හරි මම හිතන විදිහට අලුතින් නමක් මෙතනට යෝජනා වෙලා එන්නෙ නැහැ. මොකද මේ දේශපාලන වාතාවරනෙත් එක්ක ඕව බලන්නෙ නැහැ මේ දවස්වල ඒ වගේම අපේ ජනාධිපතිතුමාටත් සුබ පතමින්, අද දින අපෙන් සමු ගැනීමට බලාපොරොත්තුවන අරුණ ශාන්ති මන්ත්‍රීතුමියට අස්නොවීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමින් ඔබ සැමට සුබ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමනි නැවතත් මදකට අවසර ඉල්ලා සිටිනවා. අපේ ධනංජය මන්ත්‍රීතුමාගෙ කතාවෙදි කියවුනු යම් කාරණා එතුමගෙ හිතේ තියෙන දේවල් හිතනවා ඇති එහෙම හරි කියලා. නමුත් සමහර තැනක කාගෙ හරි කීමකට දෙයක් කියනවනම් ඒක නිවැරදි කිරීම මගේ යුතුකමක් වෙනවා. මොකද මමත් පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදිහට මෙතන මගේ පක්ෂයේම හිටපු ඇමතිවරයෙක්ගෙ නමක් කියවුනා. වජිර අබේවර්ධන මැතිතුමා මට මේ බඩු ගෙනත් දීලයි කියලා. මොකද එතුමත් එක්ක ඉන්න සහෝදර මන්ත්‍රීවරු දන්නවා. එතුමා ගැන සහ එතුමා කොරෝනාවලදි කරපු දේ බොහෝය. නමුත් එතුමා මේකට සම්බන්ධ වුනේ නැහැ. එතුමා පොටෝ එකක් ගැන කියනවා. ඒ පොටෝ එක තමයි තලංගහ වත්තෙ බඩු බෙදපු එක. සභාපතිතුමත් දැක්ක මම හිතන්නෙ ඒක. සභාපතිතුමනි මෙහේ අර හවස රැස්වීමක් වෙලාවෙ මම ඇවිල්ල පෙන්නුවෙ. අද අපි බඩු බෙදන්න පටන් ගත්තයි කියලා ඔබතුමාට පොටෝ එකක් පෙන්නුවා මතකද? අන්න ඒ පොටෝ එක. වජිර ඇමතිතුමා යම් කාර්යයක් කළා. එතනට ආරාධිතයෙක් විදිහට මමත් සහභාගි වුනා. එතන පොටෝ එක තමයි ඒ අපේ අජිත් මහත්තයත් දන්නවා.

ඒක පක්‍ෂ බේදයකින් තොරව තලංගහ වත්තෙ බොතේජු ඩිවිශන් එකේ සම්පූර්ණ ඩිවිශන් එකටම බඩු බෙදුවා. ඒ ස්ථානයට මම ගියපු පොටෝ එකක් තමයි මෙතුමා කියන්නෙ. ඒක අයිති යක්කලමුල්ලට. දෙගොල්ලම ඉන්නවා. මායිමේ වෙච්ච සිද්දියක් අජිත් මහත්මයගෙ කණ්ඩායමේ එතුමට දැඩිව උදවු කරන පිරිසකුත් එතන ඉන්නවා. ඒ නිසා තමයි එතන බෙදුවෙ. අපි ගිහිල්ල එතන ඒ උත්සවයට සහභාගි වුනා. ඒ කටයුත්ත කළේ එතුමා. විශේෂයෙන්ම මම කියන්න ඕන අපේ කණ්ඩායමේ හත්දෙනෙක් ඉන්නවා. මෙතුමන්ල හිතාවි වජිර ඇමතිතුමා ලොරියකින් මට විතරක් බඩු ගෙනැල්ල දීලයි කියලා. හාල් මිටි 250 ක් 300 ක් මට කරේ ගේන්න බැහැ. ලොරියකින් තමයි ගෙනාවෙ. ඒකට හේතුවත් මම කියන්න ඕන මේ අවස්ථාවෙදිම. ගරු සභාපතිතුමනි මගේ ආත්තම්ම නැතිවුනාට පස්සෙ හැම අවුරුද්දකම එතුමියගෙ ඒ දිනේට බඩු බෙදුවා. මේ සැරේ කරපු එකක් විතරක් නෙවෙයි. මේ කොරෝනා වසංගතයත් එක්ක මාර්තු මාසෙ මගේ පුද්ගලික මුදලුත් මගේ තිබුනා සමිතියක් ඒ සමිතියෙ මුදලක් එකතුවෙලා තිබුනා. ඒ මුදලුත් දාල තමයි මේ ව්‍යාපෘතිය කළේ. විලේගේ මන්ත්‍රීතුමා ඔබතුමා කියපු දෙයක් නෙවෙයි මෙතන සිදු වුනේ. ඔබතුමා දන්නෙ නැත්නම් ඔබතුමා කාටහරි කිව්ව නම් ඔබතුමා අවශ්‍යනම් නිවැරදි කරන්න. වෙච්ච සැබෑ සිද්දිය ඒකයි. ඒ ගැන එතනින් එහා මම ඔබතුමාට උත්තර දෙන්න යනවා නෙවෙයි. සභාවෙ 27 දෙනෙක් ඉස්සරහ ඔබතුමා කතා කළාම මේක නිකන් බොරුවක් සමාජ ගත කරන්න මම කැමති නැහැ. මෙතන ඉන්න මන්ත්‍රීවරුත් දන්නවා මම ගැන. සභාපතිතුමත් දන්නවා. මම සමාන්‍යයෙන් යම් දෙයක් කළොත් ඔබතුමත් යම් දෙයක් කළා. ඔබතුමාගෙ 15000 ක දීමනාවෙන් ඇත්තටම මෙතුම අපේ ගෙදරටත් ඇට පැකට් එකත් දුන්නා. මම සතුටු වුනා මම කවදාවත් විවේචනය කරන්න ගියේ නැහැ. නමුත් ඔබතුමා සමහර තැන්වල ගිහිල්ල කියල තියෙනවා. අපි මෙහෙමයි දෙන්නෙ කියලා. මෙහෙමයි මම පුද්ගලිකව කරපු කටයුත්තක් නිසා මට හැමෝටම දෙන්න බැරි වුනා. නමුත් විශාල ප්‍රමාණයකට මම මේක දුන්නා. හොර හොරා නෙවෙයි ප්‍රසිද්ධියෙ දුන්නෙ. අනිත් එක කාටවත් ගිහිල්ල නෙවෙයි දුන්නෙ. කොහෙවත් ගෙවල්වලට ගිහිල්ල රෑට රෑට දුන්න නෙවෙයි. ඒ සියල්ලම මට මොනව හරි කටයුත්තක් කියාගෙන ආපු මගෙන් ඉල්ලීමක් කරපු අය අපට මේ දවස්වල ජීවත් වෙන්න අමාරුයි රස්සාවල් නැහැ. ඒ සියලුම ඒවයි 80% ක් විතර පොටෝ තියෙනව මම ගාව. මගේ ගේ මිදුලෙදි තමයි ඒ දීපු සියල්ලම දුන්නෙ. ඒක නිසා ඔබතුමා කියපු දේවල් දන්නෙ නැත්නම් නිවැරදි කර ගන්න. සමහර ස්ථානවලට මෙතුම ගිහිල්ල කියල තියෙනවා. සමහර අපේ දේශපාලනයේ අපට උදවු කරපු පක්‍ෂයේ අයට ගිහිල්ල කියල තියෙනවා. අන්න මන්ත්‍රීතුමා පක්‍ෂයේ අයට බඩු බෙදනවා මෙහෙමයි කියලා. ඒ අය මට කතා කරලා අහනවා මොකක්ද කියලා ඒ අයට මම කිව්වා අසවලා තමයි කිව්වෙ කියලත් මට කිව්වා. මම කිව්වා එහෙම දෙයක් නෙවෙයි මෙහෙම වෙන්නෙ මෙහෙම දුප්පත් නැති බැරි මිනිස්සුන්ට මම ඔබතුමාට අවශ්‍ය වුනොත් පෙන්නන්නම් පොහොට්ටුව තොප්පියක් දාගෙන ආපු මනුස්සයෙක් ඔබතුමා දන්නවා ඒ කවුද කියලා. මම නම නොකිව්වත් පොහොට්ටුව තොප්පියක් දාගෙන ඇවිල්ලා බඩු මල්ලක් ගත්තු මනුස්සයෙක්ගෙ පොටෝ එකක් මගේ අතේ දැනුත් තියෙනවා. මම ඒ කාගෙවත් නම් කිව්වොත් ඒ මිනිස්සුන්ට අපහාසයක් ඒ හින්ද මම නම් කියන්න යන්නෙත් නැහැ.පොටෝ දාන්න යන්නෙත් නැහැ. දුප්පත්ද පොහොසත්ද ඒව දැක්කොත් ඒවට උත්තර දුන්නොත් මමත් ඔබතුමාගෙ ගානට වැටෙනවා. මොකද මෙන්න මෙයාලට තමයි මම දුන්නෙ. කියන්න ගියොත් ඔබතුමාට කරන්න බැරිවෙච්ච දෙයක් මට වැඩිය ඔබතුමාට කරන්න තිබුනා. ඔබතුමා ගම්වලට ගිහිල්ලා, ගෙවල්වලට ගිහිල්ලා, ගෙවල්වල ඉන්න මිනිස්සුන්ට වරදි දේවල් මේ සභාවෙ කතා කරලා ඔබතුමා කිව්වා රුපියල් 5000 දීමනාවෙ ලිස්ට් එක ගැන දැන් ඔබතුමා කියනවා. මම ලිස්ට් එකක් හදාගෙන ගියාලු. සභාපතිතුමනි අද අස්වෙන්න ඉන්න මන්ත්‍රීතුමියත් එතනට ගියා. එදා කිසිම කරුණු වලින් තොරව තමයි සාකච්ඡාව ආරම්භ කළේ. ඔබතුමා ඔබතුමාගෙ පෝලිම් හුත් එකේ ඉන්න කණ්ඩායමත් එක්ක ඒකට ඇතුල්වෙලා මම තනියෙන් ගියේ ඔබතුමා ඒ පෝලිම් හුත් එකේ ඉන්න සියලුම කණ්ඩායමත් එක්ක 20 ක් 25 ක් විතර එක්ක ඔබතුමා ඇතුල්වෙලා, ඔබතුමාලා ඊට කලින් දවසෙ ගෙවල්වල කණ්ඩායම් හැදිලා ලිස්ට් හදලා ඒ ගොල්ල ගෙනා ලිස්ට් එක තමයි ග්‍රාම සේවකට දුන්නෙ. සභාපතිතුමනි, මේකට උත්තරය දැන් නොදුන්නොත් මේ

බොරුවට හැමෝම හිතන්නෙ ඇත්ත කියලා . ඔබතුමා දන්නවා මේ සභාවෙ කතා කරන දේවල් මොනවද එතුමන්ල ගැන මම නෙවෙයි ඔබතුමාලගෙ කණ්ඩායමම දන්නවා. එතනදි එයාල ලිස්ට් එකක් හදාගෙන කණ්ඩායමකුත් එක්ක ගිහිල්ලා. ඒක දෙනවා ග්‍රාම සේවක අතට. අද අයින් වෙන මන්ත්‍රීතුමියත් එතන හිටියා. ඒ ලිස්ට් එක තමයි ග්‍රාම සේවකට කියවන්නෙ. මමලු ලිස්ට් හැදුවෙ. ඊට පස්සෙ ඕකෙ නැති නම් ගැන මම නමින් නමට ඇහුවා මෙයාගෙ නම තියෙනවද? මම ඒ එක නමක්වත් සංශෝධනය කළේ නැහැ. ඊට පස්සෙ මෙතුමා ඒකට නමක් කියලා කිව්වා. ඒ නමට හැමෝම කණ්ඩායමම විරුද්ද වුනා කියලා. ඇත්තටම එතනදි විරුද්ද වුනා. මම හගරංවල පැත්තෙ දුප්පත් මනුස්සයෙක්ගෙ නමක් කිව්වා. අම්මයි තාත්තයි ගෙදර ඉන්නවා ළමයි රස්සාවල් කරනවයි කියල දෙන්න බැහැ කිව්වා. නමුත් ඔබතුමා අද වගකීමෙන් කියනවා එයාට 5000 දුන්නයි කියලා. මම වගකීමෙන් කියනවා ඒ 5000 මෙයාල දුන්නා. මෙයාල බැලුවා අපි ගිහිල්ල මේක දැම්මොත් මෙයාලට හරි නැහැ හොඳ මදි. අන්න ඒ වගේ වැඩ තමයි මෙතන කළේ. ඒක නිසා ගරු සභාපතිතුමනි ඒ කියන දේවල් ගැන මේ සභාවෙ කතා කරනකොට චුට්ටක් වගකීමෙන් කතා කරන්න ඔබගේ කණ්ඩායමේ අයට උපදෙස් දෙන්න. මේ වගේ කියන්නන් වලේ කටට එන්නන් වාලෙ මිනිස්සුන්ට ඕන දෙයක් කියන්න පුලුවන්. නමුත් චෝදනාවක් කරනවනම් හේතුවක් ඇතුව හරි විදිහට චෝදනා කරන්න. මගේ පුද්ගලික මුදලින් මට ඕන කෙනෙකුට බඩු දෙන්න පුලුවන්. එතුමත් ඕනනම් දෙන්න ඔබතුමත් 15000 ඇට බෙදුව වගේ ඔබතුමාට ඕන අයට මම බෙදුවෙ මට ඕන අයට. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන් මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අද දින අපෙන් සමුගන්නට යෙදෙන අරුණ ශාන්ති මන්ත්‍රීතුමියගේ සමුගැනීම පිළිබඳ මටත් හරිම දුකයි. මොකද මගේ සහෝදරියක් වගෙයි. විනෝද චාරිකා පවා යද්දි මගෙන් තමයි අහන්නෙ අක්කෙ ඔයත් යනවද? ඔයා යනවනම් විතරයි මම යන්නෙ. එහෙම කියලා මා සමග ගොඩක්ම ලගින් ඇසුරු කළා. ඒ නිසා ඇත්තටම දුකයි ඇයගේ සමුගැනීම පිළිබඳව. මම ඇග් අනාගතය සරවප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පහුගිය දිනවල ගොවිතැන් වගා කිරීමේදී මලාමුර ප්‍රදේශයට නම් නොමිලේ වී ලබා දෙනවා කිව්වට සියලු දෙනාටම වී ලැබුනෙ නැහැ. අන්තිමට ගොවි සංවිධානෙන් ලක්ෂ එකහමාරකටත් වැඩිය මුදලක් වැය කරලා. ගොවි සංවිධානෙ මුදල්වලින් ගොවීන්ට වී අරගෙන දෙන්න සිදු වුනා. ඒකට අන්තිමට පොලිසි පවා යන්න සිදු වුනා. එතුමා ගොවි සංවිධානෙට වී අරන් දුන්නා කියල මගේ මහත්තයට කෝල් කරලා කිව්වා. එතුමා දන්නවා ඩීඕ මිසුත් කිව්වා ගොවිජන සේවා එකේ ඒ වගේම පොහොර වුනත් මම හිතන්නෙ ලැබිය යුතු ප්‍රමාණයෙන් 50% ක් වගේ තමයි මලාමුර ප්‍රදේශයේ අයට නම් ලැබුනෙ. වෙනද ලැබුන ප්‍රමාණයෙන් 50% ක් ප්‍රමාණයක් තමයි ලැබුනෙ. ඒ වගේම මලාමුර ආදර්ශ ගම්මානයේ තියෙන නල ළිද යථා තත්වයට පත්කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා..

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි මමත් නැගී සිටියේ අපේ ගරු මන්ත්‍රීතුමියට සුබ පතන්න. අපි දෙන්නම ගෝනදෙනිය ගමේ ගෝනදෙනිය පාසලේ ඉගෙන ගත්තා. එදා ඉදල අද වෙනතුරුත් අපි ඉතා සහෝදරත්වයෙන් ආශ්‍රය කළා. එතුමිය අද ඉවත් වීම උඩුගම කොට්ඨාසයට විශාල පාඩුවක්. දේශපාලන කටයුතුවලින් ඉවත් වුනත් සමාජසේවා කටයුතු දිගටම කරගෙන යන්න කියල අපි ඉල්ලා සිටිනවා. එතුමිය උඩුගමටත්, මටත් විශාල ශක්තියක් වුනා. තව කණගාටුවක් තියෙනවා කාන්තා පාර්ශවයේ එක්කෙනෙක් අඩු වීම පිළිබඳව. අපි ප්‍රාර්ථනා කරනවා එතුමියගේ ඉල්ලා අස්වීමේ ලිපිය භාර නොගෙන එතුමියට ඉන්න ලැබෙන්න කියලා. එතුමයට මම සුබ පාර්ථනා කරනවා. එතුමියගේ ඉදිරි ගමන සාර්තක වෙන්න කියලා.

ඒ වගේම මේ අවස්ථාවෙ අපේ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මම ස්තූති වන්ත වෙනවා. රට පක්ෂ පාට බේදයක් නැතුව ආපු මේ කොරෝනා අවස්ථාවෙ රටක් විදිහට එතුමා තීරණ ගත්තා. පහුගිය පාස්කු ප්‍රහාරය එල්ල වුන වෙලාවෙ අපි දැක්කා. දවස් දෙකතුනක් යන කොට රටේ ඇතිවෙච්ච තත්වයත් මමත් ජනාධිපති වරණයට ඉදිරිපත්වෙනවා කියලා බොරදියේ මාලු බාන්න හිටපු මොහොතක එතුමාගේ මහත්මා දේශපාලනයට මේ වෙලාවෙ මම ගෞරවය පුද කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම නැගිට්ටෙ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන්න නෙවෙයි. අද දිනයේ අපේ සභාවෙන් අයින් වෙච්ච අස්වෙලා යන අරුණ ශාන්ති බෝදරගම අපේ සහෝදර මන්ත්‍රීතුමිය ගැන කතා කරන්න. ගරු සභාපතිතුමනි අපි නවක මන්ත්‍රීවරු විදිහට මේ සභාවට එද්දි, කෙලින් කතා කරන්න පුලුවන්, වැරදි තැනට වැරදිය කියල කියන්න පුලුවන්, හරි තැනට හරිය කියල කියන්න පුලුවන් කෙනෙක් හිටියනම් අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය. ඒක මේ වෙලාවෙ මතක් කරන්න ඕන. මොකද අපේ කොට්ඨාසවලත් අඩු පාඩුවක් තියෙනවනම් එතුමිය අපට කතා කරල කියල ගිහිල්ලා ඒ වැරදි අඩුපාඩු පෙන්වා දෙනවා. අපි මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් මේ අවුරුදු දෙක තුල ලබා ගත්ත දේ බොහොමයි. ඒ නිසා ඉදිරි අවුරුදු දෙක තුලත් අපිට මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් ලබා ගන්න බොහෝ දේවල් තියෙනවා. ඒක නිසා අපි මෙතනට ආවෙ නවක මන්ත්‍රීවරු විදිහට ඒ නවක මන්ත්‍රීවරු ගොඩක් එනකොට ඒ අතර හිටපු දක්ෂ මන්ත්‍රීවරියක් තමයි බෝදරගම මන්ත්‍රීතුමිය. ඒක නිසා මම හිතන්නෙ අපේ සභාවට කාන්තා නියෝජනයක් අඩු වෙනව වගේම හරි වැරැද්ද පෙන්නල දෙන්න පුලුවන් හොඳ මන්ත්‍රීතුමියක් තමයි අපට අද සභාවෙන් අයින් වෙන්නෙ. ඒක නිසා ඉල්ලා අස්වීමේ ලිපිය භාර නොගෙන ඒ මන්ත්‍රීතුමියට නැවත වාරයක් සභාවට එන්න වාසනාව සැලසේවා කියල තමයි අපේ ප්‍රාර්ථනාව. මොකද අපිත් එක්ක කොහේ හෝ ගමනක් ගියත් හැම තැනකදිම ඉතා සහයෝගෙන් වැඩ කළා. පක්ෂ පාට බේද අපි කාගෙවත් ලග තිබුනෙ නැහැ. සභාපතිතුමා ඇතුලු අපි 27 දෙනාම සමගියෙන් වැඩ කළා. වෙන සභා එක්ක බලද්දි ගහ මරා ගන්න වෙලාවක, මේ පුංචි කතාබහකින් පුංචි හිත් රිදීමක් වුනත්, එලියට ගියාම ප්‍රශ්නෙ විසදෙනවා. අපේ බෝදරගමගේ අරුණ ශාන්ති මන්ත්‍රීතුමියත් ඉතාමත් දක්ෂ විදිහට මහත්තයත් දේශපාලනය තුලින් පක්ෂ පාට බලන්නෙ නැතුව සියලු දෙනත් එක්ක සහයෝගෙන් වැඩ කළා. ඒක නිසා අපිටත් හොඳ ආදර්ශයක් දුන්න අක්ක කෙනෙක්. මේ වෙලාවෙ මන්ත්‍රීතුමියක් වුනත් මට අක්ක කෙනෙක්. ඒක මේ වෙලාවෙ මතක් කරන්න ඕන. මම එතුමියගෙන් ඉල්ලීමක් කරන්නෙ. සභාවෙන් අද අයින් වෙල ගියත් අපේ අඩුපාඩුවක් තිබ්බත් අපට කතා කරල කියන්න. සමන් මල්ලි මෙතන අඩුපාඩුවක් තියෙනවා. මේ දේ හදා ගන්න කියලා. ඒක නිහතමානීව මේ වෙලාවෙ මතක් කරන්න ඕන. මෙතෙක් මේ අවුරුදු දෙකතුල අපේ අඩුපාඩුවක් දැක්ක නම් අක්ක කෙනෙක් විදිහටත් මන්ත්‍රීතුමියක් විදිහටත් අපට කතා කරල කියපු වෙලාවල් තිබුනා ඒක නිසා මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් තව ලබා ගත්ත දේවල් අපට ගොඩාක් තියෙනවා මේ අවුරුදු දෙකට. ඒක නිසා මම නැවත වාරයක් අන්තිම මොහොතෙත් ප්‍රාර්ථනාවක් කරන්නෙ. එතුමියගේ ඉල්ලා අස්වීමේ ලිපිය භාර නොගෙන එතුමියට නැවත වාරයක් මේ සභාවට එන්න වාසනාව සැලසේවා කියා ප්‍රාර්ථනා කරමින් එතුමියගේ ඉදිරි අනාගතය වාසනාවන්ත අනාගතයක් වෙන්න කියල ප්‍රාර්ථනා කරනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි මේ වෙලාවෙ බොහෝ කාලය ඉක්ම ගොස් තිබුනත්. සභාවේ දීර්ඝ කාලයක් සභාව පටන් ගත්ත දවසේ ඉදල අද දක්වා. සභාවේ කාන්තා මන්ත්‍රීවරියක් හැටියට කටයුතු කළ අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය අද දිනයෙදි ඉල්ලා අස්වීම සභාගත කරලා. ඇය සභාවෙන් බැහැර යන වෙලාවෙ. ඇයට සුබ පතන එක අපේ යුතුකමක් වෙනවා. කාන්තාවක් වුනත් සභාවේ මන්ත්‍රී ධූරයක් ලබා ගනිමින් යමක්

කරන්නට උත්සාහ ගත්තා. මන්ත්‍රී ධූරය කියන එක සැබෑවටම තේරුම් අරගෙන කටයුතු කරපු මන්ත්‍රීවරියක් හැටියට සභා කාලය තුලදි මේ සභාවට වගේම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න හැකිවීම කාන්තාවක් වුනත් ඇය ලද භාග්‍යක් හැටියට සලකනවා. ඇය මන්ත්‍රී ධූරයෙන් යාම යම් මට්ටමකින් කාන්තා නියෝජනය වෙනුවෙන් හඬනගන්න තිබුන හොඳ හඬක් අහිමි වීමක් වෙනවා. ඒ කෙසේ වෙතත් ඇයගේ පෞද්ගලික තීරණයට මූලිකත්වය ලබා දෙමින් ඇයට අපි පෞද්ගලික ජීවිතයට සුබාසිරි පතනවා.

පළමුවෙන්ම ගරු සභාපතිතුමනි මට මතක් කළ යුතු කරුණු කීපයක් තියෙනවා. ඉතාම කෙටියෙන් මම ඒක මතක් කරනවා. ගරු සභාපතිතුමනි අර විදුහල්පතිතුමා සඳහන් කළා වගේ නාගොඩ ගම්මැද්දෙගොඩ කොට්ඨාසයෙන් පටන්ගෙන උඩවැලිවිටිය දක්වා යන මාර්ගයේ ඉදි කරන පාලම හරියට තවම වැඩ ඉවරත් නැහැ. ඉතාම කෙටි වතුරකටත් යට වෙන තත්වයකට තියෙනවා. ඒ සඳහා සභාව මැදිහත් වෙලා. අදාල සමාගම් සමග සාකච්ඡා කරලා තව පොඩ්ඩක් ඒ පාලම උස්සලා සකස් කරන්න කටයුත කරන්න කියන ඉදිරිපත් කිරීම මම කරනවා. ඉංජිනේරු මහත්මයට මම කතා කරපු වෙලාවෙ එතුමා කිව්වෙ එය කිරීමේ හැකියාවක් තියෙනවයි කියන එකත් සඳහන් කළා. ඒ වගේම මේවගේ කාරණයකදි ඒ කොන්ක්‍රීට් එක දාන්න ඉස්සෙල්ල අපි ලිඛිත ඉල්ලීමක් කළ යුතුය කියන එක සඳහන් කළා. ඒක නිසා මේ ගරු සභාවේ අවධානය ඒ සඳහා යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම තල්ගස්වල පොල සම්බන්ධයෙන් මේ වෙලාවෙ විවේචනයක් නෙවෙයි. සැබෑ තත්වය පිළිබඳව අපට ඒකෙ තියෙන එක දෙයක් තමයි අපට අපේ පියල් මන්ත්‍රීතුමා සඳහන් කළා. පොලකාසි නොගෙන මාස ගණනක් පොල කරන්න අවස්ථාව දෙන්න කියලා. නමුත් ඒක ඊට වැඩිය එහා ගිය පැත්තක් තියෙනවා. පොල අපට අහාවයට යන්න හේතුව එකක් තමයි ඒ පොලකාසි එකතු කරන පුද්ගලයා එදා පොල දවසට වෙලදුන්ට ආමන්ත්‍රණය කරන විදිහ ඉතාම පහත් තත්වෙක තියෙන අවස්ථා තියෙනවා. අනිත් එක තමයි අපි පැලයක් හිටෙවුවම ඒකට හොඳට වතුර දාල පොහොර දාල තමයි ඒකෙ එල නෙලාගන්නෙ. අපි පොල ටෙන්ඩර් දීල එතුමාගෙන් සල්ලි ටික බලාපොරොත්තු වෙනවා. ඒ ඇරෙන්න පොල පිළිබඳව අපි මීට වැඩිය අවධානය යොමු කරන්න ඕන. පොල ඇතුලෙ විදුලිය ප්‍රශ්න තියෙනවා. පීලිවල ගැටලු තියෙනවා. මේක අපේ ගරු සභාපතිතුමාට කරන චෝදනාවක් නෙවෙයි. එදා ඉදල ආපු දෙයක් මේක. ඒක ඇතුලෙ තව ඉඩ කඩ තියෙනවා. ඒ ඉඩ ප්‍රයෝජනයට අරගෙන අපට වාහන පාක් එකක් හදන්න පුලුවන්. ඒ වගේ කාර්යයන් ගොඩක් කරලා ඔය පොල ඔයිට වැඩිය තත්වෙකට ගේන්න පුලුවන්කම තියෙනවා. ඒක නිසා පොල පිළිබඳ ඔයිට වැඩිය අපි අවධානය යොමු කරන්න ඕන. සමහර දවසට පොල කඩ කාමරවල ගිය සතියෙ තියපු ස්ටූල් එකවත් ඊලග දවසෙ එනකොට එතන නැතිලූ. අන්න ඒ වගේ තත්වයක් තියෙනවා. ඒ පිළිබඳව අපි සභාවෙ හැම දෙනාටම වගකීමක් තියෙනවා. කොට්ඨාසෙ මන්ත්‍රීතුමාටත් ලොකු වගකීමක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම ඒ නිසා මම යෝජනා කරනවා. අපි ඒ පිළියම් ටික යෙදුවොත් අපට ලොකු අපහසුවක් වෙන එකක් නැහැ. පොල පවත්වාගෙන යන්න. ඇදිරිනීතිය කාලය තුලදී අතන මිනිස්සු ගැවසෙන නිසා තමයි වෙලෙන්දො එතන වෙළදාම් කළේ. බස් නැවතුම්පොල තුල දීර්ඝ කාලීනව කරගෙන යාමේ හැකියාවක් නැහැ. මම හිතන්නෙ නැහැ අපට ඒක ලොකු බාධාවක් වෙයි කියලා. නමුත් අපේ පොලේ තියෙන අඩුපාඩු ටික හදලා. පොල ටෙන්ඩර් දීපු කෙනා දිහාම විතරක් බලන් ඉන්නෙ නැතුව අපේ සභාවෙන් ඒ පිළිබඳ නිරන්තරයෙන් හොයල බලල කටයුතු කළොත් සාර්ථක කරගන්න පුලුවන් කියන එක මේ වෙලාවෙ මම සඳහන් කරනවා.

ඒ වගේම තමයි හැමෝම සඳහන් කළා. රුපියල් 5000 දීමනාව පිළිබඳව. අපි සතුටු වෙනවා. අපේ ඉනෝකා මන්ත්‍රීතුමියත් මමත් අපි දෙදනාම එකතුවෙලා ඒ කමිටුවෙන් පක්ෂ පාට බේදයකින් තොරව උඩවැලිවිටිය කොට්ඨාසෙ අපි ලබා දුන්නා. ඒ මන්ත්‍රීතුමියත් මම කතා කරල කිව්වා. ඔයාගෙත් දෙන්න තියෙන මොනව හරි අඩුපාඩු තියෙනවනම් මෙන්න මේ අයට දෙනවා. ඇයටත් මම මේ වෙලාවෙ ස්තුතිය

ප්‍රකාශ කරනවා. නිහතමානීව ඇවිල්ල ඒ කටයුත්ත හොයල බලල අවශ්‍ය පහසුකම් අපට සපයල අපි නිවැරදිව උඩවැලිවිටියට දේශපාලන නායකත්වය දුන්නා. ඒ හරහා උපරිම දෙන්න පුලුවන් සියලුම දෙනාට රුපියල් 5000 ලබා දීලා ඒ කටයුතු කළා. ඒ කටයුත්ත සඳහා අපට ශක්තිය දායකත්වය ලබා දුන් ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයටත් මේ වෙලාවෙ අපේ ගෞරවය ප්‍රධානය කරනවා.

ඒ වගේම හැමෝටම ආපු ප්‍රශ්නයක් මේ පොහොර ප්‍රශ්නය. ඔරොත්තු දෙන්නෙ නැති අපි බලාපොරොත්තු නොවෙච්ච වගා ප්‍රමාණයක් මේ ලංකාවෙ මේ කන්නයේ සිදු වුනා. ඒ වගේම මේ කොරෝනා වෛරසය හේතුවෙන් යම් යම් අවස්ථාවල පොහොර ආනයනය කිරීමේ අපහසුතාවන් වලටත් මුහුණ දෙන්න සිදු වුනා ඒ නිසා රජයක් හැටියට ලොකු අපහසුතාවකට පත් වුනා. පොහොර ඉල්ලුම ගිය සැරේට වඩා ඉතාම ඉහල ගියා. ඒකයි පොහොර හිගයක් රටතුල නිර්මාණය වුනේ. ඉදිරි කාලයෙදි ඊයෙ වෙනකොටත් රටට අවශ්‍ය පොහොර ප්‍රමාණය ලැබෙමින් පවතිනවා. ඒ නිසා තමයි පොහොර පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගුනේ.

අපේ විපක්ෂ නායතතුමා විශේෂයෙන් සඳහන් කළා. කුළු බඩු මිලයි බඩු මිලයි ඉහල යනවයි කියලා. තර්කයක් විතර්කයක් නැතුව ඒක අපි පිළි ගන්නවා. මේ කාලය තුලදි ඒක සිදු වෙනවා. හැබැයි අපිට ලැබෙන ආදායම් විශේෂයෙන් තේ දල්ලට ලැබෙන මිල ඉතිහාසෙ වාර්තා ගත ආදායමක් ලබා දුන්නා. ඒ නිසා අපට පොඩි ආඩම්බරයක් තියෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ වෛද්‍ය රමේෂ් පතිරණ ගරු ඇමතිතුමා ඒකට නායකත්වය දීලා. ඒ කටයුත්ත සාර්ථකව කරපු නිසා අපි හැම දෙනාටම ඉතා විශාල මුදලක් අපේ කුඩා තේ වතු හිමියන්ට ලබන්න පරිසරය නිර්මාණය කළා. ඒ පිළිබඳ අපේ දිස්ත්‍රික් නායක වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාටත් ගෞරවය ප්‍රණාමය පුදකරනවා.

ඒ වගේම අපි තව එක දෙයක් සඳහන් කරන්න ඕන. ගරු සභාපතිතුමනි මම මේ මතක් කිරීමක් පමණයි මේ කරන්නෙ. නාගොඩ ප්‍රාදේශීය සභාව තුලම අපට තියෙන ලොකුම ප්‍රශ්නයක් තමයි. සෑම මාර්ගයක්ම අර මානා වගේ කැලෑවකින් වැහිල ගිහිල්ලා. ඒක කොච්චර කපලා ඉවර කරන්න හැදුවත් ඉවර කරන්න බැහැ. මේ නාගොඩ ප්‍රාදේශීය සභාව තුලම ප්‍රාදේශීය සභා පාරක යන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. ඒක නිසා සාමූහිකව එකගතාවයකින් මේ පිළිබඳව ඇත්ත වශයෙන්ම සාකච්ඡා කරලා. ඒ කටයුත්තට විශේෂ මොකක් හරි අඩුතරමින් කපලා බෙහෙත් ගහන්න හරි මොකක් හරි විශේෂ වැඩපිළිවෙලකින් මේක ඉවත් කරන්න කටයුතු කරන්න. මේක නොකළොත් අපට රිය අනතුරු වැඩි වෙනවා. ඒ වගේම පාරෙ යන්නම බැරි තත්වෙට පත්වෙලා තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් සිහිපත් කරනවා.

ඒ වගේම අපි කරන ලද කොන්ක්‍රීට් පාරවල් පහුගිය සෑම රජයකින්ම අපි සංවර්ධන කටයුතු කළා. නමුත් අපේ නඩත්තුවක් නැතිකම සමහර කොන්ක්‍රීට් පාරවල දණකට වැඩිය උසට පස් කඳු තියෙනවා. ඒ වගේම තාර පාරවල්වල පස් කඳු ගොඩ ගැහිලා. හේතුව අතුරු පාරවල්වල වතුර පාරට හරවලා තියෙන්නෙ. ඒක නිසා ප්‍රාදේශීය සභාව හැටියට අපට ලොකු වගකීමක් තියෙනවා. මෙන්න මේ කාර්යයන් ගැන පොඩි හරි පසු විපරමක් කරලා. අපි දාපු පාරවල් ටිකේ හරි නැත්නම් අපට මුදලක් නැහැ. සභාවෙන් පාරවල් හදා ගන්න. අමාරුවෙන් හරි සෑම රජයකින්ම මේ කරපු කොන්ක්‍රීට් ටික සවුත්තු වෙනවා. මේ පස් ගොඩ ගැහිල තියෙන නිසා. ඒ නිසා සමහර තැන්වල කොන්ක්‍රීට් එක උඩ නෙවෙයි යන්නෙ. මඩවලේ යන්නෙ. මොකද පාරවල් හෝදගෙන ඇවිල්ලා.මේක හැම කොට්ඨාසයකම තියෙනවා. මේ පිළිබඳව මේ ගරු සභාවේ විශේෂ අවදානය යොමු කරලා පොදුවේ ඒ සඳහා කටයුතු කරන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම කරනවා.

ඒ වගේම කතා කළයුතු බොහෝ දේ තියෙනවා. නමුත් මම මේ දේ කතා කළොත්, විශේෂයෙන් මේ මන්ත්‍රීවරු නෙවෙයි නිලධාරී මහතවරු මාත් එක්ක තරහ වේවි. ඒක නිසා මම මේ පිළිබඳ කතා කරන්නෙ නැහැ. කතා කළයුතු ගොඩක් දේවල් තියෙනවා. අපි අපිම ස්වයං විවේචන කර ගත්ත යම් යම්

අවස්ථාවලදී. ඒක නිසා අපි ගරු ලේකම්තුමියට සිහිපත් කරනවා. මේ සභාවේ සංවර්ධන කාර්යයන් කෙරෙද්දී ඔබට නිලධාරි හරහා දෙන්න පුලුවන් සහය ශක්තිය ලබා දෙන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම කරනවා.

ඒ වගේම මේ වෙලාවෙදි මම අවසාන වශයෙන් සඳහන් කරනවා. අපේ ප්‍රදේශයේ නාගොඩ පොලීසිය සම්බන්ධයෙන් ඉතාමත් විවේචන තියෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් ලිඛිතව හරි පොලිස්පතිතුමා දැනුවත් කරන්න. ඒ කරන කටයුතු මම මේ වෙලාවෙ ප්‍රසිද්ධියෙ කියන්න කැමති නැහැ. මම විශේෂයෙන් සිහිපත් කරනවා. ඔය නාගොඩ පොලීසිය මීට වඩා යාවත්කාලීන කළ යුතුයි. මොකද දැන් ප්‍රදේශයේ මත් ද්‍රව්‍ය විතරක් නෙවෙයි. ගම්වල ඉන්න ජාවාරම් කාරයො තමයි පොලීසියට සම්බන්ධ වෙලා ඉන්නෙ. මන්ත්‍රීවරයෙකුට කතා කරලා හොඳ මිනිහෙක්වත්, මොනම දෙයක්වත් බේරා ගැනීමේ හැකියාවක් නැහැ. නමුත් ගම්වල ඉන්න ජාවාරම් කාරයො හවසට ඒ ගොල්ලොත් එක්ක තමයි මේ කට්ටිය ගිහිල්ල සම්බන්ධ වෙලා කටයුතු කරන්නෙ. ඒ නිසා මේ පිළිබඳව ලොකු විවේචනයක් විශේෂයෙන් අපි රජය හැටියටත් මම ඇත්තටම රජය පැත්තෙන් කණගාටු වෙනවා. සභාපතිතුමාටත් මේකට කරන්න දෙයක් නැහැ. නමුත් මේ පිළිබඳව අපි යාවත්කාලීන කළ යුතුයි. මේ නාගොඩ පොලීසියේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අදාල ඉහල නිලධාරීන් දැනුවත් කරලා. වැඩපිළිවෙලක් හදන්න කියන ගෞරණීය සිහිපත් කිරීම සභාපතිතුමාට කරමින් සියලුදෙනාට සුබ අනාගතයක් පතමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය**

ගරු සභාතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මම පලමුවෙන්ම මේ වෙලාවෙ අවදානය යොමු කරනවා. මාපලගම තල්ගස්වල හොරංගල්ල මාර්ගය මේ වනවිට පසුගිය රජය විසින් ලක්‍ෂ නවසිය විසි හතක් යොදා ගනිමින් වැඩ ආරම්භ කරපු මාර්ගය දැනට වැඩ නතර කරල තියෙනවා. ඒ නතර කරපු ස්ථානවල අවදානම් සහිත ස්ථාන කිහිපයක් තියෙනවා. පහුගිය දවසක අපේ සංවර්ධන නිලධාරිතුමියක් බයිසිකලෙන් ගමන් කරද්දි වැටිලා තියෙනවා. එම නිසා ඒ අදාල ආයතන දැනුවත් කරලා. ඔබතුමාගෙ අවදානය යොමු කරලා, ඒ මාර්ගයේ නැවත වැඩ ආරම්භ කිරීමට සලසා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි අපේ ලක්රුවන් මහත්තයා මතක් කරපු විදිහට ගම්මැද්දෙගොඩ උඩවැලිවිටිය මාර්ගයේ ඉදිකරමින් පවතින පාලම ඒ පිළිබඳව පාලම් ව්‍යාපෘතියෙ අදාල නිලධාරීතුමා තරංග මන්ත්‍රීතුමා සඳහන් කළ විදිහට කීර්ති මහත්මය සමග මම කතා කළා. ඒ පාලම පහුගිය දවස්වල  සුලු ගංවතුරෙදිත් පාලමක් නැති ගානට යට වුනා. ඒ නිසා ඒක අපට වෙනස් කර ගැනීමේ හැකියාවක් තියෙනවා. ඔබතුමාගේ ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළොත් පුලුවන් කමක් තියෙනවා වෙනස් කරගන්න. මම ඔබතුමා දැනුවත් කළා. මම එතුමාගෙ පෞද්ගලික දුරකතන අංකයත් ලබා දුන්නා. ඒ නිසා ඒ පිළිබවත් අවදානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අනිත් එක තමයි අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා සභාව ආරම්භ කරපු දවසෙම ප්‍රකාශ කළ තවමත් කියන උඩවැලිවිටිතලාව මාර්ගය. ඒක තැන් තැන්වලින් සුලු සුලුවෙන් කැඩිලා තිබුන මාර්ගය දැන් මේ වනවිට අබලන් තත්වය වැඩිවෙලා තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳ අවදානය යොමු කරලා දැනට අබලන් වුන ස්ථාන විතරක් තාර යොදලා සංවර්ධනය කරන්න පුලුවන්නම්, ඒකත් ජනතාවට කරන ලොකු සහනයක් වෙනවා.

ඒ වගේම තමයි අවුරුදු දෙකක් අපිත් එක්ක සහෝදරත්වයෙන් සභාවෙ වැඩ කරලා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වෙන අපේ බෝදරගම මන්ත්‍රීතුමියට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා. ඉදිරි අනාගතය සාර්ථක වෙන්න කියලා එතුමියට ප්‍රාර්ථනා කරන ගමන් කොවිඩ් 19 වසංගත තත්වය නිසා 5000 ක දීමනාව ලබා දීපු මම හිතන්නෙ මගේ කොට්ඨාසෙ නම් මම දන්න තරමින් කිසිම

අසාධාරණයකින් තොරව රජයන් නිකුත් කරපු චක්‍ර ලේඛයන්ට අනුව ඒවට අනුගත වෙමින් ලබා දෙන්න පුලුවන් සියලුම ජනතාවට එම 5000 ක ආධාර මුදල ලබා දුන්නා. කියලත් මතක් කරමින් ඔබ සියලු දෙනාට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම සුභාශිංසන එකතු කරනවා. අද දින සභාවෙන් නික්ම යන අපේ සහෝදර මන්ත්‍රීතුමිය වෙනුවෙන්. ඒ වගේම තමුන්නාන්සේලා දීර්ඝ වශයෙන් අදහස් දක්වපු වෙලාවක කතා කරන්න දේවල් තිබුනත් සියලු දෙනාම කතා කරපු වෙලාවක කතා කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ.

අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා කතා කල පොහොර ප්‍රශ්නය අපි අවදානය යොමු කළ යුතු ප්‍රශ්නයක්. පුරන් කුඹුරු අස්වද්දන වෙලාවක අපි ඉතිහාසෙ අහල නැහැ මහ කන්නෙ තමයි කුඹුරු වැඩිපුර වගා කරන්නෙ මේ සැරේ යල කන්නෙ වැඩිපුර වගා වුනා. ඒ නිසා මෙවර පොහොර හිගයක් ආවා. අපේ ගම් ප්‍රදේශයේ නම් එහෙම හිගයක් වුනේ නැහැ. ඒ කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුවත් කිරීම උඩ. මොකද පුරන් කුඹුරුවලට පොහොර එකතු කිරීමෙදි අවුරුදු ගණනක් පුරන් වෙච්ච කුඹුරුවලට මිනිස්සු නොදැනුවත්ව වැඩිපුර පොහොර දානවා. අපි කුඹුරු කරලා තියෙනවා. පුරන් කුඹුරු වුනාම පොහොර දාන්නෙ නැහැ. මොකද මේ රසායනික පොහොර අතිශයින් වැඩි විදිහට කුඹුරුවලට දානවා. මේවයින් විස රසායන ජලයට එකතු වෙනවා. මේ පිළිබඳ ජනතාව දැනුවත් කරන්න ඕන. තමුන්නාන්සෙලා කවුරුත් දන්නවා අපි තේ වගා කරුවො. යූ 709 කියල පොහොරක් තිබුනා. ඕක මම අත්දැකීමෙන් දන්නවා. මම මාසෙකට අක්කරයකට එකයි දාන්නෙ. මම අත්දැකීමෙන් කියන්නෙ. එක එක දාලා මම දලු කිලෝ 1000 පන්නල අක්කරයකින් කඩල තියෙනවා. මට අල්ලපු ඉඩමෙ මනුස්සය දලු කිලෝ 300 යි 400 යි කඩන්නෙ. ඒ මනුස්සයා එකසැරේට පොහොර හොන්ඩර පහක් දානවා. දැන් නෙවෙයි දැන් අවුරුදු ගානකට උඩ සිද්දියක්. වැඩියනේ පොහොර දැම්මම වැඩියනේ දලු කඩන්න පුලුවන් කියලා. ඒ නිසා ඇත්තටම මේ පොහොර භාවිතය ගැන මිනිස්සු දැනුවත් කරන්න ඕන. ඒ වගේම පුරන් කුඹුරු විශාල වශයෙන් අස්වැද්දුවා. මේ පොහොර හිගය ආවෙ ඒකයි. මිනිස්සු අනවශ්‍ය විදිහට පුරන් කුඹුරුවලට පොහොර දානවා. හිතේ වැඩ කරන්නෙ පොහොර පොහොර පොහොර මයි. ඒවා ජනතාව දැනුවත් විය යුතු කරුණු. ඒ ගැන අවදානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමුන්නාන්සේලා කතා කළා අපේ නෙලී මන්ත්‍රීතුමියට අපි රුපියල් 5000 දීමනාව ලබා දීම ගැන අපි එතුමියට නෙවෙයි ඒක දුන්නෙ. එතුමිය ඉතාම සත්කාර්යයක් කරනවා. එතුමිය අම්මයි තාත්තයි නැති ළමයෙක් හදනවා ගෙදර තමනේග සහෝදරයගෙ ඒ ගැන හිතලා දුනේන. නැතුව එතුමියගෙ මන්ත්‍රීකම ගැන හිතල නෙවෙයි. ඒ වගේ අපි මානුෂික දේවල් ගැන හිතලා. අපි ජනතාවට මුදල් දෙන්න කටයුතු කළා.

ඒ වගේම අපේ කොට්ඨාසවල රුපියල් 5000 දීමනාව දෙනකොට නෙලී මන්ත්‍රීතුමියගෙ අකුරුවලින් ලියුම එනවා. ආවට පසේස අපි අහක දානේන නැහැ. අනිවර්යයෙන් දෙනවා. අපි දන්නවා මේක දෙන්න ඕන කියලා. නන්දන මන්ත්‍රීතුමා කිව්වොත් අපි දෙනවා. ඉතිං එහෙම අපි කිසි ප්‍රශ්නයක් කර ගත්තෙ නැහැ. පක්ෂ පාට බැලුවෙ නැහැ. පකෂ අපට බලපෑම් කරනවා. පාක්ෂිකයො කියනවා. අර පක්‍ෂෙ අරුට දෙන්න එපා මූට දෙන්න එපා. එහෙම එනවා තමයි. එහෙම ආවට එහෙම කළානම්, අද අපට මොකද වෙන්නෙ. අපි ගොඩක් විවේචනයට ලක් වෙනවා. මම හිතන්නෙ එක්සත් ජාතික පක්ෂෙ මන්ත්‍රීවරුන්ටත් ඉස්සර වුනේ මෙතුමන්ලගෙ වරද නෙවෙයි. ඉහලින් එන නියෝග තමයි. ඉහල මිනිස්සු කිව්වම අපේ මිනිස්සුන්ට දීපල්ල කියලා. දුන්න හැටිය අපි තමයි ගමේ පිරිහෙන්නෙ සාධාරණ විදිහට දුන්නොත් කිසි ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ. ඒ නිසා අපට අපේ පක්ෂෙ නායකයො උපදෙස් දීල තිබුනෙ පක්‍ෂ පාට බලන්නෙ නැතුව සාධාරණව හැම මනුස්සයටම මේ සහනාධාරය ලබා දෙන්න කියලා. ඉතිං අපි බැලුවෙ මනුස්සය විතරයි ඔලුව විතරයි බැලුවෙ. ඒ නිසා අපේ කොට්ඨාසවල කිසි ප්‍රශ්නයක් වුනේ නැහැ. ඉල්ලුවනම් තියෙන

මිනිහටත් දුන්නා. නැති මිනිහටත් දුන්නා. ලියුමක් ලියල දුනනොත් ඕන කෙනෙකුට දුන්නා. ඒකට අපට අපේ නිලධාරි උදවු කළා. මගේ කොට්ඨාසෙ පවුල් කීපයකට නොලැබුනා රජයේ සේවය කරන නිසා. එත් සමහර අවස්ථාවල දෙන්න ක්‍රම තිබුනනම් ඒවත් හදල දුන්නා. මොකද වැඩිහිටියෙක් ඉන්නවනම් වැඩිහිටි ආධාරයක් විදිහට, ආබාධිතයෙක් ඉන්නවනම්, ආබාධිත ආධාරයක් විදිහට දීලා මම හිතන්නෙ පවුල් එක්දහස් හත්සියයක් විතර දුන්නා. අනු පවුල් හිටියා 90 විතර ඉතිං මේ විදිහට දීමෙන් ඒ දවස්වල යම් යම් දේවල් කිව්වත් පස්සෙ දැන් අපට ඒවට ජනතාව ප්‍රතිචාර දක්වනවා. ඒ පිළිබඳ අපට උපදෙස් දීපු අපේ නායකයන් ගැන අපි සතුටු වෙනවා. එතුමන්ලගෙ උපදෙස් පිළිපැද්ද නිසා අපි ගම්වල ප්‍රශ්නයක් නැතුව කටයුතු කළා. ඒ වගේම අපේ කොට්ඨාසෙ මන්ත්‍රීවරු දෙපොලම සහයෝගය දුන්නා. පැත්තක ඉදලා අවුලෝල එව්වෙ නැහැ. කරන්න පුලුවන් දේවල් කතා කරලා. මෙන්න මේක කරන්න මේක කරන්න එහෙම කියලා සහයෝගය දුන්නා. එතුමන්ලටත් මම ස්තූතිය පුද කරනවා. කතා කළයුතු දේවල් වෙන නැහැ. මම නැවතත් අපේ මන්ත්‍රීතුමියට සුබ පැතුම් එක්කරමින් ඔබ සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා .බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

ගරු සභාපතිතුමනි, මම කතා කරන්න නෙවෙයි හිටියෙ. මේ වෙලාවෙ විශේෂයෙන්ම මම නැගී සිටියේ අරුණ ශාන්ති මන්ත්‍රීතුමියත් අපිත් එක්ක ප්‍රාදේශීය සභාවට ඇවිත් අවුරුදු දෙකක් ගෙවෙන වෙලාවෙ එතුමියගෙ පෞද්ගලික කාරණයක් මත හෝ දේශපාලන කාරණයක් මත ඉවත්වෙන බව දැනුම් දුන්නා. ඒ ඉවත් වීම අපට කණගාටුයි. සහෝදර මන්ත්‍රීතුමියක් හැටියට කටයුතු කිරීම එය විශේෂ වන්නේ දේශපාලන වශයෙන් දේශපාලනය ඇගේ තියෙන කෙනෙක් හැටියට ඇයට අනාගතයක් තිබුනා. කෙසේ නමුත් ඉදිරියෙදි මම හිතන්නෙ අවශ්‍ය නම් පැමිණීමේ හැකියාව තියෙනවා. අපි ආරාධනා කරනවා ජනතා සේවයට කැපවෙන්න නැවතත් එන්න කියලා. ඒ අතරතුර ඔබගේ සහ ඔබගේ පවුලේ දූ දරුවන්ගේ සහ සියලු දෙනාගේ ජීවිත සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම මතක් කරනවා. අවශ්‍ය නම් මන්ත්‍රීතුමියට පුලුවන් සභාවට දීපු ලියුම ඉවත්කරගෙන ගන්න පුලුවන් මාසෙකට දෙකකට තේරුමක් නැති කාල පරිච්ඡේදයක් එනවා. ඔබගේ පක්ෂයේ ලේකම් වරයා විසින් මැතිවරණ කොමිසමට දැනුම් දුන්නට පස්සෙ දාතම කරන්නෙ දිනය ඒ දිනය එතකොට මැතිවරණ කොමසාරිස් ලියුම ගහන්නෙත් එහෙමයි. එතකොට සභාව අපි දන්නෙ නැහැ. එහෙන් කිව්වද නැද්ද කියලා. අවශ්‍ය නම් පුලුවන් ඒ ලියුම එන කාලසීමාව තුල බාධාවකින් තොරව ලබන මාසෙත් මෙහේ නියෝජනය කරන්න. ඒ ලබන මාසය තුල ඔබතුමියට එන්නත් බැහැ අලුත් එක්කෙනාට එන්නත් බැහැ. ඔය තත්වය නිසා අවශ්‍ය නම් ඔබ පක්ෂ ලේකම්ට කියන්න මැතිවරණ කොමිසමට දැනුම් දෙන්න කියලා. මැතිවරණ කොමිසමෙන් කියාවි පක්ෂයේ ලේකම් විසින් දීපු දිනේ දාලා ලියුම එවනවා. එතකොට ඔයාට පුලුවන් සභාවට එන්න. ඔබ ලබන මාසෙ සභාවට නාවයි කියලා ඔබට වාසියක් වෙන්නෙත් නැහැ. එන්න ඉන්න එක්කෙනාට වාසියක් වෙන්නෙත් නැහැ. ඒ ලියුම සභාපතිතුමා ඇතුලු අපි එහෙන් ඉල්ලා අස් කළාද නැද්ද කියලා අපි දන්නෙ නැහැ. අපට මෙහේට දන්වනකම් අපි දන්නෙ නැහැ. ඒ නිසා ලබන සභා වාරෙ නියෝජනය කරන්න පුලුවන් නොකරන එක අපරාදෙ ඒක කරන්න පුලුවන්නම් කරන්න නැත්නම් ඒක අපරාධයක් විතරයි. ඒ බවත් මේ වෙලාවෙ මතක් කරනවා.

ඒ සමගම ගරු සභාපතිතුමනි, මේ ලියුමනම් සභාපතිතුමාගෙ උපදෙස් පරිදි ලේකම්තුමිය කඩිනමින් යවන්න. පහුගිය දිනක අභාවප්‍රාප්ත වෙච්ච අපේ වෘත්තීය සමිති නායකයෙක් හැටියට අපිත් වෘත්තීය සමිති කරන අය හැටියට වෘත්තීය සමිති නායකයෙක් හැටියට සහ පක්ෂ නායකයෙක් හැටියට ආරුමුගම් තොණ්ඩමන් ඇමතිතුමාගෙ අභාවය පිළිබද අපේ ප්‍රාදේශීය සභාවෙ සාතිශය සංවේගය පළ කරන්න අවශ්‍යයි. මොකද සෞම්‍ය මූර්ති තොණ්ඩමන් එතුමගෙ සීයගෙ කාලෙ ඉදලා වෘත්තීය සමිති නායකයෙක්

හැටියට විශේෂයෙන්ම දේශපාලන නායකයෙකුටත් වඩා එතුමා කටයුතු කළා. 1989 පාර්ලිමේන්තුවට පැමිණිච්ච ජනතා නියෝජිතයෙක් වගේම ලංකා වතු කම්කරු කොන්ග්‍රසයේ නායකයා හැටියටත්, ලංකා වතු කම්කරු කොන්ග්‍රස් වෘත්තීය සමිතියේ නායකයා හැටියටත් කටයුතු කළා. මොකද විශේෂයෙන් නාගොඩ ප්‍රාදේශීය සභාව තුලත් ඔහු නියෝජනය කරන ඉන්දියානු දෙමළ පුරවැසියන් අපිත් එක්ක කටයුතු කරනවා විශාල ප්‍රමාණයක්. විශාල වෘත්තීය සමිති ප්‍රමාණයක් මෙහේ තියෙනවා. ඔවුන්ගේ නායකයා හැටියට ඔවුන් නියෝජනය විය යුතුව තියෙනවා. ඒ නිසා මේ වෙලාවෙ සභාවෙ සංවේගය පළ කරලා, එතුමාගේ වෘත්තීය සමිතියේ ලේකම්වරයාට සහ එතුමාගේ පුතාට රජීව තොණ්ඩමන් මැතිතුමාට සභාවේ ශෝකය පළ කරල යවන්න කියන කාරණයත් මේ අවස්ථාවෙදි මතක් කරමින්, ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන ලද සියලු සාධනීය යෝජනාත් අනුමත කරමින් මගේ කෙටි වචන කීපය අවසන් කරනවා. සියලු දෙනාට ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගොඩක්වෙලා කතා කරන්නෙ නැහැ. අපි බෝදරගම මන්ත්‍රීතුමියට සුබ පතන්නෙ නැහැ. අජිත් මන්ත්‍රීතුමා කිව්ව ක්‍රමවේදෙ එහෙම තමයි ඔබතුමිය මේ ලිපිය අස්කර ගත්තට පස්සෙ ඒක ඉබේම සිදුවේවි. ඔබතුමිය පක්ෂෙට දැනුම් දීමක් කරන්න. මෙතන ලේකම් තුමියට පුලුවන් ඔබතුමියට දීමනා නොගෙවා අරින්න මේ ලියුම නිසා. ඒක අපරාධයක් මම කියන්නෙ ඒක ඔබතුමියටත් නැහැ.පක්ෂෙටත් නැහැ. අලුතින් එන එක්කෙනාටත් නැහැ. ඒක ඉබේම එන්න අරින්න. ඔබතුමිය ඉන්න. කවුරු හරි පක්ෂෙට බලපෑමක් කරල තියෙනවා. එහෙම එකක් වෙන්න ඇති. ඔබතුමිය වැඩ කළානම් ගමේ මිනිස්සු දන්නව නම් මොන පක්ෂෙන් ඉල්ලුවත් ඔබතුමිය දිනනවා. ඒ නිසා ඒක ගැටලුවක් කර ගන්න එපා. ඒ පක්ෂෙයි, මේ පක්ෂෙයි කියලා නැහැ. අපිත් එහෙම තමයි. ඒ පැත්තෙයි මේ පැත්තෙයි කියලා නැහැ. ජනතාවගෙ පැත්තෙ ජනතාවගෙ පක්ෂෙ ඉන්නවා. ඒ නිසා මේ ක්‍රමවේදෙන් කිසිම වැඩක් වෙන්නෙ නැහැ. ලියුම අයින් කරගන්න ඉල්ලීමක් කරනවා. ඒ ගැටලුව එතනින් විසදේවි. මම අස්වුනා කියලා පක්ෂෙට දැනුම් දීමක් කරන්න. ලේකම්ලා මැතිවරණ කොමසාරිස්ට කියලා ඒ අය කරගෙන යයි. නැත්නම් මෙතන ලේකම්තුමියට සිදු වෙනවා. ඔබතුමියට ගෙවීම් නොකර ඉන්න. ඒ පිළිබද අපි ගොඩක් දුර කතා කරන්න ඕන නැහැ.

අපට තියෙන එකම කරුණ මේ සභාවෙ වැදගත්වෙන. තල්ගස්වල නගරය ආක්‍රමණය කරලා. ඒ පැත්තයි, මේ පැත්තයි මැදින් තියෙන දොලෙන් සීමා වෙනවා. ඒ පැත්තෙ සියලුම රාජ්‍ය ආයතන තියෙනවා. මේ පැත්තෙ පොල විතරයි කිසිම සම්පතක් නැහැ. ඉතිං මේ සභාවෙ සභාපතිතුමා ඇතුලු අපි කවුරුත් එකතුවෙලා මේ පැත්තෙන් තල්ගස්වල වත්තෙන් යම් භූමි භාගයක් ගන්න කටයුතු කරමු. මම දන්න විදිහට මට මතක විදිහට මහපොලත් එක්ක ගල්ලිද වත්තෙන් අරගත්ත ඉඩම් ටික තමයි ඔය ආයතන ටික බෙදා ගත්තෙ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බැංකු දෙක, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය ඔය ඔක්කොම මහ පොලත් එක්ක පවරා ගැනීම් ගල්ලිද වත්ත රජයේ වත්තක්. එතකොට දැන් මේ පුද්ගලික ආයතනවලට දීලා තල්ගස්වල වත්තෙන් අපි යම් කිසි ප්‍රමාණයක් කටුපොල් වගාවත් එක්ක පාර දිගේ පවරා ගැනීමට කටයුතු කරමු. දැන් ශක්තියත් පවතින අවස්ථාව. ජනාධිපතිතුමත් ඉන්නවා. අගමැතිතුමත් ඉන්නවා ඊලග රජයත් අපි බලාපොරොත්තු වෙනවා. ඒක අපි කවුරුත් එක්ක එකතුවෙලා කරමු. නැත්නම් සදාකාලික ප්‍රශ්නයක් වෙනවා. මේකට මුහුණ දෙන්න බැරි වෙනවා. ඒ නිසා දේශපාලන අධිකාරියත් මේකට මැදිහත් වෙන්න ඕන. දේශපාලන නායකත්වය මේකට මැදිහත් වෙන්න ඕන. මේක බේරුම් කර ගන්න. නැත්නම් බේරුම් කර ගන්න බැහැ. දැන් පීඑච්අයි මහත්වරු තල්ගස්වල පොල අපට කරන්න එපා කිව්වා. ඒ පැත්තෙ පීඑච්අයි මහත්වරු ඒක ලස්සනට කරගෙන ගියා. ඒ අයට බලපෑම් කරන්න අපට හැකියාවක් තියෙන්න ඕන. පොලීසිය මැදිහත් කරගෙන හැකියාවක් තියෙන්න ඕන. එක කොට්ඨාසෙක පීඑච්අයි මහත්වරු එක විදිහක් මේ කොට්ඨාසෙ එහෙම වෙන්න විදිහක් නැහැ.

ඊලඟට තවත් විරෝධතාවක් තමයි පහුගිය දවස්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීපු ව්‍යාපාරික බලපත්‍ර කිසි කෙනෙක් ජංගම වෙළදාමක් කළේ නැහැ. හන්දි හන්දි ගානෙ ඔක්කොම ගෙනැල්ලා බඩු දාගත්තා. දැන් අපට සිදු වෙනවා විශේෂයෙන්ම අපේ ව්‍යාපාරිකයො රැක ගන්න. බදු මුදල් ගන්න අපේ ස්ථිර ව්‍යාපාරිකයො. කිසි කෙනෙක්ගෙන් බදු මුදලක් ගන්න බැහැ. කඩ කුලියත් නැහැ ලයිට් බිලත් නැහැ වතුර බිලත් නැහැ. සේවක බිලක් නැහැ බඩුටික ලොරියට පටවගෙන ආවා ලෑලි ටිකක් ගෙදරින් අරන් ආවා. නෝනත් එක්ක ආවා දාගත්තා විකුණ ගත්තා ගියා අපට කිසිම ප්‍රයෝජනයක් නැහැ ඒ නිසා දැන් නවත්වමු. ඔය ජංගම වෙළදාම කියලා බලපත්‍ර ගතිපු සියල්ල නවත්වමු. ඇතුලු වෙන්න දෙන්නත් එපා. මෙහේ හොද ව්‍යාපාරිකයො ඉන්නවා. පරම්පරාගත අපට බදු මුදල් ගෙවන, අපට පහසුකම් දෙන, ජනතාවට බදු මුදල් ගෙවන ඒ අය රැකගෙන මේ කටයුත්ත කරගෙන යමු. උඩුගමත් එහෙමයි. තල්ගස්වලත් එහෙමයි. නාගොඩත් එහෙමයි. ඒ ගැන හදුනාගෙන ගරු සභාපතිතුමා කටයුතු කරයි කියලා බලාපොරොත්තුවෙන් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, වත්මන් තත්වය අනුව අද දින කාලය කළමනාකරනය කර ගෙන සභාව පවත්වා ගෙන යාමට අදහස් කලත්, ඔබතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම් දීර්ඝ වූ නිසා එම අදහස ඉටු කර ගැනීමට අපහසු වීම හේතුවෙන් පෙරසේම කාලය ගෙවී ගියා. මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා සභාවට නිසි වේලාවට පැමිණෙන්න. සභාවේ ගරුත්වය ආරක්ෂා වන පරිදි හැසිරෙන්න. සෞඛ්‍ය උපදෙස් අනුව මුඛ ආවරණ පළදින්න. අපිම සෞඛ්‍ය නීතිරීති පිළිපදින්නේ නැතිනම් ජනතාවට දෙන පණිවිඩය තුමක්ද? මම බලාපොරොත්තු වෙනවා ඔබතුමන්ලා ගරු මන්ත්‍රීවරු හැටියට කටයුතු කරාවි කියලා.

මේ වන විට ලෝකෙම වෙලා ගත් කොරෝනා වසංගතය තුල අපේ මේ පුංචි රට, රටේ වර්ථමාන නායකත්වය තුළින් ගත් නිවැරදි තීන්දු තීරණවලින් යහපත් ප්‍රතිඵල ලැබී තියෙන නිසා එහි ප්‍රතිඵලයක් ලෙසයි අද වුනත් මේ විදියට සභා වාරය පවත්වන්න පුළුවන් වුණේ.

ගරු මන්ත්‍රීවරුනි, ඇති වී තිබෙන කොරෝනා වසංගතය තුල සමස්ථ රටේ වෙසෙන සියළුම ජනතාවගේ දෛනික ආදායම අහිමි වී යාම තුල, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ ඉල්ලීම මත එම පවුල්වලට රු. 5000.00 ක දීමනාවක් ලබාදීමට කටයුතු කිරීම, එතුමා කාලෝචිතව ගත් වටිනා තීරණයක්. මේ නිසා අප බල ප්‍රදේශයේ පදිංචි පවුල් දාහත්දහස් ගණනින් පවුල් 14594 ක් සඳහා රු. 5000.00 දිමනාව ලබාදීමට අපිට හැකිවුනා. වැඩිහිටි දීමනාව ලෙස 1854 දෙනෙකුට සහ අලුතින් 491 දෙනෙකුට වශයෙන් 2345 දෙනෙකුටද, ආබාධිත දීමනාව ලෙස අලුතින් 229 ක් සමඟ 651 දෙනෙකුටද, වකුගඩු ආධාර වශයෙන් 36 දෙනෙකුටද දීමනා ලබා දීමට හැකියාව ලැබුණා. මේ අනුව කිසියම්ම හෝ කෙනෙකුට අසාධාරණ ලෙස මෙය නොලැබී ඇත්නම්, වහාම අභියාචනාවක් ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාලා ඒ අයට පවසන්න. යම් ස්ථානවල අසාධාරණ සිදුවීම් සිදු වූ බවට පැමිණිලි ලැබී තියෙනවා. ඉදිරියේදී ඒවා නිවැරදි කිරීමට කටයුතු කරනවා. අපි කිසි වෙලාවක අසාධාරණයක් වෙන්න ඉඩ තියන්නෙ නැහැ. පක්ෂ පාට බලලා අවස්ථාවාදීව වැඩ කරන්න අපේ කාටවත් ඉඩක් නැහැ. ඒක තමයි අපේ ජනාධිපතිතුමාගෙ වෙනස සහ ප්‍රතිපත්තිය. ගරු ජයවීර මන්ත්‍රීතුමාගෙ ප්‍රකාශය අනුව කාට හෝ අසාධාරණයක් වෙනවනම්, එය නිවැරදි කිරීමට අපි බැදී සිටිනවා. නමුත් එහෙම වෙන්න විදියක් නැහැ කියලා මම වගකීමෙන් කියනවා. රජයේ චක්‍රලේඛ අනුව රජයේ සේවකයන් හා විශ්‍රාමිකයන්ට මෙම රු. 5000.00 දීමනාව ලබාදීමට නොහැකි නිසා ඒ ආශ්‍රිතව අනු පවුල් හදලා ඔවුන්ට අසාධාරණයක් නොවන ආකාරයට කටයතු කළා. අපේ සභාවල මහජන නියෝජිතයන්ට රු. 5000.00 දීමනාව ලබා දෙන්න පුළුවන්ද කියලා මම නිලධාරින්ගෙන් ඇසුවා. නමුත් අපට ලැබෙන දීමනාවත්, රජයේ දීමනාවක් ලෙස සළකන බැවින් එය කිරීම අපහසු බව කිව්වා. මම මෙසේ ප්‍රකාශ කලේ අපේ නෙලී මන්ත්‍රීතුමිය රු. 5000.00 දීමනාව ලබාගත්තා යැයි කියන පදනම මත. අපි දෙන්න පුළුවන් සෑම පවුලකටම අදාළ මුදල ලබා දුන්නා.

එමෙන්ම යම් අයෙක් ආබාධිත, වකුගඩු රෝග, වැඩිහිටි, සමෘද්ධි යන හතර වර්ගයටම අයත් වුවා නම් මෙම දීමනා සියල්ල ඔහුට අයිති නිසා සමහර පවුල්වලට රු. 20000.00 ක් වැනි මුදලකුත් ලැබුණා. මේ සෑම ක්‍රියාවකටම නායකත්වය සපයමින් සියල්ලන්ටම එක සේ සළකමින් කටයුතු කිරීමට උපදෙස් ලබා දුන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන් ඇතුළු රජයට මෙන්ම මෙම ක්‍රියාවන් යථාර්ථයක් කරන්න වෙහෙස මහන්සි වී තමාගේ රාජකාරිය දේවකාරියක් සේ සළකා සේවය කල ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට, වසංගතය පාලනය කරමින්, සෞඛ්‍ය උපදෙස් ලබාදෙමින්, දිවා රාත්‍රී නොබලා සේවය කල දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී, සෞඛ්‍ය අංශ බලධාරීන්, සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු සියළුම රාජ්‍ය නිලධාරීන්ට අපේ සභාවේ ප්‍රණාමය පුද කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, අද සභාවේ පොළවල් පිළිබඳව කතා කළා. අපේ සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වනුයේ මේ පොළවල් ටෙන්ඩර් කොට ලැබෙන මුදල්. විශේෂයෙන්ම තල්ගස්වල පොළ කියන්නේ අප සභාවේ ප්‍රධානම ආදායම ලැබෙන ස්ථානය. මම කවදාවත් මෙම පොළ වැසීයාමට තුඩු දෙන ක්‍රියාවක් කරන්නේ නහැ. උඩුගම, උනන්විටිය පොළවලුත් ඒ වගේම තමයි. තල්ගස්වල පොළ අපි දන්න කාලයේ සිට දකුණු පළාතේ තිබුන ප්‍රසිද්ධ පොළක්. උදේ 1.00 සිට මෙම පොළට වෙළඳුන් මෙන්ම තමන්ගේ නිශ්පාදන රැගෙන එන ග්‍රාමීය වැසියන් පැමිණෙන පොළ. අපිට මතකයි මීට අවුරුදු කිහිපයකට උඩදී මෙම පොළේ වෙළඳුන් ගල්ලිඳ හංදියේ සිට මාපලගම පාරේ හික්ගස්දෙක දක්වා කෙසෙල් කැන් වෙළඳුන්, පුවක්, බුලත්, අලබතල වෙලදුන් ආදී වශයෙන් සිටියා. නමුත් වර්ථමානයේ සමාජ වෙනස්වීම් මත පොළ කුඩා වූවා. වෙළඳුන්ගේ පැමිණීම අඩු වුණා. ඒ අනුව පොළ පෙර පරිදි ක්‍රියාත්මක වුනේ නැහැ. නමුත් මෙම පොළ පළාතේ ප්‍රසිද්ධ පොළක් වූ නිසා වෙනත් ප්‍රදේශවල අදටත් තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට එනවා. ඒ නිසා මෙම පොළ

ආරක්ෂා කර ගැනීම අපේ යුතුකම හා වගකීම. මම එය පැහැර හරින්නේ නැහැ. නමුත් පසුගිය වකවානුවේ මෙම වසංගත තත්වය හමුවේ අපිට පොළ පැවැත්වීම නතර කිරීමට සිදු වුණා. ඒ අතර වෙනත් අලුත් වෙළඳුන් බිහිවුණා. ඔවුන් පොළ අවටත්, ඉන් ඔබ්බටත් තමන්ගේ වෙළදාම කරගෙන ගියා. එය අපට නවත්වන්න බැහැ. මෙයම උඩුගම පොළ ප්‍රදේශයේ සිදු වුනා. වසංගත තත්වය යම් දුරකට පාලනය වෙනකොටත් මොවුන් මේ වෙළදාම කරගෙන යාමේදී ගැටළු පැන නැගුනා. ඒ අවට සභාවට බදු ගෙවන වෙළඳ ප්‍රජාව මෙම ක්‍රියාවට තදින්ම විරුද්ධව සභාවට පැමිණිලි කළා. මම ඒ අවස්ථාවේදී එම ජංගම වෙළදාම නතර කිරීම කරනකොට අපේ සමහර මන්ත්‍රීවරු මාව දැනුවත් කළා ජංගම වෙළදාම කරන අයගේ වෙළඳ ද්‍රව්‍ය මිළ අඩු නිසා ඔවුන්ව නතර කරන්න එපා කියලා. සමහර මන්ත්‍රීතුමන්ලා ඒකට විරුද්ධව කටයුතු කළා. ඉතිං මම සුදුසු පරිදි ක්‍රියා කළා. දැන් දැන් අපේ සමහර මන්ත්‍රීවරුත් තල්ගස්වල වෙළඳ ප්‍රජාවත් මට පවසනවා. තල්ගස්වල පොළ වැහේවි ගල්ලිඳ හංදියේ අලුතින් පොළක් දැමීමට සැළසුම් කරලා කියලා. මම මේ පිළිබඳව අදාල නියාගම සභාවේ සභාපතිතුමා සමඟ කථා කළා. එතුමාගෙන් ප්‍රකාශ වුනේ එහෙම අදහසක් ඔහුට නොමැති බවත්, සභාවේ නම් මේ පිළිබඳව කතා කළා කියලා. ජංගම වෙළඳුන්ගෙන් කඩ කුලී අය කළා කියලත් කිව්වා. ඊට එහා දෙයක් එතන නැහැ කිව්වා. ඉතිං එහෙනම් අපි කලබල වෙන්නෙ ඇයි? මම මේ සභාවට සභාපති වූ පසු මගේ අදහස තිබුනෙ මෙම පොළවල් සභාවම හරහා මුදල් එකතු කොට සභාව මගින්ම පාලනය කිරීමටයි. නමුත් අපට ඒ පිළිබඳව විශ්වාසව කටයුතු කිරීමට අපහසු බව පෙනී ගිය නිසා තමයි පොළ ටෙන්ඩර් කළේ. වර්ථමානයේදීද දැනට රු. 1000000.00 ක මුදලක් පොළ සංවර්ධනය සඳහා ලැබී තියෙනවා. මේ සංවර්ධන කටයුතු ඉදිරියේදී සිදු වෙනවා. පොළ අවට කැලෑව සුද්ධ කර වාහන නවත්වන්න සුදුසු පරිදි සකසනවා. විදුලිය සැපයීම, පොළ වටේ වැට අළුත්වැඩියා කිරීම ඉදිරියේදී සිදු කරනවා.

ඊළඟට මන්ත්‍රීවරුනි, පාළම් පිළිබඳව කතා වුනා. අද අප බල ප්‍රදේශයේ මේ වන විට පාලම් 5 ක් සෑදීම කරනවා. ඒවායින් එකක් මේ වන විට සාදා අවසන්. ඒ ස්ථානයේ පිවිසුම් මාර්ගය පිළිබඳව ප්‍රශ්ණයක් තියෙනවා. අනිත් පාලම් පිළිබඳව ප්‍රශ්න

ය ඉදිකිරීමේ සමාගම්වල තියෙන නොහැකියාව. මම දන්නා විදියට මෙම පාලම්වල මුදල් සියල්ල ලැබිලා වෙන්වෙලා තියෙන්නෙ. ඉදිරි කාලයේදී මේවාවල වැඩ අවසන් වේවි කියා සිතනවා. තවද, ඉදිරියේ ලංකාවට ආධාරයක් හැටියට මෙවැනි පාලම් ව්‍යාපෘති 500 ක් ලැබීමට නියමිත බැව් මා දැනුවත් වුනා. ඒ වගේම කාපට් පාරවල් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන කිලෝමීටර් ලක්ෂයෙන් අප බල ප්‍රදේශයටද කිලෝමීටර් 25 ක් වැනි ප්‍රමාණයක් ලැබී තියෙනවා. ඒවාද මේ වන විට මැණ අවසන් කොට ඇස්තමේන්තු සාදා ගිවිසුම් අත්සන් කිරීම සිදු වෙනවා. සමහර ප්‍රදේශවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ඒ වගේම ජල ප්‍රශ්නයටත්, සියලුම දෙනාට ලොකු ප්‍රශ්නකාරී තත්වයේ ඉල්ලුමක් තියෙනවා. සැමට විදුලිය වගේ සැමට ජලය සැපයීමේ ව්‍යාපෘති දැන් ඉදිරියෙදි ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අපි ඉදිරියෙදි යම් සහනදායී වැඩපිළිවෙලක් එයි කියල බලාපොරොත්තු වෙනවා. ඒක ස්ථිරයි අපි මේ කොවිඩ් වසංගතය ලෝකයට වසංගතයක් වුනාට අපට මේක සම්පතක්. මේ කොවිඩ් වසංගතය නිසා අපේ ජන ජීවිතයට යහපතක් වුනා මිසක් අයහපතක් වුනේ නැහැ කියලා මම නම් දන්නෙ. කොවිඩ් වසංගතයෙන් අපි හුගක් දේවල් ඉගෙන ගත්තා. කොවිඩ් වසංගතයෙන් තමන්ට තමන් විතරයි කියලා පළමුවෙන්ම හිතාගන්න. තමන්ගෙ ඥාතියෙක්ගෙ මරණයක් බලන්න යන්න බැරි වුනා. ඒ වගේ තමයි පිට රටින් ගෙන එන හැම දේම අපට නිර්මානය කරන්න පුලුවන් වුනා. ඒ වගේම පරිසරය සුරැකුනා. පරිසරය මේ කොවිඩ් වසංගතය නිසා බොහොම ඉහල මට්ටමක පැවතුනා. ඒ නිසා අපිට ඇත්තටම ඒ පිළිබඳව සතුටුයි. මම නම් කොවිඩ් වසංගතයෙන් අපේ රටට යහපතක් වුනා මිසක් අයහපතක් වුනේ නැහැ කියල හිතන්නෙ. මොකද මිනිස්සුන්ට, අවුරුදු ගානකට පස්සෙ පවුලේ අයට එකට ඉන්න වාසනාව ලැබුනා. අම්මා තාත්තා දරුමල්ලොත් එක්ක එකට ඉන්න පුලුවන් කම ලැබුනා. වෙනද එහෙම හිටියෙ නැහැ. අම්මා දන්නෙ නැහැ. තාත්තා දන්නෙ නැහැ. දරුවා අඳුරන්නෙ නැහැ. එවැනි කාලෙක අපි එහෙම හිටියත් අපේ රටේ සංවර්ධනය සහ ජන ජීවිතය අඩාල වුනේ නැහැ. මම හිතන්නෙ මේ කොවිඩ් වසංගතය මේ තත්වෙන් නතර කරගෙන රටේ සංවර්ධනය ඉහල මට්ටමට ගෙන යන්නට මූලිකත්වය ගත්තෙ අපේ නිර්මානශීලී නායකත්වයක් අපට පත්වුන නිසා. මම මේ දේශපාලනයක් ගැන කතා කරනවා නෙවෙයි. අපේ නායකයා තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. නමුත් අපි කාගෙත් වාසනාවට තමයි එතුමා මේ නායකත්වයට පත්කර ගත්තෙ. පත් වුනේ. මොකද බුදු දහම අදහන රටේ අපිට මම හිතන්නෙ කරදර නැහැ. කොනිත්තනවා විතරයි. කවදාවත් ඊට වඩා යමක් කරන්නෙ නැහැ. ඒ නිසා අපේ පිනෙන් පහලවූ නායකත්වය ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් ඒ වගේම මහින්ද රාජපක්ෂ මැතිඳුන් සුසංයෝගය බැසිල් රාජපක්ෂ මැතිඳුන්ගේ නිර්මාණශීලී ක්‍රමවේදයන් එකතු කරගෙන තමයි මේ රට ඉදිරියට ගෙනියන්න අපට හැකියාව ලැබිලා තියෙන්නෙ. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා. ප්‍රාදේශීය සභාවක් හැටියටත් එතුමන්ලාගේ සහාය අපට ලැබෙයි කියලා. එහෙමනම් මේ සිදුවීමෙදි අපි නැවත නැවතත් සිහිපත් කරන්නෙ. මේ ක්‍රමවේදය තුලදි අපි දේශපාලන බේදයකින් තොරව සියලු දෙනාම එක හා සමාන සැලකීම පිළිබද නැවතත් අපි ඉහල නායකත්වයට ගරුත්වය පුද කරන්න ඕන.

ඒ වගේම තමයි වීථි ලාම්පු පිළිබඳව අපේ සහබන්දු මැතිතුමා කිව්ව එක. ගරු මන්ත්‍රීතුමනි, වැරැද්දක් හොරකමක් වංචාවක් කරනවනම් කරන්න පුලුවන් ඒක අපි ඇස් දෙකෙන් දැකලත් තියෙනවා. ඒව කරන්න පුලුවන් නමුත් මේ අවස්ථාවෙදි ක්ෂණික අවශ්‍යතාවය නිසා මම ඒ ලයිට් දැකපු ස්ථානයේ නගර සභාවෙන් කොහෙන්ද ගෙනාවෙ කියල අහලා තමයි මේ ස්ථානයෙන් වීථි ලාම්පු ගෙනාවෙ. පසුව මම සහබන්දු මන්ත්‍රීතුමා කියපු ස්ථානයේ ලයිට් එකක් දැක්කාම ඒ ගණන් කිව්වාම, මමත් ඇත්තටම හරි කණගාටුවට පත් වුනා. ඇයි අපට එහෙම කර ගන්න බැරි වුනේ කියලා. ඒ නිසා ඒ පිළිබඳව මම ඇත්තටම

කණගාටු වෙනවා. මොකද වීථි ලාම්පු තවත් අපට වැඩිපුර ප්‍රමාණයක් ගන්න තිබුනා. දැන් ඒ වීථි ලාම්පු අවශ්‍ය තැන්වලට සවිකර ගෙනත් යනවා. ඒ නිසා මම කියන්න කැමතියි වක්‍රාකාරයෙන්වත් අපට වංචා කරන්න අවශ්‍යතාවයක් නැහැ. එහෙමනම් මම ප්‍රසිද්දියෙම කරනවා. මට ඇඟිල්ල දික් කරන්න බැරි නිසා මම කාටවත් බය නැහැ.

ඒ වගේම අපේ ධර්මසිරි මන්ත්‍රීතුමාලා, ජයවීර මන්ත්‍රීතුමාල කෘෂි කර්මය පිළිබඳව කිව්වා. ඇත්ත එතුමන්ලගෙ ප්‍රකාශ හරි. ධර්මසිරි මන්ත්‍රීතුමා අපිත් එක්ක සම්බන්ධ කරලා, අපි කිව්වා මෙදා පුදුම විදිහට වගා ව්‍යාපාර කරනවා. ඒ අනුව මේ පොහොර හිඟයක් තියෙනවා. පොහොර ලබාදීමට කටයුතු කරන්න ඕන. බිත්තර වී ලබා දෙන්න ඕන කියලා. අපි ඔය පිළිබඳ කතා කළා රමේෂ් පතිරණ දිස්ත්‍රික් නායක අමාත්‍යතුමත් එක්ක එතුමාගෙන් ප්‍රකාශ වුනා ප්‍රමිතියෙන් තොර පොහොර නැවක් ඇවිල්ලා තියෙනවා. ඒක නතර කරලා තියෙනවා. නමුත් ඒ පොහොර යම් ක්‍රමවේදයකට අඩු පාඩු වුනත් මේ අවස්ථාවෙ මේ වෛරස් රෝග තත්වයත් එක්ක මෙච්චර දුරට කරපු එක පිළිබඳව අපි හරි සතුටු වෙනවා. මොකද එතුමන්ල ඒ කරපු කටයුත්ත නිසා

ඒ වගේම මේ අපේ බාර් පිළිබඳව තරංග මන්ත්‍රීතුමා කතා කළා. ඒක අපි දැනුවත් කරන්නම්. මොකද පහු ගිය දවස්වලනම් බාර්වල පෝලිම් තිබුනා. බාර් වහල තිබුනනම් හොඳයි කියල හිතෙනවා. ඇත්තටම මිනිස්සු පසුගිය කාලෙ මානසික ලෙඩ්ඩු වගේ. ඇත්ත කතාව අරක්කු විතරක් නෙවෙයි ගරු මනත්‍රීතුමන්ලා කෝ ඒ දවස්වල දොස්තර මහත්තුරුන්ගෙ ඉස්සරහ හිටපු ලෙඩ්ඩු පෝලිම. ඉස්පිරිතාලවල පෝලිම කෝ? කොහේද මැරුනෙ? අපි මානසිකව ලෙඩ අරගෙන හිටියෙ. මේ මාස තුනේ බාර් වහල තිබුනා මිනිස්සු අරක්කු බිව්වද නමුත් ගරු මන්ත්‍රීතුමා ඒව අපි මානසිකව තමයි හැමදේම කළේ. ඇත්තටම යම් හොඳක් වුනා අපේ 75% ක් තියෙන්නෙ මානසික දේවල්. ඒකෙන්ම අර ලෙඩරෝගවලින්ම හිතාගන්න පුලුවන්

ඒ වගේම අපේ පොළ පිළිබඳ අපේ පියල් මන්ත්‍රීතුමා කියපු විදියට පොළ නොමිලේ කරන්න අපට අපහසුයි. නමුත් යථා කාලෙදි අපි පොළ පිළිබඳ කතා කරමු. ඒ පිළිබඳව වෙන යමක් කියන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපේ විශේෂ බලාපොරොත්තුව වුනේ ආදාහනාගාරය. ඒ ආදාහනාගාරයේ වැඩකටයුතු මේ වනවිට අවසන් අදියරේ තියෙන්නෙ. ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලා අර මම යෝජනාවක් දැම්මෙ ඇප්ත්‍රොප්වත්තෙ අක්කර පහ කොටස පවරගන්න. ඒව නොකළොත් යථා කාලයෙදි ඉඩමෙන් ටික ටික අල්ල ගන්නවා. අපට කරන්න දෙයක් නැහැ. කියන්න දෙයක් නැහැ. මම විස්තර බලන්න මහ රෑ දොලහට එකටත් සමහර දාට යනවා. ඒ නිසා අපට ඕන ඇප්ත්‍රොප්වත්ත ආරක්ෂා කර ගන්න. මම රමේෂ් පතිරණ ඇමතිතුමා එක්කත් ඇප්තොප්වත්තේ අක්කර 35 පිළිබඳ කතා කළා සම්පූර්ණ විස්තර ටික ඉල්ලුවා. අක්කර 35 ආරක්ෂා කරල මේ සභාවෙ සම්පතක් හැටියට තබා ගන්නයි අපට අවශ්‍යතාවය තියෙන්නෙ. ඒකත් අපි නොබෝ කලකින් පවරා ගැනීම් කටයුතු කරනවා.

මීට වඩා මම යමක් කියන්න යන්නෙ නැහැ. අපේ බෝදරගම අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය ඇත්තටම නිර්මාණශීලී මන්ත්‍රීතුමියක්. සභාවෙ අලුත් මන්ත්‍රීතුමියක් වෙලා, කාන්තාවො කුලැටි කමින් ඉන්න කොට මේ මන්ත්‍රීතුමිය තමන් තනියම අනිත් අපේ එක්සත් ජාතික පක්ෂෙ මන්ත්‍රීතුමියන්ල තුන්දෙනයි ශ්‍රී ලංකා මන්ත්‍රීතුමියල දෙන්නයි ඒකට කවුරු හරි ඉන්නවා මැය තනියම ඇවිල්ලා නිර්මානශීලීව අපට තර්ක ඉදිරිපත් කළා. සභාපතිතුමා මේක මෙහෙමයි කියලා යම් ස්ථානවල පොටෝ ගෙනැල්ලා පෙන්නුවා. අපිට ඒක ඇත්තටම ඒ වෙලාවෙ සමහර විට කේන්තිත් ගියා. නමුත් එතුමිය නිර්මානශීලියි. එතුමියගෙ නිර්මාණශීලීකමේ මූලිකයා තමයි උපාලි අමරසිරි මැතිතුමා. එතුමා හොඳ දක්ෂ හොඳ නිර්මාණ ශීලී උපදෙස් දෙන උපදේශකයෙක්. ඒ උපදේශ අරගෙන එතුමිය මේ සභාව ඇත්තටම මෙහෙයව ගත්තා. එතුමියගෙ ඉල්ලීම් අපිට සමහර විට ඉටු කරන්න බැරි වෙන්න ඇති. නමුත් එතුමියගෙ අර ඉල්ලීම් ටිකත් මම ඔබතුමිය වෙනුවෙන් ඉදිරියෙදි ඉටු කරන්නම්. ඒ වගේම උප සභාපතිතුමත්, අනිත් මන්ත්‍රීවරුත් කිව්ව

වගේ මේ ඉල්ලා අස්වීම ඔබතුමියගෙ පක්ෂයේ කටයුත්තක් නිසා වෙන්න ඇති. නමුත් මම හිතන විදිහට මේක යැව්වට අපට පක්ෂයෙන් ලියුම එනකම් මොනවත් කරන්න බැරි වේවි. ඒ නිසා ඔබතුමිය ඒ ඉල්ලා අස්වීම පිළිබඳව එච්චර හිතන්න ඕන නැහැ. ඕනනම් මේක සභාගත නොකර ඉන්නම්. ඇත්තටම කාන්තා පාර්ශවය වෙනුවෙන් අලුත් ක්‍රමවේදයක් තුල නාගොඩ ප්‍රාදේශීය සභාවට පත් වූ කාන්තාවන් හත් දෙනාගෙන් කෙනෙක් හැටියට මේ ප්‍රාදේශීය සභාවෙ අරුණ ශාන්ති බෝදරගම යන නම ඉතිහාස ගත වෙනවා. ඒ වගේම ඔබතුමිය මේ අවුරුදු දෙක තුල කරන ලද සමාජ මෙහෙවර පිළිබඳව සභාපති හැටියටත් ගරු මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ල සියලුම දෙනා වෙනුවෙන් ඔබතුමියට මම ගෞරවය පුද කරනවා. ඔබතුමිය නෙවෙයි දේශපාලනයට එන්න තිබුනෙ ඔබතුමියගෙ මිය ගිය මල්ලි. එතුමා හිටියනම් සමහර විට මගේ ලේකම් වෙන්න තිබුනා. මම 2002 ඡන්දෙ ඉල්ලද්දි එතුමා තමයි අපිට බොහොම හිතවත්ව උදව් කලේ. ඇත්තටම එයා තමයි සමාජ සේවකයා. ඒක නිසා මම මතක් කළේ එයාටත් ගරුත්වයක් හැටියට.

කොහොම නමුත් දේශපාලනයෙදි ඔබ ගත්ත තීරණ තීන්දු බොහොම යහපත්. ඒ වගේම ඉදිරියෙදි සමාජ සේවාවන් කරන්න ඔබට ධෛර්යය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, විශේෂයෙන්ම නාගොඩ ප්‍රාදේශීය සභාවෙ උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ලා ඒ සියලු දෙනා අදත් මේ වසංගතය හමුවේ, සෞඛ්‍ය අංශවල උපදෙස් අනුව මේ සභාව කරගෙනයාමට සහය දක්වලා පැමිණීම පිළිබඳ ගරුත්වය පුද කරමින් අද සභාවෙ කටයුතු මෙතෙකින් නිම කරනවා. සියලු දෙනාටම සුභ අනාගතයක් බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- ..............................